වාර්ෂික වාර්තාව 2022



ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව

2022



ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

දැක්ම, මෙහෙවර, අරමුණු සහ ඉලක්ක



උසස් අධ්‍යාපනයේ හා පර්යේෂණ කිරීමේ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත් වීම.



පුළුල් පරාසයක විභිදුණු අධ්‍යාපන වැඩසටහන්, පර්යේෂණ හා පුහුණු මඟින් නිපුණතාවයන් වර්ධනය කොට ගෝලීය සංවර්ධනයේ සංදර්භය තුල අභියෝග ජය ගැනීමට සමත් වූ නව්‍ය බුද්ධිමතුන් බිහිකිරීම.

ඉලක්ක

ඉලක්ක 1	ජාතික හා ජාත්‍යන්තර මානව සම්පත් ඉල්ලුම සපුරාලීම සඳහා උසස් තත්වයේ නව්‍ය බුද්ධිමතුන් බිහිකිරීම.
ඉලක්ක 2	උපාධිධාරී සේවා නියුක්තිය වැඩි කිරීම හා ව්‍යවසායකත්වය සවිබල ගැන්වීම.
ඉලක්ක 3	ගෝලීය අනුකූලතාවය, ගෝලීය සබඳතා, ගෝලීය හුවමාරු සහ ගෝලීය හවුල්කාරිත්වයන් තිරසාරීව වැඩිදියුණු කිරීම.
ඉලක්ක 4	සම්පත් භාවිතයේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය මඟින් නිෂ්පාදනය වැඩි කිරීම.
ඉලක්ක 5	නිදහස, තරඟකාරීත්වය සහ සුවිශේෂත්වය සමඟ විශ්වවිද්‍යාලය සවිබල ගැන්වීම.
ඉලක්ක 6	අන්‍යෝන්‍ය ගෞරවය හා සදාචාරාත්මක හැසිරීම සමඟ සහජීවනය ප්‍රවර්ධනය කිරීම.



ඓතිහාසික උරුමයන් තුල පිහිටි අධ්‍යාපන ආයතනයක් ලෙස, දැනුම වැඩිදියුණු කිරීමෙන් සහ ඥානය පැතිරවීමෙන් සියළු දෙනාටම වඩාත් හොඳ අනාගතයක් ගොඩ නැඟීම මඟින් සමාජය වැඩිදියුණු කිරීම අරමුණු කොට ක්‍රියා කරන්නෙමු. ජීවිතය සඳහා ඉගෙනීම, විශිෂ්ටත්වය, ගෞරවය, අඛණ්ඩතාව, විවිධත්වය, අවංකබව, නව්‍යකරණය හා ගුණාත්මක බුද්ධිමතුන් යන සාරධර්ම සඳහා අපි කැපවී සිටිමු.

ජීවිතය සඳහා ඉගෙනීම+ විශිෂ්ටත්වය + ගෞරවය + අඛණ්ඩත්වය + විවිධත්වය + අවංකභාවය + නවෝත්පාදනය + ගුණාත්මක බුද්ධිමතුන්

උපකුලපති පණිවිඩය



ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2022 වසර සඳහා වන වාර්ෂික වාර්තාව සඳහා පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳව සතුටට පත්වෙමි. 1996 වසරේ ආරම්භ කරන ලද ශ්‍රී ලංකා රජරට විශ්වවිදාලයේ 2022 වසර වන විට 28 වසරක් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැදී සිටී විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම, ව්‍යවහාරික විද්‍යා, කළමනාකරණ අධ්‍යයන, වෛද්‍ය හා සමාන්තර විද්‍යා, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර හා තාක්ෂණ, යන පීඨ 06 මඟින් 9000 ඉක්ම වූ උපාධි අපේක්ෂකයින් සඳහා උපාධි පාඨමාලා පිරිනමනු ලබයි. 2022 වර්ෂයේ දී සියළුම පීඨ (6) සඳහා නවක සිසුන් 2133 දෙනෙකු බඳවා ගත් අතර රජරට විශ්වවිද්‍යාල ඉතිහාසයේ පළමු වරට උපාධි ප්‍රදානෝත්සව දෙකක් පවත් වන ලදි. එහිදී ප්‍රථම උපාධි 2698ක්, පශ්චාත් උපාධි 270ක් හා ඩිප්ලෝමා ප්‍රදානය කිරීම සිදුවුනි.

විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය බාහිර උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා ප්‍රදානය කිරීම මඟින් ආදායම් උපයන අතර එය ඉදිරියේ දී ඇතිවිය හැකි මුල්‍ය දුෂ්කරතා මගහරවා ගැනීමට මහත් රුකුලක් වනු ඇත.

තාක්ෂණ පීඨය හැර විශ්වවිද්‍යාලයේ අනෙකුත් සියළුම පීඨ විසින් පශ්චාත් උපාධි ප්‍රදානය කරනු ලබන අතර අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ව්‍යාපාර පරිපාලනපති, පාඨමාලාව, කෘෂිකර්ම ශාස්ත්‍රපති උපාධිය යන පශ්චාත් උපාධි පාඨමාලා සඳහා කැපී පෙනෙන ජාතික හා ජාත්‍යන්තර ඉල්ලුමක් පිළිගැනීමක් පවතී. කළමනාකරණ අධ්‍යන පීඨය මඟින් ප්‍රදානය කරනු ලබන දර්ශනපති උපාධි පාඨමාලාව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමැතිය සහිතව 2022 වසරේ ආරම්භ කරන ලදි.

මෑත කාලීනව ලෝකය මුහුණ දුන් කොවිඩ් 19 වසංගතය වැනි අර්බුද සමනය කිරීමට විශ්වවිද්‍යාලය පර්යේෂණ හා නව සොයාගැනීම් මඟින් ක්‍රියාකාරීව දායක විය.

පර්යේෂණ හා ප්‍රකාශන 2022 වසරේදී කැපීපෙනෙන ලෙස වර්ධනය වූ අතර විවිධ විෂයයන් යටතේ පර්යේෂණ පත්‍රිකා හා සාරාංශ (abstracts) ජාතික හා ජාත්‍යන්තර ජර්නල වල පළවිය. පීඨ විසින් උපයන ලද අරමුදල් උපයෝගි කරගනිමින් ජාත්‍යන්තර සමුළු හා සම්මන්ත්‍රණ වලට සහභාගි වීමද කැපී පෙනෙන ලෙස වර්ධනය විය. Webometrics වර්ගී කරණය යටතේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතරින් හයවන ස්ථානය හිමිකරගැනීමට විෂය බාහිර ක්‍රියාකාරකම් මහත් රුකුලක් වී ඇති අතර Scimago වර්ගීකරණය යටතේ විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රතිශතය මත ප්‍රථම ස්ථානයත් සමස්ත පර්යේෂණ කාර්යසාධනය මත දෙවන ස්ථානයත් හිමිකරගෙන ඇත.

සිසුන් සඳහා වන ආධාරක වැඩසටහන් වශයෙන් වෘත්තීය මාර්ගෝපදේශන, ක්‍රීඩා, ආයතනික පුහුණුව හා සංස්කෘතික වැඩසටහන් සඳහාද වාර්ෂික ප්‍රතිපාදන යටතේ අවස්ථා සලසා දෙන ලදි. තවද එම ප්‍රතිපාදන යටතේ සියළුම සේවක කාණ්ඩ සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් සාර්ථක ලෙස පවත්වන්නට යෙදුනි. සියළුම පීඨ විසින් ප්‍රජා ව්‍යාප්ති වැඩසටහන් ද දියත් කෙරුණි.

විශ්වවිද්‍යාලය හා කර්මාන්ත අතර සහයෝගිතා ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කිරීම, විෂයමාලා සංශෝධන, පර්යේෂණ වැඩිදියුණු කිරීම, කාර්යමණ්ඩල ධාරිතා වඩා වර්ධනය කිරීම, විශ්වවිද්‍යාලයේ ප්‍රජා ව්‍යාපෘති වර්ධනය කිරීම, විදේශ විශ්වවිද්‍යාල සමඟ සහයෝගීතාවය වර්ධනය කරගැනීම මඟින් සිසුන් හා කාර්යමණ්ඩල හුවමාරුව, යටිතල පහසුකම් වර්ධනය කිරීම හා සිසුන් අතර ව්‍යවසායකත්වය වර්ධනය කිරීම මාගේ අනාගත සැලසුම් වලට අයත් වේ. සියළුම බාධක මධ්‍යයේ 2022 වසර ඵලදායි වසරක් කරගැනීමට දායක වූ පාලක සභාවට, සනාතන සභාවට, ලේඛකාධිකාරිට, මූල්‍යාධිකාරිට හා කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින්ට මාගේ කෘතඥතාවය පළ කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි.

මහාචාර්ය ජී.ඒ.එස්. ගිනිගද්දර මිය

උපකුලපති

.

පටුන

01. හැඳින්වීම

1.1	හිටපු උපකුලපතිවරු	1
1.2	විශ්වවිද්‍යාල පාලක සභාව	2
1.3	සනාතන සභාව	2
1.4	පරිපාලන කාර්ය මණ්ඩලය	4
1.5	ආයතනික ව්‍යුහය	6

02. කාර්යසාධන සාරාංශය

2.1	නවක සිසුන් බඳවාගැනීමේ සාරාංශය (වි.වි.ප්‍ර.කොා.ස.)	7
2.2	අවසන් වසර හතර තුල උපාධිලාභීන් සංඛ්‍යාව	7
2.3	අවසන් වසර හතර තුල පීඨයන් හී අධ්‍යයන කාර්ය මණ්ඩල සාරාංශය	7
2.4	අවසන් වසර හතර තුල අධ්‍යයන කාර්ය මණ්ඩලය	8
2.5	විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම	8
2.6	නේවාසිකාගාර පහසුකම්	8

03. ශිෂ්‍ය තොරතුරු සහ මානව සම්පත් 8
04. දේශීය උපාධි අපේක්ෂකයින්ගේ තොරතුරු 9
05. කාර්ය මණ්ඩල තොරතුරු 10
06. පර්යේෂණ නව සොයා ගැනීම් හා ප්‍රකාශන 11
07. ලැබූ ප්‍රධානයන් 12
08. පාඨමාලා පිළිබඳ විස්තර

08.1	අභ්‍යන්තර පාඨමාලා	14
08.2	වෙනත් පාඨමාලා	15

09. පුනරාවර්තන වියදම් 16
10. ප්‍රාග්ධන වියදම් 16
11. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල්) 16
12. ව්‍යාපෘති පිළිබඳ වියදම් (දේශීය විදේශීය අරමුදල්) 17
13. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) 18
14. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ආදායම් උත්පාදනය) 18
15. මූල්‍ය ප්‍රගතිය විශ්ලේෂණාත්මකව - 2022 19
16. යටිතල පහසුකම් පිළිබඳ විස්තර 19

පීඨ, පුස්තකාල ජාලය, අධ්‍යයන සහයක අංශ, මධ්‍යස්ථාන හා ඒකකයන් හි වාර්තාවන්

17. කෘෂිකර්ම පීඨය 23
18. ව්‍යවහාරික විද්‍යා පීඨය 26
19. කළමනාකරණ අධ්‍යයන පීඨය 29
20. වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය 32
21. සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය 34
22. තාක්ෂණ පීඨය 38
23. පුස්තකාල පද්ධතිය 42
24. ශාරීරික අධ්‍යාපන අධ්‍යනාංශය 47
25. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 48
26. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යන මධ්‍යස්ථානය 52

27.	කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය	55
28.	තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය	57
29.	තත්ත්වය සහතික කිරීමේ මධ්‍යස්ථානය	59
30	විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය	61
31.	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ III වන කොටසේ 17(ඈ) වගන්තිය යටතේ සඳහන් කර ඇති තිරසාර සංවර්ධන මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව	65
32.	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106(1) සහ 107 (ආ) වගන්ති ප්‍රකාරව සහ 1971 අංක 38 දරන මුල්‍ය පනත හා එහි සංශෝධන ප්‍රකාරව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2022 වර්ෂය සඳහා වන මුල්‍ය ප්‍රකාශනය	69
33	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (7) වගන්තිය ප්‍රකාර 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව	105
34.	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්ති ප්‍රකාර 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව සම්බන්ධව විශ්වවිද්‍යාලයේ නීරීක්ෂණ හා ක්‍රියාමාර්ග	117

1. හැඳින්වීම

1978 විශ්වවිද්‍යාල පනතේ අංක 16 විධිවිධාන යටතේ එවකට අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු රිචඩ් පතිරන මහතා විසින් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය 1995 නොවැම්බර් මස 07 වන දින ස්ථාපනය කරන ලද අතර එවකට අතිගරු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ ප්‍රධානත්වයෙන් 1996 ජනවාරි 31වන දින චාරිත්‍රානුකූලව සමාරම්භක උත්සවය පවත්වන ලදි. සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර, කළමනාකරණ අධ්‍යයන, කෘෂිකර්ම හා ව්‍යවහාරික විද්‍යා යන ක්ෂේත්‍රයන්හි උසස් අධ්‍යාපන අවස්ථා සැලසීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම ආරම්භක අභිලාශය වුවද පසුව වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයද එක්විය.

1995 දී එවකට ගරු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් පත් කරන ලද කමිටුවේ නිර්දේශ වලට අනුව මධ්‍යම, වයඹ හා උතුරුමැද පළාත් අනුබද්ධිත විශ්වවිද්‍යාල ඒකාබද්ධ කොට එහි අනුප්‍රාප්තිකයා ලෙස ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය ස්ථාපනය කරන ලදි.

මිහින්තලේ පුණ්‍ය භූමි මත වූ පන්සල පෙනෙන මානයේ ඇති මනරම් පරිසරයක ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිපාලන පරිශ්‍රය පිහිටා තිබේ. බෞද්ධ ශිෂ්ඨාචාරය හඳුන්වා දුන් මධ්‍යස්ථානය ලෙස මෙම භූමියට ඓතිහාසික වැදගත්කමක් හිමිවේ. එමෙන්ම ලෝක ප්‍රසිද්ධ ශිෂ්ඨාචාරයක් වන පෞරාණික අනුරාධපුර රාජධානියට කිලෝමීටර් 10 ක් පමණ එපිටින් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය පිහිටා ඇත. වර්තමානයේ විශ්වවිද්‍යාලයේ පීඨ 06 කින් සමන්විත වන අතර සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර, කළමනාකරණ අධ්‍යයන, තාක්ෂණ සහ ව්‍යවහාරික විද්‍යා යන පීඨයන් මිහින්තලේ පරිශ්‍රයේ පිහිටා ඇති අතර කෘෂිකර්ම පීඨය හා වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය පිළිවලින් පුලියන්කුලම හා සාලියපුර පිහිටා ඇත.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පවතින සම්පත් ප්‍රමාණය භාවිතයෙන් උතුරු මැද පළාතේ සහ සමස්ථ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සැපයීමේ උපාය මාර්ගය අත්පත් කොට ගෙන තිබේ.

1.1 හිටපු උපකුලපතිවරු

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිවරුන් විසින් පත් කරන ලද ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය උපකුලපති වරුන්ගේ ලැයිස්තුව.



1996 - 2002
මහාචාර්ය ඩබ්. අයි. සිරිවීර



2002 - 2004
මහාචාර්ය කේ. විජේරත්න



2005 - 2006
මහාචාර්ය පී. සමරනායක



2019 - 2021
මහාචාර්ය බී. ඒ. කරුණාරත්න



2013 - 2018
මහාචාර්ය කේ. එච්. ආර්. විජයවර්ධන



2006 - 2012
මහාචාර්ය කේ. ඒ. නන්දසේන

1.2 විශ්වවිද්‍යාල පාලක සභාව

මහාචාර්ය ජී. ඒ. එස්. ගිනිගද්දර	උපකුලපති (සභාපතිනිය)
ආචාර්ය ජී. වී. ටී. වී. වීරසුරිය	පීඨාධිපති කෘෂිකර්ම පීඨය
මහාචාර්ය ඊ. එම්. කේ. ආර්. බී. එදිරිසිංහ	ව්‍යවහාරික විද්‍යා පීඨය
මහාචාර්ය පී. එම්. බී. ජයතිලක	පීඨාධිපති කළමනාකරණ අධ්‍යයන පීඨය
වෛද්‍ය පී. එච්. ජී. ජේ. පුෂ්පකුමාර	පීඨාධිපති වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය
මහාචාර්ය ඩී. ටී. මෙන්ඩිස්	පීඨාධිපති සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
ආචාර්ය ටී. සී. බමුණුආරච්චිගේ	පීඨාධිපති තාක්ෂණ විද්‍යා පීඨය
මහාචාර්ය එන්. කේ. ඒ. සිල්වා	සනාතන සභාවෙන් නම් කරන ලද
ආචාර්ය ඒ. එම්. කේ. ආර්. බණ්ඩාර	සනාතන සභාවෙන් නම් කරන ලද
පූජ්‍ය නුගතැන්නේ පඤ්ඤානන්ද ස්ථවිර	වි.වි.ප්‍ර.කොා.ස. මගින් නම් කරන ලද
මහින්ද සෙනෙවිරත්න මහතා	වි.වි.ප්‍ර.කොා.ස. මගින් නම් කරන ලද
මහාචාර්ය ඩබ්. ඩබ්. ඩී. ඒ. ගුණවර්ධන	වි.වි.ප්‍ර.කොා.ස. මගින් නම් කරන ලද
එ. ජී. කරුණාරත්න මහතා	වි.වි.ප්‍ර.කොා.ස. මගින් නම් කරන ලද
පාලිත නානායක්කාර මහතා	වි.වි.ප්‍ර.කොා.ස. මගින් නම් කරන ලද
ආර්. එම්. වන්නිනායක මහතා	වි.වි.ප්‍ර.කොා.ස. මගින් නම් කරන ලද
එස්. පී. කේ. ගුණරත්න මහතා	වි.වි.ප්‍ර.කොා.ස. මගින් නම් කරන ලද
රවීන්ද්‍ර ගීත් ජයසේන මහතා	වි.වි.ප්‍ර.කොා.ස. මගින් නම් කරන ලද
එච්. එම්. කේ. හේරත් මහතා	වි.වි.ප්‍ර.කොා.ස. මගින් නම් කරන ලද
එස්. එස්. කේ. මොහොට්ටි මහතා	වි.වි.ප්‍ර.කොා.ස. මගින් නම් කරන ලද
ඒ. එම්. ජී. බී. අබේසිංහ මහතා	ලේඛකාධිකාරි

1.3 සනාතන සභාව

මහාාචාර්ය ජී. ඒ. එස්. ගිනිගද්දර	උපකුලපති (සභාපතිනිය)
ආචාර්ය ජී. වී. ටී. වී. වීරසුරිය	පීඨාධිපති කෘෂිකර්ම පීඨය
මහාචාර්ය ඊ. එම්. ආර්. කේ. බී. එදිරිසිංහ	ව්‍යවහාරික විද්‍යා පීඨය
මහාචාර්ය පී. එම්. බී. ජයතිලක	පීඨාධිපති කළමනාකරණ අධ්‍යයන පීඨය
වෛද්‍ය පී. එච්. ජී. ජේ. පුෂ්පකුමාර	පීඨාධිපති වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය
මහාචාර්ය ඩී. ටී. මෙන්ඩිස්	පීඨාධිපති සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
ආචාර්ය ටී. සී. බමුණුආරච්චිගේ	පීඨාධිපති තාක්ෂණ විද්‍යා පීඨය
ඒ. එස්. සිරිවර්ධන මහත්මිය	පුස්තකාලයාධිකාරි

කෘෂිකර්ම පීඨය

ආචාර්ය යූ. ජී. ඒ. අයි. සිරිසේන	අංශ ප්‍රධාන ශාක විද්‍යා අධ්‍යනාංශය
මහාචාර්ය එන්. එස්. අබේසිංහ	අංශ ප්‍රධාන පාංශු හා ජල සම්පත් කළමනාකරණ අධ්‍යනාංශය
ආචාර්ය ඒ. එම්. කේ. ආර්. බංඩාර	අංශ ප්‍රධාන කෘෂිකර්ම පද්ධති අධ්‍යනාංශය
ආචාර්ය එන්. ඩබ්. අයි. ඒ. ජයවර්ධන	අංශ ප්‍රධාන සත්ත්ව හා ආහාර විද්‍යා අධ්‍යනාංශය

ව්‍යවහාරික විද්‍යා පීඨය

ආචාර්ය එච්. ඕ. විජේවර්ධන	අංශ ප්‍රධාන භෞතික විද්‍යා අධ්‍යනාංශය
ආචාර්ය ඩබ්. එම්. එස්. ප්‍රනාන්දු	අංශ ප්‍රධාන සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය
එන්. එස්. වීරකෝන් මහතා	අංශ ප්‍රධාන පරිගණක අධ්‍යනාංශය
මහාචාර්ය එච්. එම්. ඒ. එම්. සී. හේරත්	අංශ ප්‍රධාන රසායනික විද්‍යා අධ්‍යනාංශය
මාහාචාර්ය සනත් හෙට්ටිආරච්චි	අංශ ප්‍රධාන ජීව විද්‍යා අධ්‍යනාංශය

කළමනාකරණ අධ්‍යයන පීඨය

ආචාර්ය. ආර්. එම්. සී. ස්වර්ණපාලි	අංශ ප්‍රධාන ගිණුම්කරණ හා මූල්‍ය අධ්‍යනාංශය
ආචාර්ය ඩබ්. එම්. ආර්. බී. වීරසුරිය	අංශ ප්‍රධාන ව්‍යාපාර කළමනාකරණ අධ්‍යනාංශය
කේ. ටී. එන්. පී. අබේවික්‍රම	අංශ ප්‍රධාන සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණ අධ්‍යනාංශය
ආචාර්ය එච්. එම්. පී. බී. රණවීර	අංශ ප්‍රධාන, අලෙවි කළමනාකරණ අධ්‍යනාංශය
ආචාර්ය යූ. ඩබ්. එම්. ආර්. එස්. එස්. සී. බී. කප්පාගොඩ	අංශ ප්‍රධාන, මානව සම්පත් කළමනාකරණ අධ්‍යනාංශය

පී. පී. මුණසිංහ මහතා	අංශ ප්‍රධාන තොරතුරු සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය

වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය

වෛද්‍ය එස්. එම්. ඒ. ජයවර්ධන	අංශ ප්‍රධාන, කායච්ඡේදන අධ්‍යනාංශය
වෛද්‍ය ඒ. එම්. එම්. වී. කුමාරි	අංශ ප්‍රධාන, භෞතවේදීය අධ්‍යනාංශය
වෛද්‍ය එච්. ටී. ඩබ්. වීරකෝන්	අංශ ප්‍රධාන, ජෛවරසායන අධ්‍යනාංශය
මහාචාර්ය කේ. පී. ඒ. ඩී. වීරකෝන්	අංශ ප්‍රධාන, පරපෝෂ විද්‍යා අධ්‍යනාංශය
වෛද්‍ය එන්. සී. සරත්චන්ද්‍ර	අංශ ප්‍රධාන, වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය
වෛද්‍ය ජේ. ඒ. ඒ. එස්. ජයවීර	අංශ ප්‍රධාන, ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යනාංශය
වෛද්‍ය එස්. ශ්‍රීෂංකර්	අංශ ප්‍රධාන, ශල්‍ය වෛද්‍ය අධ්‍යනාංශය
වෛද්‍ය වයි. පී. ජේ. එන්. වර්නසේකර	අංශ ප්‍රධාන, ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය
වෛද්‍ය ඩී. එම්. ඒ. කුමාර	අංශ ප්‍රධාන, ප්‍රසව හා නාරීවේද අධ්‍යනාංශය
වෛද්‍ය ඒ. බී. සෙනෙවිරත්න	අංශ ප්‍රධාන, අධිකරන වෛද්‍ය අධ්‍යනාංශය
වෛද්‍ය ටී. පී. කේ. කලුආරච්චි	අංශ ප්‍රධාන, භිෂග්වේද අධ්‍යනාංශය
වෛද්‍ය එම්. එස්. වී. මෙන්ඩිස්	අංශ ප්‍රධාන, ව්‍යාධිවේදී අධ්‍යනාංශය
වෛද්‍ය එල්. එල්. අමිල ඉසුරු	අංශ ප්‍රධාන, මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය
වෛද්‍ය ඩී. රතීෂ්	අංශ ප්‍රධාන, පවුල් සෞඛ්‍ය අධ්‍යනාංශය
වෛද්‍ය ඩබ්. ඒ. ජේ. සී. චන්ද්‍රකුමාර	අංශ ප්‍රධාන, ළමාරෝග අධ්‍යනාංශය

සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය

මහාචාර්ය ඊ. එම්. එස්. ඒකනායක	අංශ ප්‍රධාන, සමාජවිද්‍යා අධ්‍යනාංශය
මහාචාර්ය පී. බී. එන්. අබේවර්ධන	අංශ ප්‍රධාන, පුරාවිද්‍යා හා උරුමයන් කළමනාකරණ අධ්‍යනාංශය
මහාචාර්ය ආර්. එම්. මහින්ද	අංශ ප්‍රධාන, පරිසර කළමනාකරණ අධ්‍යනාංශය
ආචාර්ය (පූජ්‍ය) ඕ චන්ද්‍රසිරි ස්ථවීර	අංශ ප්‍රධාන, භාෂා අධ්‍යනාංශය
ඩී. ඒ. වේහැල්ල මහතා	අංශ ප්‍රධාන, ඉංග්‍රීසි භාෂා අධ්‍යනාංශය
මහාචාර්ය ආර්. පී. අයි. ආර්. ප්‍රසන්න	අංශ ප්‍රධාන, ආර්ථික විද්‍යා අධ්‍යනාංශය
මහාචාර්ය එම්. කේ. එල්. අයිරාංගනී	අංශ ප්‍රධාන, මානවශාස්ත්‍ර අධ්‍යනාංශය
එල්. එන්. ඒ. බී. එම්. නිශ්ශංක මහත්මිය	ප්‍රධාන දේශක, තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශය

තාක්ෂණ පීඨය

ආචාර්ය ආර්. එම්. ඒ. අයි. රත්නායක	අංශ ප්‍රධාන, ජෛව තාක්ෂණ අධ්‍යනාංශය
ආචාර්ය ආර්. කේ. අහිංසා	අංශ ප්‍රධාන, ආහාර තාක්ෂණ අධ්‍යනාංශය
එච්. එම්. එච්. ටී. හික්කඩුව මහතා	අංශ ප්‍රධාන, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය
ආචාර්ය එච්. ඒ. එන්. ධර්මගුණවර්ධන	අංශ ප්‍රධාන, ද්‍රව්‍ය තාක්ෂණ අධ්‍යනාංශය
ආචාර්ය පී. කුමාරගේ	අංශ ප්‍රධාන, විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික් තාක්ෂණ අධ්‍යනාංශය

මාහාචාර්ය වරුන්

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී. ඒ. විරසිංහ	කෘෂිකර්ම පීඨය
මහාචාර්ය එම්. එච්. ජේ. පී. ගුණරත්න	කෘෂිකර්ම පීඨය
මහාචාර්ය ඒ. එම්. ජේ. බී අධිකාරි	කෘෂිකර්ම පීඨය
මහාචාර්ය එස්. සී. සෝමසිරි	කෘෂිකර්ම පීඨය
මහාචාර්ය එම්. ජී. ටී. එස්. අමරසේකර	කෘෂිකර්ම පීඨය
මහාචාර්ය එම්. කේ. එන්. කුමාරි	කෘෂිකර්ම පීඨය
මහාචාර්ය ඩබ්. ඒ. ඩී. නයනාන්ජලී	කෘෂිකර්හ පීඨය
මහාචාර්ය ඩබ්. එම්. ශ්‍රියානි	ව්‍යවහාරික විද්‍යා පීඨය
මහාචාර්ය ටී. වී. සුන්දරබාරති	ව්‍යවහාරික විද්‍යා පීඨය
මහාචාර්ය පී. පී. එන් දුමින්ද	ව්‍යවහාරික විද්‍යා පීඨය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ. එච්. ආර්. විජේවර්ධන	කළමනාකරණ අධ්‍යයන පීඨය
මහාචාර්ය කේ. පී. ඒ. උදයකුමාර	කළමනාකරණ අධ්‍යයන පීඨය

මහාචාර්ය ඩබ්. පී. විජේවර්ධන	කළමනාකරණ අධ්‍යයන පීඨය
මහාචාර්ය එස්. බී. අගම්පොඩි	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය
මහාචාර්ය එන්. කේ. ඒ. සිල්වා	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. එච්. සිරිබද්ධන	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය
මහාචාර්ය ටී. සී. අගම්පොඩි	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. ලගමුව	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
මහාචාර්ය සේන නානායක්කාර	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
මහාචාර්ය සී. ආර්. විතානාච්චි	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
මහාචාර්ය ඩි. එම්. ඩබ්. කේ. දිසානායක	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
මහාචාර්ය බී. එම්. එස්. බන්ඩාර	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
මහාචාර්ය එස්. ඩබ්. පී. කේ. බුලන්කුලම	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
මහාචාර්ය ටී. පී. ඒ. තල්වත්ත	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
මහාචාර්ය එස්. කේ. එන්. ගමගේ	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
මහාචාර්ය ඩී. එස්. ඩබ්. ගුණවර්ධන	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
මහාචාර්ය කේ. පී. පී. බී. ජයතිලක	තාක්ෂණ පීඨය

පීඨ මඟින් නම් කරන ලද සමාජිකයින්


ආචාර්ය ආර්. එච්. පී. ආර්. වත්සලා	කෘෂිකර්ම පීඨය
ආචාර්ය ඒ. ජේ. ෆනෑන්ඩෝ	කෘෂිකර්ම පීඨය
ඊ. එම්. යූ. එස්. බී. ඒකනායක මහතා	ව්‍යවහාරික විද්‍යා පීඨය
පී. එස්. පල්ලියගුරුගේ මහතා	ව්‍යවහාරික විද්‍යා පීඨය
ආචාර්ය සී. එම්. වයි. එස්. එස්. බන්ඩාර	කළමනාකරණ අධ්‍යයන පීඨය
ආචාර්ය ජේ. එස්. කුමාරි	කළමනාකරණ අධ්‍යයන පීඨය
වෛද්‍ය එච්. බී. ඩී. ජීවන්ත	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය
වෛද්‍ය ජී. එච්. අයි. දර්ශිකා	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය
ආචාර්ය එස්. ඒ. යූ. නිරන්ජලා	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
ඒ. එම්. එස්. අධිකාරි මහත්මිය	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
ආචාර්ය ඩී. පෙරේරා	තාක්ෂණ පීඨය

1.4 පරිපාලන කාර්ය මණ්ඩලය

ඒ. එම්. ජී. බී. අබේසිංහ මහතා	ලේඛකාධිකාරි
එස්. එච්. උවයිසුල්කර්නි මහතා	නියෝජ්‍ය ලේඛකාධිකාරි
ඊ. ඩබ්. එම්. එස්. යූ. විජේසිංහ මහතා	අධ්‍යක්ෂ ශාරීරික අධ්‍යාපන අංශය
එස්. එස්. කේ. ගොඩකුඹුර මහතා	නියෝජ්‍ය මූල්‍යාධිකාරි
එස්. ඒ. අයි. සෝමරත්න මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
එම්. ජී. එල්. මාවීකුඹුර මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි
එම්. එම්. එස්. සංජීව මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
ඩී. එම්. සී. යූ. කේ. දිසානායක මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි (ප්‍රුස්තකාලසේවා)
ඩබ්. බී. දිසානායක මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
එච්. පී. ගුණවර්ධන මහත්මිය	සහකාර ලේඛකාධිකාරි
ඩී. එම්. ආර්. සමන්ත මහතා	සහකාර ලේඛකාධිකාරි
එම්. ඒ. එන්. එන්. කුමාරි මහත්මිය	උපකුලපතිගේ පෞද්ගලික ලේකම්
කේ. එස්. කේ. හේරත් මහත්මිය	සහකාර ලේඛකාධිකාරි
ජේ. එම්. එස්. කේ. ජයලත් මහතා	සහකාර මූල්‍යාධිකාරි
බී. ඩබ්. එන්. ජේ. සමරවිර මහතා	ගොවිපල කළමනාකරු
ආර්. එම්. එස්. රත්නායක මහත්මිය	සහකාර මූල්‍යාධිකාරි
පී. ජේ. සෙනෙවිරත්න මහත්මිය	සහකාර ලේඛකාධිකාරි

ආර්. එම්. පී. ඩී. රත්නායක මහත්මිය	සහකාර ලේඛකාධිකාරී (නීති හා ප්‍රලේඛන)
සී. ඩී. ප්‍රනාන්දු මහත්මිය	සහකාර අභ්‍යන්තර විගණක
අයි. කේ. දොඩන්වල මෙනවිය	සහකාර මුල්‍යාධිකාරී
වී. කෘෂ්නානන්දි මෙනවිය	සහකාර ලේඛකාධිකාරී
වී. එන්. ප්‍රසන්ෂනී මෙනවිය	සහකාර මුල්‍යාධිකාරී
කේ. එච්. ඩබ්. කේ. ජී. කහවල මහත්මිය	සහකාර ලේඛකාධිකාරී
කේ.නතීපරන් මහත්මිය	සහකාර ලේඛකාධිකාරී
ටී. එම්. එම්. පී බන්ඩාර මහතා	උද්‍යාන පාලක (උද්‍යාන අංශය)
එම්. එන්. ෆාතිමා නිහ්මා මෙනවිය	සහකාර ලේඛකාධිකාරී
ටී ලක්ෂනා මෙනවිය	සහකාර ලේඛකාධිකාරී
එම්. ජී. එන්. මානවඩු මහතා	වැඩ ඉංජිනේරු (සිවිල්)
ඒ. එම්. ටී. කේ. චන්ද්‍රසේකර	ප්‍රධාන ආරක්ෂක නිලධාරී

1.5 ආයතනික ව්‍යුහය



02. කාර්යසාධන සාරාංශය

2.1 නවක සිසුන් බඳවාගැනීමේ සාරාංශය (වි.වි.ප්‍ර.කොා.ස.)

පීඨය	2017/2018	2018/2019	2019/2020	2020/2021
කෘෂිකර්ම පීඨය	134	156	142	159
ව්‍යවහාරික විද්‍යා පීඨය	262	390	456	443
කළමනාකරණ අධ්‍යයන පීඨය	463	471	514	513
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	179	181	209	202
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	490	439	549	487
තාක්ෂණ පීඨය	275	275	352	347
එකතුව	**1803**	**1912**	**2222**	**2151**

2.2 අවසන් වසර හතර තුල උපාධිලාභීන් සංඛ්‍යාව

පීඨය	19 වන උපාධි ප්‍රධානෝත්සවය - 2019	20 වන උපාධි ප්‍රධානෝත්සවය - 2021	21 වන උපාධි ප්‍රධානෝත්සවය - 2022	22 වන උපාධි ප්‍රධානෝත්සවය - 2022
කෘෂිකර්ම පීඨය	88	84	130	115
ව්‍යවහාරික විද්‍යා පීඨය	59	147	145	291
කළමනාකරණ අධ්‍යයන පීඨය	303	310	395	361
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	179	187	182	176
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	311	335	204	475
තාක්ෂණ පීඨය	-	-	-	224
එකතුව	**940**	**1063**	**1056**	**1642**

2.3 අවසන් වසර හතර තුල පීඨයන්හි අධ්‍යයන කාර්ය මණ්ඩල සාරාංශය

පීඨය	2019	2020	2021	2022
කෘෂිකර්ම පීඨය	43	45	47	45
ව්‍යවහාරික විද්‍යා පීඨය	44	45	45	43
කළමනාකරණ අධ්‍යයන පීඨය	47	47	47	52
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	54	55	54	55
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	55	55	58	58
තාක්ෂණ පීඨය	21	29	36	33
පුස්තකාල පද්ධතිය	7	6	7	6
එකතුව	**271**	**282**	**294**	**292**

2.4 අවසන් වසර හතර තුල අනධ්‍යයන කාර්ය මණ්ඩලය

පීඨය	2019	2020	2021	2022
කෘෂිකර්ම පීඨය	43	43	43	44
ව්‍යවහාරික විද්‍යා පීඨය	32	32	31	32
කළමනාකරණ අධ්‍යයන පීඨය	20	20	18	17
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	81	81	81	79
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	22	22	22	23
තාක්ෂණ පීඨය	8	8	13	19
පුස්තකාල පද්ධතිය	41	40	39	39
වෙනත් අංශ	2017	218	212	202
එකතුව	**464**	**464**	**459**	**455**

2.5 විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම

ශ්‍රේණිගත කිරීම	2019	2020	2021	2022
ලෝක ශ්‍රේණිගත කිරීම	4383	4225	3471	3216
ශ්‍රී ලංකා ශ්‍රේණිගත කිරීම	8	8	8	6

2.6 නේවාසිකාගාර පහසුකම්

පීඨය	පිරිමි	ගැහැණු	එකතුව
කෘෂිකර්ම පීඨය	124	406	530
ව්‍යවහාරික විද්‍යා පීඨය	301	723	1024
කළමනාකරණ අධ්‍යයන පීඨය	339	820	1159
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	280	579	859
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	97	830	927
තාක්ෂණ පීඨය	453	349	802
එකතුව	1594	3707	5301

03. ශිෂ්‍ය තොරතුරු සහ මානව සම්පත්

පීඨය/වෙනත්	සිසුන් ගණන	අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් ගණන (ස්ථිර)	විධායක කාර්ය මණ්ඩලය	අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය	අනධ්‍යන කාර්ය මණ්ඩල සමාජිකයින් ගණන
කෘෂිකර්ම පීඨය	694	48	3	1	41
ව්‍යවහාරික විද්‍යා පීඨය	1090	43	2	1	30
කළමනාකරණ අධ්‍යයන පීඨය	1961	52	1	4	16
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	1131	55	2	1	77
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	1929	58	1	3	22
තාක්ෂණ පීඨය	1525	33	2	-	17
පුස්තකාලය	-	6	1	-	38
වෙනත්	-	-	17	10	185
එකතුව	**8330**	**295**	**29**	**20**	**426**

04. දේශීය උපාධි අපේක්ෂකයින්ගේ තොරතුරු

අධ්‍යයන පාඨමාලාව	අධ්‍යයන වර්ෂය	සිසුන් සංඛ්‍යාව
කෘෂිකර්ම පීඨය		
කෘෂිකර්ම විද්‍යාවේදී ගෞරව උපාධිය	පළමු වසර	159
	දෙවන වසර	127
	තෙවන වසර	145
කෘෂිකර්ම විද්‍යාවේදී උපාධිය	තෙවන වසර	131
	සිව්වන වසර	146
ව්‍යවහාරික විද්‍යා පීඨය		
ව්‍යවහාරික විද්‍යා විද්‍යාවේදී උපාධිය	පළමු වසර	236
	දෙවන වසර	245
	තෙවන වසර	145
සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී උපාධිය	පළමු වසර	68
	දෙවන වසර	62
	තෙවන වසර	38
තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී උපාධිය	පළමු වසර	129
	දෙවන වසර	71
	තෙවන වසර	69
ජීවවිද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය	සිව්වන වසර	03
ව්‍යවහාරික විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය	සිව්වන වසර	03
රසායන විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය	සිව්වන වසර	13
භෞතික විද්‍යා හා රසායන විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය	සිව්වන වසර	1
සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී ගෞරව උපාධිය	සිව්වන වසර	05
කර්මාන්ත ගණිතවේදී විද්‍යාවේදී ගෞරව උපාධිය	සිව්වන වසර	14
තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී ගෞරව උපාධිය	සිව්වන වසර	4
ක්ෂුද්‍ර ජීව විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය	සිව්වන වසර	8
කළමනාකරණ අධ්‍යයන පීඨය		
විද්‍යාවේදී (ගෞරව) ගණකාධිකරණ හා මූල්‍ය උපාධිය	පළමු වසර	133
	දෙවන වසර	129
	තෙවන වසර	134
	සිව්වන වසර	133
විද්‍යාවේදී (ගෞරව) ව්‍යාපාර කළමනාකරණ උපාධිය	පළමු වසර	120
	දෙවන වසර	125
	තෙවන වසර	128
	සිව්වන වසර	123
විද්‍යාවේදී (ගෞරව) මානව සම්පත් කළමනාකරණ උපාධිය	පළමු වසර	53
	දෙවන වසර	56
	තෙවන වසර	51
	සිව්වන වසර	50
විද්‍යාවේදී (ගෞරව) තොරතුරු පද්ධති උපාධිය	පළමු වසර	90
	දෙවන වසර	89
	තෙවන වසර	59
	සිව්වන වසර	56
විද්‍යාවේදී (ගෞරව) අලෙවි කළමනාකරණ උපාධිය	පළමු වසර	48
	දෙවන වසර	52
	තෙවන වසර	51
	සිව්වන වසර	50
විද්‍යාවේදී (ගෞරව) සංචාරක හා සත්කාරක කළමනාකරණ උපාධිය	පළමු වසර	69
	දෙවන වසර	63

	තෙවන වසර	48
	සිව්වන වසර	51
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය		
වෛද්‍ය හා ශල්‍ය වෛද්‍යවේදී උපාධිය	පළමු වසර	202
	දෙවන වසර	209
	තෙවන වසර	181
	තෙවන වසර	179
	සිව්වන වසර	180
	පස්වන වසර	180
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය		
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව	පළමු වසර	487
	පළමු වසර	539
	දෙවන වසර	264
	තෙවන වසර	282
ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව	දෙවන වසර	158
	තෙවන වසර	199
තාක්ෂණ පීඨය		
ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය	සිව්වන වසර	102
ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය	සිව්වන වසර	85
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය	සිව්වන වසර	86
ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය	තෙවන වසර	102
ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව	තෙවන වසර	86
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය	තෙවන වසර	91
ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය	දෙවන වසර	100
ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව	දෙවන වසර	85
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය	දෙවන වසර	90
ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය	පළමු වසර	125
ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව	පළමු වසර	105
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය	පළමු වසර	121
ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය	පළමු වසර	122
ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව	පළමු වසර	102
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය	පළමු වසර	123

05. කාර්ය මණ්ඩල තොරතුරු

සේවක කාණ්ඩය	කාර්ය මණ්ඩල කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (U-AC 5 (I))	398	4	114
	මහාචාර්ය (U-AC 5 (II))		37	
	සහකාර මහාචාර්ය		1	
	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පළමු ශ්‍රේණිය (U-AC 3(I))		44	
	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දෙවන ශ්‍රේණිය (U-AC 3(II))		103	
	කථිකාචාර්ය (U-AC 3(III))		51	
	කථිකාචාර්ය (පරිවාස) (U-AC 3(IV))		44	
	පුස්තකාලයාධිකාරි (U-AC 5 (II))	1	1	0

	ජ්‍යෙෂ්ට සහකාර පුස්තකාලයාධිකාරි GR I/II (U-AC 3 (I)/(II))	10	4	5
	සහකාර පුස්තකාලයාධිකාරි (U-AC 3 (IV))		1	
	පරිපාලන කාර්ය මණ්ඩලය සහ අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය (U-EX 3/U-Ex 2)	15	9	6
	වෛද්‍ය නිලධාරීන් (U-Mo 1)	2	0	2
තෘතීය මට්ටම	අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය (U-AS 1)	15	9	6
	පරිපාලන කාර්ය මණ්ඩලය සහ අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය (U-EX 1-2016A,)	19	20	-1
	අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය (U-AS 2-2016A)	19	11	8
ද්විතීය මට්ටම	තාක්ෂණික කාර්ය මණ්ඩලය (U-MN 4 /UMT	76	58	18
	කළමනාකරණ සහකාර සහ අනුබද්ධ කාර්ය මණ්ඩලය (U-MN 4 /U-MN 3/U-MN 2/U- MN 1)	195	160	35
ප්‍රාථමික මට්ටම	ප්‍රාථමික කාර්ය මණ්ඩලය (U-PL 3/U-PL 2/U-PL 1)	234	208	26

06. පර්යේෂණ නව සොයාගැනීම් හා ප්‍රකාශන

ප්‍රකාශන වර්ගය		දේශීය ප්‍රකාශිත	විදේශීය ප්‍රකාශිත
කෘෂිකර්ම පීඨය			
විද්‍යුත් ජර්නල ද ඇතුළුව තීරක දර්ශක ජර්නල වල ඵල කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව		7	28
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ප්‍රමාණ		12	5
ප්‍රකාශනය කරන ලද සම්පූර්ණ ලිපි සංඛ්‍යාව		3	-
ප්‍රකාශයට පත්කරන ලද සාරංශ සංඛ්‍යාව		93	1
ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ පරිච්ඡේද සංඛ්‍යාව		1	6
විශේෂඥ ක්ෂේත්‍රයට අදාලව ප්‍රකාශිත ග්‍රන්ථ හෝ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	ප්‍රකාශකයෙකු විසින්	-	-
	කතෘ විසින්	-	-
ව්‍යවහාරික විද්‍යා පීඨය			
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ජර්නල වල ඵල කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව		1	53
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ප්‍රමාණ		5	1
ප්‍රකාශනය කරන ලද සම්පූර්ණ ලිපි සංඛ්‍යාව		4	1
ප්‍රකාශයට පත්කරන ලද සාරංශ සංඛ්‍යාව		25	32
ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ පරිච්ඡේද සංඛ්‍යාව		2	9
විශේෂඥ ක්ෂේත්‍රයට අදාලව ප්‍රකාශිත ග්‍රන්ථ හෝ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	ප්‍රකාශකයෙකු විසින්	3	-
	කතෘ විසින්	-	-
කළමනාකරණ අධ්‍යයන පීඨය			
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ජර්නල වල ඵල කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව		2	13
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ප්‍රමාණ		9	7
ප්‍රකාශනය කරන ලද සම්පූර්ණ ලිපි සංඛ්‍යාව		2	1
ප්‍රකාශයට පත්කරන ලද සාරංශ සංඛ්‍යාව		36	4
ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ පරිච්ඡේද සංඛ්‍යාව		-	6
විශේෂඥ ක්ෂේත්‍රයට අදාලව ප්‍රකාශිත ග්‍රන්ථ හෝ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	ප්‍රකාශකයෙකු විසින්	1	
	කතෘ විසින්	1	

වෛද්‍ය හා සමාන්තර විද්‍යාපීඨය			
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ජර්නල වල ඵල කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව		-	19
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ප්‍රමාණ		3	-
ප්‍රකාශනය කරන ලද සම්පූර්ණ ලිපි සංඛ්‍යාව		-	-
ප්‍රකාශයට පත්කරන ලද සාරංශ සංඛ්‍යාව		12	8
ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ පරිච්ඡේද සංඛ්‍යාව		-	-
විශේෂඥ ක්ෂේත්‍රයට අදාලව ප්‍රකාශිත ග්‍රන්ථ හෝ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	ප්‍රකාශකයෙකු විසින්	1	-
	කතෘ විසින්	-	-
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය			
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ජර්නල වල ඵල කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව		-	10
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ප්‍රමාණ		-	1
ප්‍රකාශනය කරන ලද සම්පූර්ණ ලිපි සංඛ්‍යාව		-	-
ප්‍රකාශයට පත්කරන ලද සාරංශ සංඛ්‍යාව		-	4
ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ පරිච්ඡේද සංඛ්‍යාව		-	9
විශේෂඥ ක්ෂේත්‍රයට අදාලව ප්‍රකාශිත ග්‍රන්ථ හෝ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	ප්‍රකාශකයෙකු විසින්	-	5
	කතෘ විසින්	-	-
තාක්ෂණ පීඨය			
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ජර්නල වල ඵල කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව		0	9
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ප්‍රමාණ		2	-
ප්‍රකාශනය කරන ලද සම්පූර්ණ ලිපි සංඛ්‍යාව		0	-
ප්‍රකාශයට පත්කරන ලද සාරංශ සංඛ්‍යාව		0	13
ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ පරිච්ඡේද සංඛ්‍යාව		0	5
විශේෂඥ ක්ෂේත්‍රයට අදාලව ප්‍රකාශිත ග්‍රන්ථ හෝ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	ප්‍රකාශකයෙකු විසින්	0	-
	කතෘ විසින්	0	1

07. ලැබූ ප්‍රධානයන්

ලැබූ සම්මානයේ නම	ජාතික /ජාත්‍යන්තර	සම්මානය ප්‍රධානය කරන්නන්ගේ නම හා රට	ලබාගත් අයගේ නම
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ හොඳම පර්යේෂකයන් 20 දෙනා සඳහා වන සම්මානය	දේශීය	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලෙ	ආචාර්ය ඒ. ජේ. ෆනැනඩෝ/මහාචාර්ය එන්. එස්. අබේසිංහ/මහාචාර්ය ඩී. එම්. එස්. දිසානායක්
විද්වත් හා නිර්මාණාත්මක කටයුතුවල පර්යේෂණ විශිෂ්ටත්වය	දේශීය	කෘෂිකර්ම පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා	ආචාර්ය ඒ. ජේ. ෆනැන්දු
වර්ෂය සඳහා පර්යේෂණ, විද්වතුන් සහ නිර්මාණාත්මක කටයුතුවල විශිෂ්ටත්වය (2022 දී ප්‍රදානය කරන ලදි)	ජාතික	කෘෂිකර්ම පීඨය, රජරට විශ්වවිද්‍යාලය	ආචාර්ය. එල්. කේ. ඩබ්. විජයරත්න
කුලියාපිටිය පොල් ත්‍රිකේණ පොල් කිරි නිෂ්පාදකයින්ගේ සමුපකාර සංගමයේ මූලික සමීක්ෂණය	ජාතික	කුඩා වතු හිමියන්ගේ කෘෂි ව්‍යාපාර හවුල්කාරීත්ව වැඩසටහන	ආචාර්ය ඒ. එම්. කේ. ආර් බන්ඩාර, මහාචාර්ය පී. ඒ. එස්. ගිනිගද්දර, ආචාර්ය එල්. පී රූපසිංහ, ඒ. අයි. වයි. ලන්කාපුර මයා
දිඹුලාගල විවිධ සේවා සමුපකාර සමිතිය යටතේ බීජ	ජාතික	කුඩා වතු හියියන්ගේ කෘෂි ව්‍යාපාර හවුල්කාරීත්ව වැඩසටහන	ආචාර්ය ඒ. පී. එස්. ෆනැන්ඩෝ, ආචාර්ය එස්.

වී වගාව පිළිබඳ මූලික සමීක්ෂණය			එම්. සී.බී කරල්ලියද්ද, ඒ. අයි. වයි. ලන්කාපුර මයා
ප්‍රෙන්ඩිස් ගැරන්ටී සීමාසහිත සමාගම සමඟ රටකජු ව්‍යාපෘතියේ මූලික සමීක්ෂණය	ජාතික	කුඩා වතු හිමියන්ගේ කෘෂි ව්‍යාපාර හවුල්කාරීත්ව වැඩසටහන	ආචාර්ය ඒ. එම්. කේ. ආර්. බන්ඩාර, මහාචාර්ය පී. ඒ.එස්. ගිනිගද්දර, ආචාර්ය එල්. පී. රූපසිසේන, එස්. පී. දිසානායක මයා
තරුණ ව්‍යවසායක ව්‍යාපාතියේ මූලික සමීක්ෂණය	ජාතික	කුඩා වතු හියියන්ගේ කෘෂි ව්‍යාපාර හවුල්කාරීත්ව වැඩසටහන	ආචාර්ය ඒ. පී. එස්. ෆනෑන්ඩෝ, ආචාර්ය එස්. එම්. සී.බී කරල්ලියද්ද, එන්. එම්. කේ. සී. ප්‍රේමරත්න මයා
කළමනාකරණ අධ්‍යන පීඨයෙහි ඉහළම එච් - දර්ශකය ඇති පර්යේෂකයා සඳහා 2022 උපකුලපති සම්මානය (පළමු ස්ථානය)	ජාතික	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා	ආචාර්ය ආර්. එම්. එන්. සී. ස්වර්ණපාලී
වැඩිම උපුටා දැක්වීම් සංඛ්‍යාවක් ඇති පර්යේෂකයා සඳහා 2022 උපකුලපති සම්මානය (3 වන ස්ථානය)	ජාතික	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා	ආචාර්ය ආර්. එම්. එන්. සී. ස්වර්ණපාලී
කළමනාකරණ අධ්‍යන පීඨයෙහි ඉහළම එච් - දර්ශකය ඇති පර්යේෂකයන් සඳහා 2022 උපකුලපති සම්මානය	ජාතික	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා	ආචාර්ය කේ. වී. අරුණශාන්ත
කළමනාකරණ අධ්‍යන පීඨයෙහි වැඩිම උපුටා දැක්වීම් සංඛ්‍යාවක් ඇති පර්යේෂකයන් සඳහා 2022 උපකුලපති සම්මානය	ජාතික	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා	ආචාර්ය කේ. වී. අරුණශාන්ත
කළමනාකරන අධ්‍යයන පීඨයේ විෂිශ්ඨතම තරුණ පර්යේෂකයා	ජාතික	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා	ආචාර්ය පී. ආර්. වීරතුංග
කළමනාකරණ අධ්‍යන පීඨයෙහි වැඩිම උපුටා දැක්වීම් සංඛ්‍යාවක් ඇති පර්යේෂකයන් සඳහා 2022 උපකුලපති සම්මානය	ජාතික	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා	ආචාර්ය පී. ආර්. වීරතුංග
කළමනාකරණ අධ්‍යන පීඨයෙහි ඉහළම එච්ූ දර්ශකය ඇති පර්යේෂකයන් සඳහා 2022 උපකුලපති සම්මානය	ජාතික	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා	ආචාර්ය පී. ආර්. වීරතුංග
2022 දී වැඩිම පොත් සහ පරිච්ඡේද ඇති පර්යේෂකයා		ආචාර්ය එම්. පී. එන් .දයානන්ද	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය - ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පර්යේෂණ විශිෂ්ටතා සම්මාන	ජාතික	රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා	වෛද්‍ය ආර්. එම්. එස්. අයි. රාජපක්ෂ
හොඳම වාචික ඉදිරිපත් කිරීම.	ජාත්‍යන්තර	කායික විද්‍යාඥයින්ගේ දකුණු ආසියානු සංගමය (දකුණු ආසියානු රටවල්)	වෛද්‍ය එච්. ඊ. සී. එස්. කුමාර

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයෙ පර්යේෂණ විශිෂ්ටතා සම්මාන	ජාතික	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	වෛද්‍ය ආර්. එම්. එස්. අයි. රාජපක්ෂ
තරුණ භෞතවෛද්‍ය නායකයින්ගේ සම්මානය 2022	ජාත්‍යන්තර	අන්තර් අධ්‍යන හවුල්කාරිත්ව (අයි.ඒ.පී), කළමනාකරණ පාසල ඉතාලිය සහ යුරොපියානු කළමනාකරණ (ඊ.එස්.එම්.ටී) හා තාක්ෂන පාසල සහ ජර්මනියේ බර්ලින් පාසල	මහාචාර්ය කෝසල වීරකෝන්

08. පාඨමාලා පිළිබඳ විස්තර

8.1 අභ්‍යන්තර පාඨමාලා

පාඨමාලාවේ නම	කාලසීමාව	මාධ්‍ය
කෘෂිකර්ම පීඨය		
කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය 2017/2018 කණ්ඩායම	අවුරුදු - 4	ඉංග්‍රීසි
කෘෂිකර්ම විද්‍යාවේදී ගෞරව උපාධිය (2018.12.04 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලිපියට අනුව 2018/2019 කණ්ඩායමේ සිට)	අවුරුදු - 4	ඉංග්‍රීසි
ව්‍යවහාරික විද්‍යා පීඨය		
ව්‍යවහාරික විද්‍යා විද්‍යාවේදී උපාධිය	අවුරුදු - 3	ඉංග්‍රීසි
ව්‍යවහාරික විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
කර්මාන්ත ගණිතයවේදී ගෞරව විද්‍යා උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ව්‍යවහාරික ජීවවිද්‍යා විද්‍යාවේදී ගෞරව උපාදිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ක්ෂුද්‍ර ජීව විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
භෞතික විද්‍යා හා රසායන විද්‍යා (ඒකාබද්ධ ප්‍රධාන) විද්‍යාවේදී උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ජීවවිද්‍යා හා භෞතික විද්‍යා (ඒකාබද්ධ ප්‍රධාන) විද්‍යාවේදී උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
රසායන විද්‍යාවේදී විද්‍යා ගෞරව උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
සෞඛ්‍ය ප්‍රවර්ධනවේදී විද්‍යා උපාධිය	අවුරුදු - 3	ඉංග්‍රීසි
සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී උපාධිය	අවුරුදු - 3	ඉංග්‍රීසි
තොරතුරු තාක්ෂණය විද්‍යාවේදී ගෞරව උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
කළමනාකරණ අධ්‍යයන පීඨය		
ගණකාධිකරණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ව්‍යාපාර තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
සංචාරක හා හෝටල් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය		
වෛද්‍ය විද්‍යාවේදී හා ශල්‍ය විද්‍යාවේදී උපාධිය	අවුරුදු - 5	ඉංග්‍රීසි
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය		
පරිසර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	සිංහල
සිංහල පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	සිංහල
ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	සිංහල
පරිසරය හා සමාජය පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය	අවුරුදු - 3	සිංහල
සිංහල හා සමාජ ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය	අවුරුදු - 3	සිංහල
භාෂාව හා සංචාරක කර්මාන්තය පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය	අවුරුදු - 3	ඉංග්‍රීසි

ආර්ථික විද්‍යාව හා විද්‍යාත්මක කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය	අවුරුදු - 3	සිංහල
ඉතිහාසය පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය	අවුරුදු - 3	සිංහල
තාක්ෂණ පීඨය		
ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය - ජෛව සැකසුම් තාක්ෂණය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය - ආහාර විද්‍යාව හා තාක්ෂණය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය - විදුලි හා විද්‍යුත් තාක්ෂණය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය - ද්‍රව්‍ය තාක්ෂණය	අවුරුදු - 4	ඉංග්‍රීසි
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි

8.2 වෙනත් පාඨමාලා

පාඨමාලාවේ නම	කාලසීමාව	මාධ්‍ය
සහතිකපත්‍ර පාඨමාලා		
ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව (සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය)	අවුරුදු - 01	ඉංග්‍රීසි
දෙමළ සහතිකපත්‍ර පාඨමාලාව (සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය)	අවුරුදු - 01	දෙමළ/ සිංහල
තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලාව (ව්‍යවහාරික විද්‍යා පීඨය)	මාස - 06	ඉංග්‍රීසි / සිංහල
''ඌණපූරක හා වෛකල්පිත වෛද්‍ය විද්‍යාව'' සහතිකපත්‍ර පාඨමාලාව (වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය)	මාස - 06	සිංහල
''ඌණපූරක හා වෛකල්පිත වෛද්‍ය විද්‍යාව'' සහතිකපත්‍ර පාඨමාලාව (වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය)	අවුරුදු - 01	සිංහල
ඩිප්ලෝමා පාඨමාලා		
ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය)	අවුරුදු - 01	ඉංග්‍රීසි
දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව (සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය)	අවුරුදු - 01	දෙමළ
තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (පරිගණක මධ්‍යස්ථානය)	අවුරුදු - 01	ඉංග්‍රීසි
ව්‍යාපාරික ආර්ථික විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව	අවුරුදු - 01	සිංහල
පරිසර කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව	අවුරුදු - 01	සිංහල
බාහිර උපාධි පාඨමාලා		
ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය	අවුරුදු - 03	සිංහල
විද්‍යාවේදී බාහිර උපාධි පාඨමාලාව (ජීව විද්‍යා)	අවුරුදු - 03	ඉංග්‍රීසි
විද්‍යාවේදී බාහිර උපාධි පාඨමාලාව (භෞතික විද්‍යාව)	අවුරුදු - 03	ඉංග්‍රීසි
පශ්චාත් උපාධි පාඨමාලා		
කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	අවුරුදු - 01	ඉංග්‍රීසි
ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය	අවුරුදු - 02	ඉංග්‍රීසි
අධ්‍යාපන පශ්චාත් උපාධිය	මාස - 18	සිංහල
ළමා ආරක්ෂණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	අවුරුදු - 01	ඉංග්‍රීසි
කෘෂිකර්මපති පශ්චාත් උපාධිය	අවුරුදු - 01	ඉංග්‍රීසි
දර්ශනපති පර්යේෂණ (ව්‍යවහාරික විද්‍යා පීඨය)	අවුරුදු 02	ඉංග්‍රීසි
දර්ශනපති පර්යේෂණ (ව්‍යවහාරික විද්‍යා පීඨය)	අවුරුදු - 03	ඉංග්‍රීසි
ආචාර්ය උපාධිය, පර්යේෂණ (ව්‍යවහාරික විද්‍යා පීඨය)	අවුරුදු 3	ඉංග්‍රීසි
දර්ශනපති පර්යේෂණ (ව්‍යවහාරික විද්‍යා පීඨය)	අවුරුදු - 05	ඉංග්‍රීසි
දර්ශනපති පර්යේෂණ (වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය)	අවුරුදු - 02	ඉංග්‍රීසි
දර්ශනපති පර්යේෂණ (වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය)	අවුරුදු - 03	ඉංග්‍රීසි
ආචාර්ය උපාධිය, පර්යේෂණ (වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය)	අවුරුදු - 03	ඉංග්‍රීසි
ආචාර්ය උපාධිය, පර්යේෂණ (වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය)	අවුරුදු - 04	ඉංග්‍රීසි
කෘෂිකර්මය පිළිබඳ දර්ශනපති උපාධිය	අවුරුදු - 03	ඉංග්‍රීසි

09. පුනරාවර්තන වියදම්

විෂය	2021 (රු.)	2022(රු.)
පුද්ගල පඩි නඩි	1,765,944,698	1,930,556,702
ගමන් වියදම්	1,661,208	3,402,014
සැපයුම්	44,335,516	71,646,938
නඩත්තු වියදම්	12,826,239	18,487,301
ගිවිසුම්ගත සේවා	203,297,725	233,836,762
වෙනත්	57,159,230	48,294,429
ශිෂ්‍යාධාර සඳහා මූල්‍ය අධාර	52,996,000	55,144,000
එකතුව	**2,138,220,616**	**2,361,368,146**

10. ප්‍රාග්ධන වියදම්

විෂය	2022 (රු.)
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ ලබා ගැනීම	4,032,485
ඉඩම්	33,600
යටිතල පහසුකම් වත්කම්	1,183,557
තොරතුරු තාක්ෂණ උපකරණ	54,249,833
විද්‍යාගාර ඉගැන්වීම්	19,968,407
ගොඩනැගිලි සහ ඉඩම් අත්පත් කර ගැනීම	14,150,223
පොත් සහ වාර සඟරා	4,772,860
වැඩබිම් සහ යන්ත්‍රෝපකරණ	773,666
උපකරණ අළුත්වැඩියා සහ නඩත්තු	392,833,675
එකතුව	**491,998,306**

11. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශිය/විදේශීය අරමුදල්)

නම සහ කාරණය	ණය / දීමනා	අරමුදල් සපයන ආයතන	ඇස්තමේන්තු ගත මුළු පිරිවැය
ගෝලීය ගැටළුවක් වී ඇති රටවල් දෙකක් තුල ආවේනික ලැප්ටොපයිරෝසිස් ආමන්ත්‍රණය අයි. සී.අයි. ඩී. ආර්- වෛද්‍යා හා සමාන්තර විද්‍යා පීඨය	දීමනා	කැලිෆෝනියා විශ්වවිද්‍යාලය	75,584,520
මාතෘ හා ළමා සෞඛ්‍ය පර්යේෂණ ඒකක ව්‍යාපෘතිය	දීමනා	එඩින්බර් විශ්වවිද්‍යාලය	32,849,532
කුඩා වතු හිමියන්ගේ කෘෂි ව්‍යාපාර හවුල්කාරීත්ව වැඩසටහන සමඟ සහයෝගී අධ්‍යයනය	දීමනා	බදුල්ල දිස්ත්‍රික් හරිතාගාර සංගමය	2,267,155
කුඩා වතු හිමියන්ගේ කෘෂි ව්‍යාපාර හවුල්කාරීත්ව වැඩසටහන සමඟ සහයෝගී අධ්‍යයනය (අගය දාමයන් පිළිබඳ මූලික අධ්‍යනයන්)	දීමනා	බදුල්ල දිස්ත්‍රික් හරිතාගාර සංගමය	1,541,882
ලෝක සෞඛ්‍ය සංවිධානය/ටී.ඩී.ආර්. සමූහ අරමුදල් ප්‍රදාන එකමුතුව - මැදවච්චියේ ලේස්මේනියාසිස් පාදක කරගත් රෝග පාලක පර්යේෂණය	දීමනා		2,040,539
ශ්‍රී ප්‍රොම් ව්‍යාපෘතිය - ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය	දීමනා		5,116,320
නිවාස මූලික කරගත් පුර්ණ ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා ජාතික උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කිරීම	දීමනා	කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය	1,237,500
විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වන වෙනත් ව්‍යාපෘති			
උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය	දීමනා		712,000,000

එකතුව			**832,637,448**
දේශගුණික විපර්යාස සඳහා අනුවර්තිත ජල කළමනාකරණ (සී.සී. ජලය) සඳහා ක්‍රමාංකනය	දීමනා	යුරෝපා කොමිසම	යුරෝ 77,785
ඉරැස්මස් වැඩසටහන මඟින් පිරිනමන ලද අරමුදල් (201/C384/04)	දීමනා	යුරෝපා කොමිසම	යුරෝ 96,394
ඉක්ලිප්ස් ව්‍යාපෘතිය	දීමනා	කීලේ විශ්වවිද්‍යාලය. එක්සත් රාජධානිය	£1,066,574
විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය	දීමනා	ආසියානු සංවර්ධන බැංකුව	ඇමරිකන් ඩොලර් මිලියන් 24.0
අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණුව තුළින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල පාලනය, කළමනාකරණය සහ ප්‍රතිසංස්කරණ වැඩිදියුණු කිරීම.	දීමනා	යුරෝපානු සංගමය	Euro 69875

12. ව්‍යාපෘති පිළිබඳ වියදම් (දේශීය විදේශීය අරමුදල්)

ව්‍යාපෘතියේ නම	තක්සේරු කරන ලද මුළු මුදල රු..	වියදම් 2021 රු.	වියදම් 2022 රු	සමුච්චිත වියදම 31.12.2022 රු.
ආවේණික රටවල් දෙකක මී උණ වල ගෝලීය භාරය පිළිබඳ ආමන්ත්‍රණය කිරීම. අයි.සී.අයි.ඩී.ආර්. - වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	75,584,520	5,093,496	2,864,798	73,274,134
මාතෘ හා ළමා සෞඛ්‍ය පර්යේක්ෂණ ඒකකයේ ව්‍යාපෘතිය (විකුණුම් කරු අධ්‍යනය)	32,849,532	7,255,844	6,091,919	26,489,684
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය හා ගොවි ප්‍රජාව අතර හවුල් කාරිත්වය ශක්තිමත් කිරීමේ වැඩසටහන	5,116,320	893,694	405,993	4,586,195
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ ජපන් භාෂා විද්‍යාගාරය ඉදිකිරීම (ප්‍රදාන සමීක්ෂණය) කෘෂිව්‍යාපාර සහයෝගිතා වැඩසටහනේ අරමුදල්	2,267,155		2,051,105	2,051,105
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ ජපන් භාෂා විද්‍යාගාරය ඉදිකිරීම අගයදාම පිළිබඳ (මූලික අධ්‍යනය) කෘෂිව්‍යාපාර සහයෝගිතා වැඩසටහනේ අරමුදල්	1,541,882	-	728,932	728,932
ලෝක සෞඛ්‍ය සංවිධානය/ටී.ඩී.ආර්. සමූහ අරමුදල් ප්‍රදාන එකමුතුව - මැදවච්චියේ ලේස්මේනියාසිස් පාදක කරගත් රෝග පාලක පර්යේෂණය	2,040,539		648,300	648,300
නිවාස මූලික මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා ජාතික උපාය මාර්ගික සැලැස්ම සැකසීම	1,237,500	480,000	-	1,029,000
විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වන වෙනත් ව්‍යාපෘති				
උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය	712,000,000	366,945,823	179,139,844	658,798,707
එකතුව - 1	**832,637,448**	**380,668,857**	**191,930,891**	**767,596,057**

එරස්මස් ප්ලස් වැඩසටහන (201/C384/04) - එරස්මස් I හි අරමුදල් ප්‍රදානය	යූරෝ 96,394	2,226,156	1,077,862	3,304,018
දේශගුණික විපර්යාස සඳහා අනුවර්තිත ජල කළමනාකරණ (සී.සී. ජලය) සඳහා ක්‍රමාංකනය - එරස්මස් II හි අරමුදල්	යූරෝ 77,785	1,501,280	4,141,970	5,643,250
ඉක්ලිප්ස් ව්‍යාපෘතිය	£1,066,574	37,739,427	60,464,662	111,787,234
විද්‍යා හා තාක්ෂණ මානව සම්පත්සංවර්ධන ව්‍යාපෘතිය	ඇමරිකන් ඩොලර් මිලියන් 24.0		284,000,000	1,518,000,000
අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණුව තුළින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල පාලනය, කළමනාකරණය සහ ප්‍රතිසංස්කරණ වැඩිදියුණු කිරීම. (ඉනැට්)	යුරෝ 69,875	464,725	3,256,650	3,721,375
එකතුව - 2		**41,931,588**	**352,941,144**	**1,642,455,877**

13. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)

විෂය	ප්‍රතිපාදන 2022 රු.	වියදම 2022 රු	ඉතිරි කිරීම/අතිරික්තය රු.
ව්‍යාපෘති හැර වෙනත් පුනරාවර්තන	2,240,000.000	2,306,224,146	(66,224,146)
ව්‍යාපෘති හැර ප්‍රාග්ධනය	261,687,153	480,558,157	(218,871,004)
දේශීය ව්‍යාපෘති අරමුදල්	3,834,330	3,834,330	-
ව්‍යාපෘති විදේශීය අරමුදල්	541,037,706	541,037,706	-
දේශීය ව්‍යාපෘති අරමුදල් - තාක්ෂණ පීඨ ගොඩනැගිලි ව්‍යාපෘතිය	252,100,000	11,440,149	240,659,851
එකතුව	**3,298,659,189**	**3,343,094,488**	**(44,435,299)**

14. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ආදායම් උත්පාදනය)

විෂය	ආදායම 2022 (රු.)	වියදම 2022 (රු.)	ඉතිරි කිරීම/අතිරික්තය
මූලික උපාධි වැඩසටහන්	21,475,000	12,675,594	(8,799,406)
බාහිර උපාධි වැඩසටහන්			
ඉංග්‍රීසි ඩිප්ලෝමාව හා තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව	15,000,000	18,568,646	3,568,646
පශ්චාත් උපාධි අධ්‍යාපනය			
සහතික පත්‍ර පාඨමාලාව			
උපදේශක සේවා			
වෙනත්	10,000,000	61,454,257	51,454,257
එකතුව	**46,475,000**	**92,698,497**	**46,223,497**

15. මූල්‍ය ප්‍රගතිය විශ්ලේෂණාත්මකව-2022

විෂය	පීඨය					
	කෘෂිකර්ම පීඨය	ව්‍යවහාරික විද්‍යා පීඨය	කළමනාකරණ අධ්‍යයන පීඨය	වෛද්‍ය හා සම්බන්ධ විද්‍යා පීඨය	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	තාක්ෂණ පීඨය
එක් සිසුවෙකු සඳහා පුනරාවර්තන වියදම	274,403	322,348	218,073	440,271	242,419	178,824
එක් සිසුවෙකු සඳහා ප්‍රාග්ධන වියදම	32,493	28,814	27,360	259,501	22,691	30,124
එකතුව	**306,896**	**351,162**	**245,433**	**699,772**	**265,110**	**208,948**

16. යටිතල පහසුකම් පිළිබඳ විස්තර

යටිතල පහසුකම් පිළිබඳ විස්තර	වියදම රුපියල් මිලියන
නව ගොවි බිමේ කටු කම්බි වැට - කෘෂිකර්ම පීඨය	1,183,557

පීඨ, පුස්තකාල ජාලය, අධ්‍යයන සහයක අංශ, මධ්‍යස්ථාන හා ඒකකයන් හි වාර්තාවන්

17. කෘෂිකර්ම පීඨය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය වර්ෂ 2001 දී උපාධි අපේක්ෂකයින් 17 දෙනෙකුගෙන් ආරම්භ කරන ලදි. කෘෂිකර්ම පීඨය ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ වියළි කළාපයට යෝග්‍ය වූ කෘෂි කාර්මික ක්‍රම පිළිබඳ අවධානය යොමු කරමින් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විද්‍යා (උපාධි) වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. කෘෂිකර්මය පදනම් කර ගත් විවිධ විෂයන්ගෙන් යුත් උපාධි වැඩසටහන් අධ්‍යයන වාර 08 කින් සමන්විතව පවතී. අද වන විට කෘෂිකර්ම පීඨය, කෘෂි ඉංජිනේරු සහ පාංශු විද්‍යා, කෘෂිකර්ම පද්ධති, සත්ව ආහාර විද්‍යාව සහ ශාක විද්‍යාව යන අධ්‍යනාංශ 04කින් ද පරිගණක ඒකකය, ඉංග්‍රීසි භාෂා පුහුණු අංශය, පීඨ ගොවිපළ හා පුස්තකාලයකින් සමන්විත වේ. පාංශු විද්‍යා, ශාක විද්‍යා, ජීව රසායන විද්‍යා සහ භූගෝලීය තොරතුරු පද්ධති විද්‍යාගාරය එක්ව පැවැත්වෙන කෘෂි ඉංජිනේරු වැඩ මුළු මඟින් උපාධි අපේක්ෂකයන්ගේ විශ්ලේෂණ හා අනෙකුත් කුසලතා සංවර්ධනය සඳහා අවස්ථාවන් සලසනු ලැබේ.

වසරකට කෘෂිකර්ම පීඨයට සිසුන් 175 පමණ ඇතුළත් කර ගන්නා අතර එම සියළුම සිසුන් හට නේවාසිකාගාර පහසුකම් විශ්වවිද්‍යාලය මඟින් සපයා දෙනු ලැබේ. වර්තමානයේදී කෘෂිකර්ම පීඨය 90කට ආසන්න අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලයකින් සමන්විත වේ. කෘෂිකර්ම පීඨයේ ක්‍රියාත්මක වන උපාධි පාඨමාලා මූලික වැඩ සටහනකින් සහ විශේෂිකරණ අංශවලින් සමන්විත වන අතර මූලික වැඩසටහන සියළුම සිසුන් සඳහා අනිවාර්ය වන අතර එය පළවෙනි අධ්‍යනවාර පහ තුල විසිර පවතී. හය වන සහ හත් වන අධ්‍යයනවාර වල සිසුනට ඔවුන්ගේ රුචිකත්වය පරිදි විශේෂිකරණ අංශය තෝරාගැනීමට අවස්ථාව හිමිවේ. අවසන් අධ්‍යන වාරයේදී සිසුන් විසින් ඒකල පරික්ෂණ ව්‍යාපෘතියක් තෝරා ගත යුතු අතර අවසානයේදී විස්තරාත්මක පර්යේක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු අතර පසුව කාර්මික පුහුණුවක් ලබා ගත යුතුය.

පීඨය විසින් පිරිනමනු ලබන විශේෂිකරන/ ප්‍රධාන මොඩියුල වනුයේ

- කෘෂිකාර්මික ජීව විද්‍යාව
- කෘෂිකාර්මික ආර්ථික සහ විස්තාරණය
- කෘෂිකාර්මික ඉංජිනේරු
- කෘෂිකාර්මික පද්ධති සහ කළමනාකරණය
- සත්ත්ව නිෂ්පාදන සහ තාක්ෂණය
- බෝග විද්‍යාව
- පාරිසරික පාංශු කළමනාකරණය
- ආහාර සහ පසු අස්වනු තාක්ෂණය

මූලික උපාධි අපේක්ෂක වැඩසටහනට අමතරව, පීඨය විසින් වර්ෂ 2020 සිට කෘෂිකර්මපති පශ්චාත් උපාධි වැඩසටහන පිරිනමනු ලැබේ. කෘෂිකර්මාන්තය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන සහ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමා වැඩසටහන වර්ෂ 2022 දී අලුතින් ආරම්භ කරන ලදි. සඳහා අයදුම්පත් කැඳවා තිබේ. ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි අධ්‍යයන අවස්ථා වැඩි කිරීම සඳහා 2023 දී කෘෂිකර්මය පිළිබඳ ආචාර්ය උපාධියක් හඳුන්වා දීමට පීඨය අපේක්ෂා කරයි. තවද, පීඨය විසින්, කෘෂි පාරිසරික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කෘෂි තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, පසු අස්වනු හා ආහාර තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ නලතුල රෝපිත ශාක විද්‍යාව පළිබඳ ශාස්ත්‍රපති උපාධිය ආදී පශ්චාත් උපාධි වැඩසටහන් කිහිපයක් හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

14 වන වාර්ෂික පර්යේෂන සම්මන්ත්‍රණය දින 02ක් තුල මිනිත්තු තුනේ නිබන්ධන (3MT) තරගයක් සමඟ සාර්ථකව පවත්වන ලද අතර, ක්‍රියාදාමයක් ප්‍රකාශනය කරන ලදි.

ආ. ජයග්‍රහණයන්

- පශ්චාත් උපාධි පර්යේක්ෂණ ඉදිරිපත් කිරීම් සහ ජාත්‍යන්තර උපාධි අපේක්ෂක අත්දැකීම් බෙදා ගැනිමේ සැසිය අලුතින් හඳුන්වා දෙන ලදි.
- දර්ශණපති උපාධි වැඩසටහන සඳහා අපේක්ෂකයින් 09 දෙනෙකු ලියා පදිංචි කර ගැනීම.
- කෘෂිකර්මපති පශ්චාත් උපාධි වැඩසටහන සඳහා තුන්වන සිසු කණ්ඩායම බඳවා ගැනීම සහ ග්‍රාමීය සංවර්ධන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා පළමු කණ්ඩායම බඳවා ගැනීම.
- ''කෘෂිකර්මය හා පරිසර පද්ධති පිළිබඳ ශ්‍රී ලාංකික ජර්නලය'' වන පීඨ විද්‍යුත් ජර්නලයේ දෙවන වෙළුම ප්‍රකාශයට පත් කිරීම.
- පීඨ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ශ්‍රවණාගාරයට ශබ්ද පද්ධතියක් මිලදී ගැනීම.
- කාර්මික පුහුණුව සහ අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා සහයෝගීතාවයෙන් අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.

- 2020/2021 කණ්ඩායම මඟින් "Oreda" ඉංග්‍රීසි රාත්‍රිය සුම් තාක්ෂණය මඟින් පවත්වන ලදි. උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතියෙන් සහ පීඨ සංවර්ධන ව්‍යාපෘතියට ලැබුණු අරමුදලින් සියයට 75කට වඩා වැඩි ප්‍රමාණයක් (රුපියල් මිලියන 120) යොදා ගෙන ඉගෙනීම, ඉගැන්වීම, ඇගයීම සහ ඉංග්‍රීසි භාෂා කුසලතා වර්ධනය කිරීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමට අදාල ක්‍රියා කාරකම් පහක් සංවිධානය කරන ලදි. එසේ 2022 දී එම් අරමුදල් භාවිතයෙන් භාණ්ඩ 100 කට අධික ප්‍රමාණයක් මිලදී ගන්නා ලදි.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- අරමුදල් නොමැතිකම නිසා ගොවිපළ මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමේ කටයුතු ආරම්භ කිරීමට නොහැකි වීය.
- චක්‍රලේඛන මඟින් ඉදිකිරීම් කටයුතු සීමා කිරීම හේතුවෙන් රසායනාගාර සහ දේශන ශාලා සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු ප්‍රමාද විය.

ඈ. අනාගත දැක්ම

- තිරසාර සංවර්ධනය පිළිබඳ කලාපීය පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධි පර්යේෂණ උපාධි (ආචාර්ය සහ ශාස්ත්‍රපති) වැඩසටහන් ආරම්භ කිරීම.
- කෘෂි තාක්ෂණය සහ පාරිසරික කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය හදුන්වා දීම.
- පීඨ ගොවිපළේ පශු සම්පත් ඒකකය පුළුල් කිරීම.
- දේශීය හා ජාත්‍යන්තර ආයතන සමඟ පර්යේෂණ ව්‍යාපෘතිවල සහයෝගිතාවයක් ඇති කිරීම.
- රසායනාගාර සහ දේශන ශාලා සංකීර්ණයක් ස්ථාපනය කිරීම.
- අවශ්‍ය සියලු පහසුකම් සහිත කිරි නිෂ්පාදන හා මස් සැකසුම් ඒකකයක් පිහිටුවීම.
- පීඨයේ 15 වැනි වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය සංවිධානය කිරීම.
- ගොවිපල පරිශ්‍රයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම.
- පීඨ ගොවිපල වටා සහ නව ඉඩම වටා වැටවල් ඉදි කිරීම (කැබලි අංක 03)
- පීඨයේ සෞන්දර්යාත්මක පෙනුම වැඩිදියුණු කිරීම.
- කෘෂිකර්ම පීඨය සඳහා ප්‍රධාන ජල ටැංකිය සහ ජලය බෙදා හැරීමේ පද්ධතිය ඉදිකිරීම
- කෘෂිකර්ම පීඨයේ අධ්‍යනාංශ, පුස්තකාලය, පරිගණක මධ්‍යස්ථානය සහ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම.
- කෘෂිකර්ම පීඨය සඳහා වෛද්‍ය මධ්‍යස්ථානයක් ඉදිකිරීම.
- කෘෂිකර්ම පීඨ නේවාසිකාගාරය සඳහා ආපන ශාලාවක් ඉදිකිරීම.
- පීඨ ප්‍රවේශය සහ මායිම් වැට වැඩි දියුණු කිරීම. (අදියර 1, 2 සහ 3)
- කෘෂිකර්ම පීඨය සඳහා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම, ක්‍රීඩා මණ්ඩපය ඉදිකිරීම සහ පීඨ ක්‍රීඩා පිටිය වැඩිදියුණු කිරීම.
- අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම. (අදියර 2 සහ 3)
- දැනට පවතින වාරි ඇල පද්ධතිය වෙනස් කිරීම. (අදියර 2)
- කාර්ය මණ්ඩල විනෝදාත්මක සහ සෞඛ්‍ය වැඩි දියුණු කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම. (අදියර 3)
- විකුණුම් මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම.
- අධ්‍යනාංශ ගොඩනැගිලි සංකීර්ණය සහ ශ්‍රවණාගරය ජාලගත කිරීම (දත්ත සහ අන්තර් සම්බන්දතා)
- දැනට පවතින පශු සම්පත් ඒකක වැඩි දියුණු කිරීම.
- ආරක්ෂිත නිවාස දිගු කිරීම - ශාක විද්‍යා අධ්‍යනාංශය
- වැඩපොල විස්තාරණය කිරීම - කෘෂිකර්ම ඉංජිනේරු අධ්‍යනාංශය
- දැනට පවතින කෘෂි කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය පාරිසරික නීරික්ෂණ මධ්‍යස්ථානයක් බවට වැඩි දියුණු කිරීම.
- විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් ඉදිකිරීම.
- වාහන නැවතුම්පොල ඉදිකිරීම - අදියර 1, 2 සහ 3
- කෘෂිකර්ම පීඨය සඳහා මලාපවහන පද්ධතිය ඉදිකිරීම.

- කෘෂිකර්ම පීඨී පීඨාධිපති, සහකාර ලේඛකාධිකාරී. සහකාර මුල්‍යාධිකාරී, ගොවිපල කළමනාකරු සහ අනධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා නිල නිවාස ඉදිකිරීම.
- අකුණු ආරක්ෂණයක් සහ ගිනි ආරක්ෂණයක් ස්ථාපනය කිරීම.
- විදුලිය සඳහා සුර්ය පැනල් ස්ථාපනය කිරීම.

18. ව්‍යවහාරික විද්‍යා පීඨය

අ. හැඳින්වීම

වර්ෂ 1995 නොවැම්බර් මස 07වන දින ප්‍රකාශයට පත්කරන ලද අංක 896/2 ගැසට් නිවේදනයට අනුව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය වර්ෂ 1995 නොවැම්බර් මසදී අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කය තුල ස්ථාපිත කරන ලදි. පොල්ගොල්ලේ පිහිටි මධ්‍යම පළාත් අනුබද්ධ විශ්වවිද්‍යාලය හා ඒකාබද්ධ කරමින් ව්‍යවහාරික විද්‍යා පීඨය වර්ෂ 1997 ජනවාරි මස 10වන දින ආරම්භ කරන ලදි. මෙහිදී ක්ෂණික කාර්යක් ලෙස ඩිප්ලෝමා අවශ්‍යතාවය සම්පූර්ණ කොට ඇති සිසුන් 102ක් සඳහා තුන් අවුරුදු උපාධියක් දක්වා අධ්‍යයන කටයුතු තහවුරු කරගෙන යාමට අවස්ථා සලසා දුන් අතර ඔවුන් සියළු දෙනාම වර්ෂ 1998දී උපාධිය සම්පූර්ණ කරන ලදි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් එවන ලද පළමු සිසු කණ්ඩායම බඳවා ගැනීම වර්ෂ 1997 නොවැම්බර් මසදී සිදු විය.

ව්‍යවහාරික විද්‍යා පීඨයේ ගොඩනැගිලි සංකීර්ණයේ පළමු අදියර ඉදිකිරීම් සම්පූර්ණ වූ පසු, වසර 10 ක කාලයක් පොල්ගොල්ල පරිශ්‍රයේ ක්‍රියාත්මක වූ පීඨය 2006 ජනවාරි 16 වන දින මිහින්තලේ පරිශ්‍රයේ ස්ථාපනය කරන ලදි. 2011 වසරේදී පීඨ ගොඩනැගිල්ලේ දෙවන අදියර ඉදිකිරීම් අවසන් වූ පසු පරිපාලන ඒකකයද මෙම ගොඩනැගිල්ල තුල ස්ථාපනය කෙරිණි.. 2013 වසරේ දැයට කිරුළ ව්‍යාපෘතිය යටතේ ලද ප්‍රතිපාදන මත නව පටක විද්‍යා හා ජලජ ක්ෂේත්‍ර විද්‍යාගාර 02 ක් සංවර්ධනය කරන ලද අතර නව භෞතික විද්‍යා විද්‍යාගාරය හා දේශන ශාලා 2017 වසරේදී ඉදි කරන ලදී. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා උදෙසා තවත් දෙමහල් ගොඩනැගිල්ලක් 2018 වසරේ දී ඉදි කළ අතර එම වසරේදී සෞඛ්‍ය ප්‍රවර්ධන හා පරිගණක යන නව උපාධි පාඨමාලා ආරම්භ කිරීම ද සිදුවිය. තවද රසායන විද්‍යා අධ්‍යනාංශය 2020 දී පීඨය සඳහා අලුතින් පහිටුවන ලදි. වර්ථමානයේදී පීඨය අධ්‍යනාංශ 5කින් සමන්විත වන අතර එමඟින් උපාධි වැඩසටහන් දහතුනක් පිරිනමයි.

ආ. ජයග්‍රහණයන්

- ව්‍යවහාරික විද්‍යා උපාධි අපේක්ෂකයින් සඳහා පර්යේෂණ සැසිය සංවිධානය කිරීම. (ASURS-2022)
- වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

පුහුණු වැඩසටහන්	ත්‍රිකුණාමලයේ කඩොලාන ක්ෂේත්‍ර නිරූපණය (තෙත්බිම් සංරක්ෂණය සහ කළමනාකරණය), දඹුල්ලේ (ජෛව විවිධත්ව සංරක්ෂණ සංකල්පය) සහ මිහින්තලේ පරිශ්‍රයේ (අපෘෂ්ඨවංශික විවිධත්වය)
වැඩමුළු	ජීව විද්‍යා අධ්‍යනාංශය විසින් මෙහෙයවනු ලබන තරුණ ජීව විද්‍යාඥයින්ගේ සංගමය මඟින් සංවිධානය කරන ලද උසස් පෙළ සිසුන් සඳහා වැඩමුළු.

- සංඛ්‍යානය විෂයක් ලෙස පිරිනැමීමට සනාතන සභාව සහ පාලක සභා අනුමැතිය ලබා දී ඇති අතර නව විෂය මාලාවේ නව විෂය කේතය සමඟ සංඛ්‍යානය විෂය හඳුන්වා දෙන ලදි.
- එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල සහ ඕස්ට්‍රේලියානු රජයේ විදේශ කටයුතු දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවයෙන් ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට පාදක ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රතිපත්ති ලේඛන සකස් කිරීම.
- කොරතුරු තාක්ෂණ විද්‍යාවේදී උපාධිය සහ තොරතුරු තාක්ෂණ සහ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩ සටහන් වල විෂයමාලා සංශෝධන කටයුතු අවසන් අදියරේ පවතී.
- පීඨය විසින් පිරිනමනු ලබන පශ්ඡාත් උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා වන අයදුම්පත, පශ්චාත් උපාධි ඒකකය පිහිටුවීම ඇතුළු සංශෝධිත නීති සමඟ 2022 දෙසැම්බර් මාසයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදි. ළමා ආරක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවේ සංශෝධිත විෂය මාලාව සඳහා අනුමැතිය ලබා ගැනීමේ කයටයුතු සිදුකෙරෙමින් පවතී.
- පීඨයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජික ආචාර්ය මනෝජ් ප්‍රනාන්දු, ශ්‍රී ලංකා ජ්‍යෙෂ්ඨ පීඨ සාමාජිකයන්ගේ ස්ථාවර කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කිරීම.
- කාර්මික ගණිත ශිෂ්‍ය සංගමය පිහිටුවන ලද අතර ඇපෙක්ස් කළමනාකරණ සේවා ආයතනය විසින් ''කාර්මික ඉංජිනේරු ක්ෂේත්‍රයේ වෘත්තීය අවස්ථා'' පිළිබඳ වැඩමුළුව 2022 ඔක්තෝබර් 29 පවත්වන ලදි.
- අරමුදල් රැස් කිරීමේ ක්‍රියාකාරකමක් ලෙස 2022 උපාධි ප්‍රදානෝත්සවයේදි ව්‍යාපාරික කුටියක් පැවැත්වීම.

- සෞඛ්‍ය ප්‍රවර්ධන සමාජය විසින් - 2022 ඔක්තෝම්බර් 11වන දින සංගමයේ අරමුදල රැස්කිරීම සහ විශ්වවිද්‍යාල සිසුන් අතර පරිසර හිත කාමී මිලදී ගැනීම් සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා භාණ්ඩ විකුණුම් වැඩසටහනක් සංවිධානය කිරීම සහ 2022 දෙසැම්බර් 16 වැනි දින සිසුන් සහ කාර්ය මණ්ඩලය අතර සහජීවනය වර්ධනය කිරීම සඳහා බහු සංස්කෘතිය කුසලතා දිරිමත් කිරීම සඳහා ''එක අහසක්යට'' වැඩසටහන පැවැත්වීම.
- පරිගණක අධ්‍යනාංශය විසින් පරිගණක සිසුන් අතර වඩා හොඳ පර්යේෂණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පරිගණක පර්යේෂණ මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදි.
- කොවිඩ් 19 වසංගත තත්වය පැවතුනද විකල්ප මාර්ගගත යාන්ත්‍රණ හරහා අධ්‍යයන සැසි සම්පූර්ණ කිරීමට පීඨය විසින් සමත් වී ඇත.
- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය ලෝක ආහාර වැඩසටහන සමඟ එක්ව මොණරාගල, මන්නාරම, මඩකලපුව, මාතලේ සහ මුලතිව් ප්‍රදේශවල ප්‍රජා සාමාජිකයින්ගේ පෝෂණය සහ තෝරාගත් පෝෂණය සම්බන්ධ අංශ වැඩිදියුණු කිරීම සඳහා ප්‍රජා මූලික සෞඛ්‍ය ප්‍රවර්ධන මැදිහත්වීමක ප්‍රතිලාභ ඇගයීමේ ව්‍යාපෘතියක් දියත් කරන ලදි. මෙම ව්‍යාපෘතිය 2020 ඔක්තෝබර් සිට 2022 මාර්තු දක්වා පවත්වන ලදි.
- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය මඟින් 2022 ජනවාරි සිට ජුනි දක්වා මාස හයක කාලයක් තුළ තොරාගත් ගම්මාන 25ක කාන්තා හා ළමා සංවර්ධන අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර නිලධාරින්ගේ දැණුම වැඩි කිරීම සඳහා ව්‍යාපෘතියක් පවත්වන ලද අතර එම ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් දක්වා තවත් මාස 6කට දීර්ඝ කරන ලදි.
- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය පවුල් සෞඛ්‍ය කාර්යාංශය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, දිස්ත්‍රික් සෞඛ්‍ය කණ්ඩායම්, ජාතික තරුණ සේවා සභාව සහ අනෙකුත් තරුණ කණ්ඩායම් ලෝක සෞඛ්‍ය සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල සමඟ එක්ව ''උතුරු මැද පළාතේ නව යොවුන් වියේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම - 2022-2023'' යන මැයෙන් ව්‍යාපෘතියක් පැවැත්වීඹ.
- ස්වීඩනයේ ගොන්බර්ග් විශ්වවිද්‍යාලයේ සහල්ග්‍රෙන්ස්කා ඇකඩමියේ මහජන සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති විද්‍යාවේදී ශිෂ්‍යාවක් වන ජෙලීනා ස්වර්ඩ්ලින් මහත්මිය 2022 නොවැම්බර් 2 සිට 2023 ජනවාරි 15 දක්වා සීමාවාසික පුහුණුව සම්පූර්ණ කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ලලිත් සේනාරත්න මහතා ඉරැස්මස් ප්ලස් යටතේ යුරෝපා සංගමය විසින් අරමුදල් සපයනු ලබන ''අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණුව හරහා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවල පාලනය, කළමනාකරණය සහ ප්‍රතිසංස්කරණ වැඩිදියුණු කිරීම'' ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක ලෙස වර්ෂ 2022 දී පත් කිරීඹ.

- **පවත්වන ලද පර්යේෂණ**
- ක්ෂුද්‍රජීව විද්‍යා ගෞරව උපාධි සිසුන් අට දෙනෙක්, ව්‍යවහාරික ජීව විද්‍යාව (විශේෂිත ක්ෂෙත්‍රය- ජෛව විවිධත්වය සහ සංරක්ෂණය) ගෞරව උපාධි සිසුන් තිදෙනෙක්, භෞතික විද්‍යා ක්ෂේත්‍රයේ ගෞරව උපාදි සිසුන් දෙදෙනෙක්, කාර්මික ගණිතය ගෞරව උපාධි සිසුන් දහතුන් දෙනෙක් සහ සාමාන්‍ය උපාධි සිසුන් විසි දෙදෙනෙක් පර්යේෂණ ව්‍යාපෘති පවත්වන ලදි.

- **ප්‍රකාශන**
- ජීව විද්‍යා අධ්‍යනාංශයේ පර්යේෂණ 48ක් ප්‍රකාශයට පත් කල අතර ඉන් 13ක් දේශීය ජර්නල සහ ක්‍රියා පටිපාටි වල ද ජාත්‍යන්තර ජර්නල ක්‍රියා පටි පාටිවල ද ප්‍රකාශයට පත් කරන ලදි (පර්යේෂකයන් SCIE සහ SCOPUS සුචිගත ජර්නල වල)
- ජීව විද්‍යා අධ්‍යනාංශය මගින් පොත් පරිච්ඡේද ප්‍රකාශයට පත් කරන ලද අතර ඉන් 02ක් දේශීය ප්‍රකාශකයන් සඳහා සහ 07ක් ජාත්‍යන්තර ප්‍රකාශකයන් සඳහා වේ.
- රසායන විද්‍යා අධ්‍යනාංශයේ පර්යේෂණ ලිපි 04ක් ප්‍රකාශයට පක් කරන ලදි.
- භෞතික විද්‍යා අධ්‍යනාංශය ජාත්‍යන්තර සහ දේශීය පර්යේෂණ සම්මන්ත්‍රණවල එක් සම්මන්ත්‍රණ ක්‍රියාදාමයක් සහ සාරාංශ 14ක් ප්‍රකාශයට පත් කරන ලදි. 2022 වර්ෂය සඳහා ප්‍රකාශන 17ක් භෞතික විද්‍යා අධ්‍යනාංශය විසින් සිදු කල අතර මේවා සූචිගත ජර්නල, විද්‍යුත් ජර්නල සහ අනෙකුත් ජර්නල වල ප්‍රකාශයට පත් කරන ලදි.
- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශයේ පර්යේෂණ ලිපි 08ක්, පර්යේෂණ සාරාංශ 11ක් සහ පොතක් ප්‍රකාශයට පත් කල අතර සිසුන විසින් සාරාංශ 17ක් ප්‍රකාශයට පත් කරන ලදි.
- පරිගණක අධ්‍යනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සිසුන් විසින් ප්‍රකාශන 06ක් ප්‍රකාශයට පත් කරන ලදි.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- රටේ පැවති ඉන්ධන අර්බුදය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ක්ෂේත්‍ර චාරිකා, පුහුණුවීම්, වැඩමුළු, කිහිපයක් සංවිධානය කර තිබුනද සාර්ථකව පැවැත් වුයේ කිහිපයක් පමණි. කෙසේ වෙතත් එම මගහැරුණු කටයුතු 2023 වර්ෂයේ සිදු කිරීමට සැලසුම් කර ඇත.
- කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සමහර භෞතික ක්‍රියාකාරකම් වසරේ මුල් භාගයේ දී සිදු කිරීමට නොහැකි විය. නමුත් අධ්‍යයන කටයුතු ඇතුළු සියලුම ක්‍රියාකාරකම් වසරේ දෙවන භාගයේදී භෞතිකව පවත්වන ලදි.
- අධ්‍යයන වාරයේ දින දර්ශනය හේතුවෙන් කාර්මික ගණිත සිසුන් සඳහා කාර්මික පුහුණු වැඩසටහන නිසි ලෙස සැලසුම් කිරීමට නොහැකි විය.
- අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සිසුන් පහසුකම් නොමැතිකම හේතුවෙන් පර්යේෂණ කටයුතුවල දී දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වූ අතර සමහර පර්යේෂණ නැවත සැලසුම් කිරීමට සිදු විය. (උදා - විශ්ලේෂණ ආදි....)
- ගණිතය සහ සංඛ්‍යානය යන විෂයන් සඳහා ආචාර්ය වරුන්ගේ හිඟය නිසා දේශන නිසි පරිදි පැවැත්වීමේදී ප්‍රශ්න ගණනාවකට මුහුණ දීමට සිදු විය.
- භෞතික විද්‍යා විෂය සඳහා ආචාර්ය වරුන්ගේ හිඟය නිසා කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කාල සටහන් කඩිනම් කිරීම හේතුවෙන් භෞතික විද්‍යාව විෂයමාලා සංශෝධනය සිදු කිරීමට නොහැකි විය.

ඇ. අනාගත දැක්ම

- උතුරු මැද පළාතේ උසස් පෙළ ගුරුවරුන්, ශිෂ්‍යයින් සහ ප්‍රදේශයේ ජනතාව සඳහා ධීවර සහ ජල ජීවී වගාව, ක්ෂුද්‍රජීව විද්‍යාව, උද්භිද විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව යන විවිධ විෂයන් පිළිබඳ වැඩමුළු, ක්ෂේත්‍ර චාරිකා සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- සිසුන් සඳහා පර්යේෂන සම්මන්ත්‍රණ අනෙකුත් විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් සංවිධානය කිරීම.
- පාඩම් සකස් කිරීම, වෙබ් අඩවි සංවර්ධනය, පර්යේෂණ කුසලතා සහ රසායනාගාර කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා රසායනාගාර ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණු / වැඩමුළු සංවිධානය කිරීම.
- කාර්මික ගණිතය සිසුන් සඳහා කාර්මික පුහුණුව සඳහා විධිමත් සැලැස්මක් සැකසීම සහ සාමාන්‍ය උපාධි හදාරන සිසුන්ටද කාර්මික පුහුණුවකට යොමු කිරීම.
- ව්‍යවහාරික ජීව විද්‍යා උපාධිය සහ ව්‍යවහාරික (ජීව) විද්‍යා ගෞරව උපාධි විෂයමාලා සංශෝධනය සම්පූර්ණ කිරීම.
- භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව පිළිබඳ ගෞරව උපාධි ඉලක්ක කර ගනිමින් භෞතික විද්‍යා විෂය මාලාව සංශෝධනය කිරීම.
- තොරතුරු තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධියේ විෂය මාලාව නවීකරන කටයුතු අවසන් කර ස්ථාපිත කිරීම.
- ගණිතය පිළිබඳ නව ගෞරව උපාධි වැඩසටහනක් සමඟින් ගණිතය සහ දත්ත විශ්ලේෂණ පිළිබඳ අධ්‍යනාංශ / ඒකක පිහිටුවීම
- තරුණ ජීව විද්‍යා සංගමයක් පිහිටුවීම.
- භෞතික විද්‍යා සංගමයක් පිහිටුවීම.
- අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම.
- පරිගණක විද්‍යා විෂය ධාරාව ආරම්භ කිරීම සඳහා නව විෂය මාලාව ක්‍රියාත්මක කිරීම.
- පාරිසරික විද්‍යාව පිළිබඳ නව ගෞරව උපාධි වැඩසටහනක් හඳුන්වා දීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීම.
- නව පශ්චාත් උපාධි වැඩසටහන් හඳුන්වා දීම.
- හරිත විශ්වවිද්‍යාල සංකල්පයට අනුව සූර්ය බලශක්ති පද්ධතිය ස්ථාපනය කිරීම.
- ආබාධිත සිසුන් සඳහා පහසුකම් සැලසීම, නව රසායන විද්‍යාගාරය ප්‍රතිසංස්කරනය කිරීම, වාහන නැවතුම් පොලෙහි සහ දේශන ශාලා සංකීර්ණයේ ඉතිරි කටයුතු සම්පූර්ණ කිරීම සහ සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශයේ දැනට පවතින ගොඩ නැගිල්ල විස්තාරනය කිරීම
- ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා ප්‍රාදේශීය ප්‍රජාව තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය අවධාරණය කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රජාවගේ ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ප්‍රතිපත්ති ලේඛන හඳුන්වා දීම තුළින් උපාධි අපේක්ෂකයින්ගේ සෞඛයය සහ යහපැවැත්ම සහතික කිරීම.

19. කළමනාකරණ අධ්‍යයන පීඨය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයිය කළමනාකරණ අධ්‍යයන පීඨය කළමනාකරණ අධ්‍යනය පිළිබඳව විශිෂ්ඨතම මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මකවේ. කළමනාකරණ අධ්‍යයන පීඨය මඟින් මූලික උපාධි පාඨමාලා මෙන්ම පශ්චාත් උපාධි පාඨමාලාද ක්‍රියාත්මක කෙරේ. වර්තමානයේදී කළමනාකරණ අධ්‍යයන පීඨය 4500 ඉක්මවූ සිසු ප්‍රජාවකින් සමන්විත වන අතර එහි සංයුතිය අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් 2000ක්, බාහිර උපාධි අපේක්ෂකයින් 2400ක් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින් 150ක් පමණ වේ. කළමනාකරණ අධ්‍යයන පීඨය අධ්‍යනාංශ හයකින් සමන්විත වන අතර ඒවා ගිණුම්කරණ හා මූල්‍ය අධ්‍යනාංශය, ව්‍යාපාර කළමනාකරණ අධ්‍යනාංශය, මානව සම්පත් කළමනාකරණ අධ්‍යනාංශය ව්‍යාපාර තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශය, අලෙවිකරණ කළමනාකරණ අධ්‍යනාංශය, සහ සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණ අධ්‍යනාංශය වේ. එම අධ්‍යනාංශ මඟින් පහත සඳහන් උපාධි පිරිනමනු ලැබේ.

- ගණකාධිකරණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- ව්‍යාපාර තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- සංචාරක හා හෝටල් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

තවද පීඨය විසින් කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධිය , ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති සහ ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි වැඩසටහන් ද පවත්වනු ලැබේ.

කළමනාකරණ අධ්‍යයන පීඨයේ මෙහෙය වනුයේ කළමනාකරණ අධ්‍යයනයට හා නායකත්වයට ප්‍රායෝගික කුසලතා සහිත ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සහ වෙනස් වන පරිසරය පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වන පර්යේක්ෂණ පැවැත්වීමයි.

පීඨයේ අරමුණු සහ අභිමතාර්ථ

- ව්‍යාපාර ව්‍යවසායන්ට සහය විය හැකි හා සංවර්ධනය කල හැකි ව්‍යාපාර හා කළමනාකරණය පිළිබඳ මනා අධ්‍යාපනයක් සහිත සිසුන් බිහි කිරීම.
- නැගී එන කර්මාන්ත/ව්‍යාපාරික ව්‍යවසායන් සඳහා අවශ්‍ය කුසලතා හා දැනුම ලබා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දීම සහ වේගයෙන් සංවර්ධනය වන ව්‍යාපාරික පරිසරය තුල වෘත්තීකයන් වීමට අවශ්‍ය හැකියාවන් ඔවුන්ට ලබා දීම.
- ව්‍යාපාරික ලෝකයේ ගැටළු හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ අනාගත වෘත්තීන් සංවර්ධනය කර ගැනීමට අත්‍යවශ්‍ය ප්‍රමානවත් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමක් ලබා දීම.
- සිසුන්ගේ නිශ්චිත අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල නිර්මානාත්මක චින්තනය, ගැටළු විසඳීම, සන්නිවේදනය සහ පර්යේක්ෂණ කුසලතා පිළිබඳ පුර්න හැකියාවන් ලබා ගැනීමට ශිෂ්‍යයින් දිරිමත් කිරීම.
- පහසුකම් ඇතිවිට උප විෂයන් කෙරෙහි හබා යෑම සඳහා සිසුන්ට වැඩි සහයෝගයක් ලබා දීම.

ආ. ජයග්‍රහණයන්

- කළමනාකරණ ආචාර්ය උපාධියේ පළමු කණ්ඩායම වශයෙන් අපේක්ෂකයින් 12දෙනෙකු බඳවා ගන්නා ලදි.
- කළමනාකරණය පිළිබඳ පළමු ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය සාර්ථකව පවත්වන ලදි.
- විශ්වවිද්‍යාලයේ පළමු පර්යේෂණ සම්මාන උළෙලේදී කළමනාකරණ පීඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු සම්මාන ලබා ගන්නා ලදි.
- කළමනාකරණ පීඨ ජර්නලයෙ හි වෙළුම් දෙකක් ප්‍රකාශයට පත් කිරීම.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මඟින් සංවිධානය කරන ලද අන්තර් විශ්වවිද්‍යාලයීය තරඟයක් වන"ඉමැනෙන්ට් මාර්කටර්" හි අනුශූරතාවය අලෙවි කළමනාකරන අධ්‍යනාංශය විසින් ලබාගන්නා ලදි.
- අලෙවිකරණ කළමනාකරණ අධ්‍යනාංශය විසින් "ද අයිඩියේෂන්," අන්තර් පීඨ කථික සම්මන්ත්‍රණය වර්ෂ 2022 දී සාර්ථකව සංවිධානය කරන ලදි.

- අලෙවි කළමනාකරණ අධ්‍යනාංශය විසින් රැඹෑව උක්කුලන්කුලම ප්‍රාථමික විද්‍යාලයේ පවත්වන ලද කසළ ශූන්‍ය කිරීම හා අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කළ ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලදි.
- අලෙවි කළමනාකරණ ශිෂ්‍යයින් අට දෙනෙක් තමන්ගේම ව්‍යාපාර ලියාපදිංචි කිරීම ආරම්භ කරනලදි.
- විවිධ විශ්වවිද්‍යාල වල ඡායාරූප ශිල්පීන්ගේ දක්ෂතා ප්‍රදර්ශනය කරන ලද "PICS M+," අන්තර් විශ්වවිද්‍යාල ජංගම ඡායාරූප තරඟය අලවි කළමනාකරණ අධ්‍යනාංශය විසින් සාර්ථකව සංවිධානය කරන ලදි.
- ආදර්ශ මුළුතැන් ගෙය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියට අවසන් කිරීම.
- 2019 කණ්ඩායම මඟින් සංවිධානය කරන ලද ''නැණ කිරුළු'' වැඩසටහන සාර්ථකව පවත්වන ලදි.
- ස්විඩන් ජාතික කළමනාකරණ ශිෂ්‍යයින් දෙදෙනෙකු ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු පීඨය තුලදි සම්පූර්ණ කරන ලදි.
- ඇඩ්වෙන්ටා හෝල්ඩින් පුද්ගලික සමාගම සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.
- වරලත් පුද්ගල කළමනාකරණ ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.
- හ්සෙනිඩ් ව්‍යාපාර විසඳුම් සමඟ අවබෝධතා ගිවිසු අත්සන් කිරීම.
- "වොලටීලියා2022".දක්ෂතා සංදර්ශන සාර්ථකව පවත්වන ලදි
- මානව සම්පත් කළමනාකරණ අධ්‍යනාංශයේ උපාධි අපේක්ෂකයින් සඳහා ''වොයිස් ඔෆ් එච් ආර්'' ඉංග්‍රීසි සමාජය ආරම්භ කරන ලදි
- ''ඇල්ෆා 2022"අන්තර් විශ්වවිද්‍යාල සිද්ධි අධ්‍යයන තරඟය පැවැත්වීම.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ යුරෝපා සංගමය විසින් ''හරිත අපේක්ෂා'' නමින් සංවිධානය කරන ලද 2022 සම්මාන උළෙලෙහි මහජන පෝස්ටර් නිර්මාණ තරඟයේ ජයග්‍රාහකයා ලෙසත් ජංගම යෙදුම් සැලසුම් සන්දර්භයෙහි අනුශූරතාවයත් තොරතුරු තාක්ෂන අධ්‍යනාංශයේ සිසුන් පිරිසක් විසින් හිමිකර ගන්නා ලදි
- වර්ෂ 2022 දී පහත දක්වන සඟරා ප්‍රකාශයට පත් කරන ලදි
  - ව්‍යාපාර තොරතුරු (BITSA) - වෙළුම 5, දෙවන නිකුතුව
  - ව්‍යාපාර තොරතුරු වංශකතාව - වෙළුම 3, පළමු නිකුතුව
  - උරුමය 2022 - වෙළුම 5, දෙවන නිකුතුව
- ව්‍යාපාර තොරතුරු තාක්ෂණ ශිෂ්‍ය සංගමය විසින් ''තෙමගුලක සේයා'' නමින් ඡායාරූප තරඟයක් පවත්වන ලදි.
- ''පික්ස්අයි හතරවන අනුවාදය'' අන්තර් පීඨ නිර්මාණ තරඟාවලිය සාර්ථකව පවත්වන ලදි.
- ''බිට්කෝඩ් තුන්වන අනුවාදය'' අන්තර් විශ්වවිද්‍යාල කේතකරණ තරඟය සාර්ථකව පවත්වන ලද අතර බිට්කෝඩ් තෙවන අනුවාදයෙහි අවසාන් තරඟය 2022 ජනවාරි 27වන දින පවත්වන ලදි.
- ව්‍යාපාර කළමනාකරණ අධ්‍යනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මගපෙන්වීම යටතේ සිසුන් විසින් ප්‍රජා පාදක ව්‍යාපෘති 22ක් සාර්ථකව පවත්වන ලදි.
- ''ක්විස් ෆිඑස්ටා 2022'' අන්තර් අධ්‍යනාංශ ප්‍රශ්නාවලිය සාර්ථකව පවත්වන ලදි.
- ''ඕරා 2022'' සිසුන්ගේ සංගීත වැඩසටහන පවත්වන ලදි.
- මිහින්තලය නගරය අවට පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.
- '' ගිණුම්කරණයට අත්වැළක්'' මැයෙන් දිවයින පුරා උසස්පෙළ සිසුන් හා ගුරුවරුන් කේන්ද්‍ර කර ගනිමින් සම්මන්ත්‍රණ මාලා පැවැත්වීම.
- කැලණිය විශ්වවිද්‍යාලයේ ගිණුම් අධ්‍යන අංශය මඟින් පවත්වන ලද අන්තර් විශ්වවිද්‍යාල ප්‍රශ්න විචාරාත්මක තරඟයේ තෙවන ස්ථානය ලබා ගැනීම.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- ආදර්ශ මුළුතැන් ගෙය පුළුල් කිරීමේ ඉදිකිරීම් කටයුතු 2022 දෙසැම්බර් මාසයේ දී නිම කිරීමට සැලසුම් කර තිබූ නමුත් ආර්ථික අර්බුදයේ බලපෑම් හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු වර්ෂ 2023 දක්වා ගෙන යාමට සිදු විය.
- මූල්‍යමය සීමා කිරීම් සහ නේවාසිකාගාර පහසුකම් නොමැතිවීම ඇතුළු අභ්‍යන්තර බාධාවන් හේතුවෙන් සිසුන් සඳහා සැලසුම් ගරන ලද වැඩසටහන් කිහිපයක් සහ විෂය බාහිර ක්‍රියාකාරකම් පැවැත්වීමට නොහැකි වීම.
- මූල්‍ය සම්පත් සීමා කිරීම හේතුවෙන් සැලසුමු කරන ලද ක්‍රියාකාරකම් කිහිපයක් කල් දමන ලදි.

ඈ. අනාගත දැක්ම

- පහත සඳහන් සංවිධාන සමඟ අවබෝදතා ගිවිසුම් සංවර්ධනය කිරීම.
    - අ. සදාහරිත සමාගම් සමූහය
    - ආ. ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස්
    - ඇ. වයඹ භාෂා හා වෘත්තීය නිපුණතා සංවර්ධන කාර්යාංශය
- ''පික්ස්අයි'' පස්වන අනුවාදය, ''බිට්කෝඩ්'' හතරවන අනුවාදය ''රුයිස් - පී'' තුන්වන අනුවාදය පැවැත්වීම.
- පහත සඳහන් සංවිධාන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.
    - අ. මානව සම්පත් වාත්තිකයන්ගේ සංගමය
    - ආ. බ්‍රැන්ඩික්ස් ඇඟලුම් විසඳුම්
    - ඇ. සීමාසහිත සිලෝන් බිස්කට්
    - ඈ. එම්. ඒ. එස්. පුද්ගලික සමාගම
- ගිණුම්කරණ අධ්‍යනාංශය මඟින් ''ඇක්ෆින්'' සඟරාවේ පළමු කාලාපය ප්‍රකාශයට පත් කිරීම.
- අධ්‍යනාංශයේ ශිෂ්‍ය සංගමයේ වාර්ෂික ආයතනික සමාජ වගකීමේ ව්‍යාපෘතියක් ලෙස ''මතක'' වැඩසටහන අඛණ්ඩව දෙවන වරටත් පැවැත්වීම.
- පහත සඳහන් විශ්වවිද්‍යාල සහ ආයතන සමඟ ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය කිරීම.
    - අ. බංගලාදේශයේ ඩකා නුවර ආසියා පැසිෆික් විශ්වවිද්‍යාලය.
    - ආ. නෙදර්ලන්තයේ බ්‍රෙඩා විශ්වවිද්‍යාලය
    - ඇ ඉංදියාවේ පූනේ අජින්ක්‍යා ඩයි පාටිල් විශ්වවිද්‍යාලය
- වගකීම් සහගත පරිභෝජන සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ පවතින ප්‍රතිපත්ති සංශෝධනය කිරීම සහ නව ප්‍රතිපත්ති හඳුන්වාදීම.

20. වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය වර්ෂ 2006 ජූලි මාසයේදී ස්ථාපනය කරන ලද අතර එය අධ්‍යනාංශ 15කින් සහ අධ්‍යයන ඒකක 3කින් සමන්විත විය. ශ්‍රී ලංකාවේ තෙවැනියට විශාලතම රෝහල වන අනුරාධපුර ශික්ෂණ රෝහල පීඨයේ ප්‍රධානතම ශික්ෂණ රෝහලවේ. නවීන රෝග විනිශ්චය සහ කළමනාකරණ පහසුකම් වලින් සමන්විත ප්‍රධාන සායන අංශය වන විශ්වවිද්‍යාලයීය මහාචාර්ය ඒකකය අනුරාධපුර ශික්ෂණ රෝහල තුල පිහිටා ඇත. සියළුම සායනික අධ්‍යනාංශ වල අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් අනුරාධපුර ශික්ෂණ රෝහලේ නිර්චේතනික උපදේශකයින් ලෙස සේවාවන් සපයයි. ප්‍රජා කටයුතු සිදු කෙරෙන ප්‍රදේශය, සමාජ-ආර්ථික වශයෙන් විවිධ වූ ජනගහනයකින් සමන්විත බැවින් ප්‍රාථමික හා වැළැක්වීමේ ප්‍රතිකාර පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා ගැනීමට ඉඩකඩ සැලසේ.

වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය විසින් සපයනු ලබන ප්‍රජා සත්කාර සේවාවන් අතර මානසික ආබාධිත ළමුන් සඳහා වනසේවාවන්, බාහිර සායන, සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සහ මාතෘ හා ළදරු සත්කාර සේවා විශේෂයෙන්ම ළමා මන්දපෝෂනය වැළැක්වීම සහ මාතෘ රෝගාබාධ පිළිබඳ පුළුල්ව සොයා බැලීම ප්‍රධාන තැනක් ගනු ලැබේ. සිසුන්හට ඔවුන්ගේ උපරිම හැකියාවන් කරා ළඟා වීමට මඟ පාදමින් ආයතනයේ ප්‍රමිතීන් ඉහළ නැංවීමට පීඨය අඛණ්ඩව උත්සාහ කරයි. පීඨයේ කෙටි කාලින ඉතිහාසය පුරාවටම අපගේ උපාධි අපේක්ෂකයින් පොදු විශිෂ්ඨතා ශ්‍රේණිගත කිරීමේ දී ඉදිරියෙන් සිටින අතරම විවිධ පශ්චාත් උපාධි පාඨමාලාවලද ඉහල දස්කම් දක්වා ඇත.

ආ. ජයග්‍රහණයන්

නව අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම

- වෛද්‍ය එල්. එස්. විජයරත්න - කථිකාචාර්ය ආධුනික, භෞතවේදීය අධ්‍යනාංශය
- වෛදය එම්. අයි. එම්. සුජා - කථිකාචාර්ය ආධුනික, භෞතවේදීය අධ්‍යනාංශය
- වෛද්‍ය ජී. අයි. ජී. ගලප්පති - කථිකාචාර්ය ආධුනික, ළමාරෝග අධ්‍යනාංශය
- වෛද්‍ය ඩබ්. ඩබ්. එස්. ඩී. මෙන්ඩිස් - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (පැවරුම් පදනම), ළමාරෝග අධ්‍යනාංශය
- වෛද්‍ය එම්. ඩබ්. ඩබ්. අරබේපොල - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (පැවරුම් පදනම), ළමාරෝග අධ්‍යනාංශය

➢ අධ්‍යන කාර්ය මණ්ඩල උසස්වීම්

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය

- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. බී. අගම්පොඩි - ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පළමු ශ්‍රේණිය

- වෛද්‍ය එස්. එම්. ඒ. ජයවර්ධන - කායචිඡේදන අධ්‍යනාංශය
- වෛද්‍ය ආර්. එම්. එස්. අයි. කේ. - ජෛවරසායන අධ්‍යනාංශය
- වෛද්‍ය එච්. ටී. ඩබ්. විරකෝන් - ජෛවරසායන අධ්‍යනාංශය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දෙවන ශ්‍රේණිය

- වෛද්‍ය ජේ. එම්. ඩී. ඩී. ජයසුන්දර - ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යනාංශය
- වෛද්‍ය ආර්.එම්.එස්.අයි.රාජපක්ෂ - භෞතවේදීය අධ්‍යනාංශය

➢ අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් පශ්චාත් උපාධිය පාඨමාලා සම්පූර්ණ කිරීම

ආචාර්ය උපාධි

දර්ශනපති පර්යේෂණ

- වෛද්‍ය ජී. එස්. අමරසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය
- වෛද්‍ය කේ. අයි. එස්. කෝරළේගෙදර, කථිකාචාර්ය ආධුනික, ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය
- වෛද්‍ය එච්.ඊ.සි.එස්.කුමාර, ආධුනික කථිකාචාර්ය, භෞතවේදීය අධ්‍යනාංශය
- වෛද්‍ය ආර්.එම්.එස්.අයි. රාජපක්ෂ, ආධුනික කථිකාචාර්ය, භෞතවේදීය අධ්‍යනාංශය

➢ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ප්‍රතිතන ඒකකය විසින් ප්‍රතිතන සමාලෝචනය සිදු කරන ලද අතර ඉදිරි වසර

පහ සඳහා වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය ප්‍රතීතනය කර ඇත.

(අ) පර්යේෂණ. නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

විෂය	ප්‍රකාශන සංඛ්‍යාව
අ. පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව (සම්පූර්ණ පත්‍රිකා)	82
ආ. පොත් සංඛ්‍යාව	01
ඇ. ජර්නල ලිපි සංඛ්‍යාව	22

(ආ) සම්මන්ත්‍රණ වැඩමුළු සහ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ පිළිබඳ විස්තර

විෂය	සැලසුම් කරන ලද	පවත්වන ලද
අ. පශ්චාත් උපාධි වැඩසටහන සම්බන්ධව	1	1
ආ . මූලික උපාධි වැඩසටහන සම්බන්ධව	1	1

(ඇ) ලැබුණු සම්මාන පිළිබඳ විස්තර

විෂය	සම්මාන සංඛ්‍යාව	අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් ලබාගන්නා ලද
අ. දේශීය සම්මාන	13	6
ආ. ජාත්‍යන්තර සම්මාන	1	1

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- සුදුසුකම් ලත් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීම ප්‍රධාන අභියෝගයක් ලෙස පවතී. වසරතුල දෙවතාවක් දැන්වීම් පළ කළත් අපට අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීමට නොහැකි විය. වෛද්‍යවරුන් හට සෞඛ්‍ය අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල මඟින් සපයන පහසුකම්වල ඇති කැපපෙනෙන වෙනස සහ ශ්‍රී ලංකා රජරට විශ්වවිදයාලයීය වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය ස්ථාපිත ස්ථානය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීමට ඇති ප්‍රධාන බාධක ලෙස හැඳින්විය හැක.
- පර්යේෂණ ප්‍රතිදානය ප්‍රශංසනීය වුවත් විශ්වවිද්‍යාලයෙන් ලැබෙන මුල්‍ය අනුග්‍රහයේ හිඟකම, ප්‍රමාණවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නොමැතිකමින් සිටින අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් ඉගැන්වීමේ කටයුතු සමඟ කාර්ය බහුල වීම සහ දක්ෂ තාක්ෂණික කාර්ය මණ්ඩලයක් සහ කළමණාකාර සහායකයින් නොමැතිකම නිසා අපගේ උපරිම හැකියාවන් කරා ළඟා වීමට නොහැකි විය.
- සිසුන් බඳවා ගැනීම වැඩි කළද යටිතල පහසුකම් හා භෞතික සම්පත් සමානුපාතිකව සංවර්ධනය නොවීම නිසා පීඨය දැඩි ලෙසෙ භෞතික සම්පත් හිඟයකට මුහුන දී තිබේ.

ඈ. අනාගත දැක්ම

- පූර්ව සායනික ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සම්පූර්ණ කිරීම
- නේවාසිකාගාර දෙකක් සඳහා මලාපවහන පවිත්‍රාගාර ස්ථාපිත කිරීම
- හරිත විශ්වවිද්‍යාල සංකල්පය ක්‍රියාත්මක කිරීම.
- පීඨයේ ශිෂ්‍ය ආපන ශාලාව, පරිපාලන ගොඩනැගිල්ල සහ අනධ්‍යන කාර්ය මණ්ඩල නිල නිවාසවල වහලය ප්‍රතිසංස්කරණය කිරීම.
- පාවිච්චි කළ නොහැකි තත්වයේ ඇති කුඩා දේශන ශාලා අලුත්වැඩියා කිරීම.
- පවුල් පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම.
- පීඨ කාර්ය මණ්ඩලය සඳහා රථගාලක් ඉදි කිරීම.
- පීඨ පරිශ්‍රය භූමි අලංකරණය කිරීම.
- පීඨ නේවාසිකාගාරය සඳහා පීව වැටක් ඉදිකිරීම.
- පෙනහළු ක්‍රියාකාරකම් සම්බන්ධ විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම සහ එහි සේවාවන් ප්‍රජාවට සපයා දීම.
- මානව ජාන ඒකකය පිහිටුවීම
- ක්ෂුද්‍රජීව අධ්‍යනාංශය සඳහා රසායනාගාර ක්‍රියා පටිපාටිවල විඩියෝ සහිත අතථ්‍ය රසායනාගාරයක් පිහිටුවීම.
- වත්මන් ගෝලීය අර්බුදය විසඳීම සඳහා පීඨ ආදී සිසුන් හා විදේශීය පීඨ සමඟ පවත්වන අධ්‍යයන හා පර්යේෂණ සම්බන්ධ සබඳතා පවත්වාගෙන යාමට හා නව සබඳතා ඇති කිරීමට විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර සබඳතා ඒකකය හරහා ජාත්‍යන්තර සබඳතා කේන්ද්‍රස්ථානයක් පිහිටුවීම.

21. සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය

අ. හැඳින්වීම

1995 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ ආරම්භයක් සමඟම සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය ස්ථාපිත කිරීම සිදුවිය. වර්තමාන පීඨ ශිෂ්‍ය සංඛ්‍යාව 1795 ක් වන අතර 2022 වසරේ දී නවක සිසුන් 483 ක් පීඨයට ඇතුළත් කරගන්නා ලදී. පීඨය අධ්‍යයනාංශ 07 කින් සමන්විත වන අතර ශාස්ත්‍රවේදී හා ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි ප්‍රදානය කරනු ලබයි.

අධ්‍යයනාංශය	උපාධි පාඨමාලාව
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය	පුරාවිද්‍යා හා උරුම කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය
ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය	-
පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය	පරිසර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය
මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය	ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී මානව ශාස්ත්‍ර ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය සිංහල හා සමාජ ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය
භාෂා අධ්‍යයනාංශය	සිංහල පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය
සමාජ විද්‍යා අධ්‍යයනාංශය	සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය	ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය

මෙම උපාධි පාඨමාලා තුළින් උපාධිධාරීන් පහත ප්‍රතිඵල ලඟා කරගනු ඇත.

I. දේශීය හා ජාත්‍යන්තර සමාජ හා සංස්කෘතික හැකියාවන් මනාව හඳුනාගැනීමට හා ප්‍රශස්ත දැනුමක් ලබාගැනීමට හා අවශ්‍යතාවයට සරිලන පරිදි ඒවා වැඩිදියුණු කිරීමට හා වෙනස් කිරීමට කුසලතාවය හා ආත්ම විශ්වාසය වර්ධනය කරගැනීම.

II. ඔවුන්ගේ භෞතික හා ආත්මීය අවශ්‍යතා අතර ආවේණික අන්තර් සම්බන්ධතාවය පිළිබඳව සංජානනය වැඩිදියුණු කළ හැකි හා පුළුල් කළ හැකි සමතුලිත අධ්‍යාපනයක් හිමි කරගැනීම.

ආ. ජයග්‍රහණයන්

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය

- පහත සඳහන් කැනීම් සිදු කරන ලදි.
    - මෙගාතලික් සොහොන් කැණීම (අදියර 04) - ජනකපුර, මුලතිව්
    - ස්තූප සහ රූප මන්දිර කැණීම් - ආලෝක පබ්බත විහාරය, කඩහත, රඹෑව
- යෝධවැව කැණීම - පහළ මල්වතු ඔය පුරාවිද්‍යා ද්‍රෝනිය.
- උපාධි අපේක්ෂකයින්ගේ 07වන පර්යේෂණ සම්මන්ත්‍රණය සාර්ථකව නිම කරන ලදි.
- ශ්‍රී ලංකාවේ ප්‍රොටෝ ඉතිහාසය පිළිබඳ මාර්ගගත ශාස්ත්‍රීය සංසදයක් සංවිධානය කිරීම.
- උරුම කළමනාකරණ සහ සංචාරක කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය /ගෞරව) උපාධි පාඨමාලාවට අදාලව අවශ්‍යතා ඇගයීම/පාර්ශවකරුවන් සමීක්ෂණය සාර්ථකව සිදු කර ඇත.
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව/ශාස්ත්‍රපති විද්‍යාවේදි/ශාස්ත්‍රපති කලා/දර්ශනපති/ආචාර්ය සහ උරුම කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති ආරම්භ කිරීම.
- පුරාවිද්‍යා/උරුමය සහ සංචාරක/පෞරාණික වාරිමාර්ග පද්ධතිය සහ සංස්කෘතිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම.
- උතුරු මැද සහ පර්යන්ත ප්‍රදේශයේ පැරණි ග්‍රාමීය වැව පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදී.
- අධ්‍යනාංශ ජර්නලය සහ පොත එළිදැක්වීම සාර්ථකව සිදු කරන ලදි.
- ග ''උරුමය සිහිපත් කිරීම'' පිළිබඳ දේශන මාලාව වසර පුරා සාර්ථකව පවත්වන ලදි.
- "Archaeo-theatre" චිත්‍රපටි මාලාව වසර පුරා සාර්ථකව පවත්වන ලදි.

පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය

- වසර පුරා වෙබිනර් දේශන මාලාවන් සහ ආරාධිත දේශන පවත්වන ලදි.
- උපාධි අපේක්ෂකයින් සඳහා පර්යේෂණ සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම.
- ඡායාරූප කරණය, කලා, නිර්මාණාත්මක ලේඛන සහ කෙටි චිත්‍රපට වැඩ සටහන් සංවිධානය කිරීම.

- ශිෂ්‍යයින්ගේ කාර්මික පුහුණුව සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.
- ප්‍රජා සේවය සඳහා සිසුන්ගේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.
- නිවර්තන පරිසරය පිළිබඳ ජර්නලය ප්‍රකාශයට පත් කිරීම.
- විද්‍යාගරය නවීන ස්මාට් දේශන ශාලාවක් ලෙස සකස්කිරීම.
- ශිෂ්‍යයින්ගේ මෘදු කුසලතා සංවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම.
- ශිෂ්‍යයින්ගේ ප්‍රකාශන එළිදැක්වීම.
- ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම.
- දේශීය හා විදේශීය ආයතන සමඟ සහයෝගී පර්යේෂණ සාර්ථකව සිදු කිරීම.
- මාර්ගගත පාඨමාලාවක් ලෙස පාරිසරික කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හඳුන්වා දීම.

මානවශාස්ත්‍ර අධ්‍යනාංශය

- අධ්‍යන පොදු සහතිකපත්‍ර සාමාන්‍යපෙළ පාසල් ශිෂ්‍යයින් සඳහා වැඩමුළුවක් සාර්ථකව පවත්වන ලදි. (මේ සඳහා ශිෂ්‍යයින් 300ක් පමණ සහභාගි වූ අතර සැසි 10ක් දින 05ක් තුල පවත්වන ලදි)
- ''ශීක්ෂා'' ජර්නලය එළිදැක්වීම.
- අධ්‍යන පොදු සහතිකපත්‍ර සාමාන්‍යපෙළ පාසල් සිසුන් සඳහා සම්මන්ත්‍රණ මාලාවක් සාර්ථකව පවත්වන ලදි.
- ඉතිහාසය සහ ජන සන්නිවේදනය පිළිබඳ ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටනක් සාරථකව පවත්වන ලදි.
- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සමඟ ශිෂ්‍යයින් 20නෙකු සම්බන්ධ වී ''සරසවි රේස් වලල්ල'' නමින් මාසික ගුවන්විදුලි වැඩසටහන් මාලාව ක්‍රියතේමක කිරීම.
- මානවශාස්ත්‍ර අධ්‍යන පිළිබඳ ජර්නලයක් ප්‍රකාශයට පත් කිරීම.
- ''තිනේත්‍රා'' වැඩමුළුව සහ කෙටි චිත්‍රපට තරගාවලිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි. (වැඩමුළු/සම්මාන/මුදල් ත්‍යාග යානදිය)
- පාසල් ප්‍රජා වැඩසටහන් ලෙස විවිධ ක්‍රියාකාරකම් පැවැත්වීම
    - එළිමහන් වැඩසටහන්
    - සම්මන්ත්‍රණ සැසි (සා.පෙළ, උසස් පෙළ. වසර අවසානයේ)
    - වැඩමුළු
- වාර්ෂික ආරාධිත දේශන මාලාවක් සංවිධානය කිරීම.
- ඓතිහාසික අධ්‍යයන ශිෂ්‍ය ජර්නලය ප්‍රකාශයට පත් කිරීම.
- අධ්‍යාපන විද්‍යාව සඳහා ජාතික සංසදයක් සංවිධානය කිරීම.

භාෂා අධ්‍යනාංශය

- අධ්‍යනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සමඟ නව පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- සිංහල භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි, වැඩ සටහන් ආරම්භ කිරීම.
- සුබසාධක සංගමයක් ස්ථාපනය.
- ජපන් භාෂා විදයාගාරයක් පිහිටවීම.
- රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සමාගම්, සංවිධාන සහ ව්‍යාපාර සමඟ අධ්‍යාපනික සහ කාර්මික හවුල්කාරිත්වයක් සහ සහයෝගිතාවයක් ඇති කිරීම.
- සිංහල සහ ප්‍රංශ සිසුන් සඳහා අධ්‍යයන ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම.
- ඉංග්‍රීසි, ජපන්, හින්දි සහ චීන භාෂා සඳහා බාහිර සහතික පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- සිංහල භාෂාව පිළිබඳ් කෙටි බාහිර පාඨමාලාවන් හදුන්වා දීම.
- වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළුවක් පැවැත්වීම.
- භාෂාව සහ සාහිත්‍යය පිළිබඳ පර්යේෂණ සමුළුවක් සංවිධානය කිරීම.
- අධ්‍යනාංශයේ භාෂාව සහ සාහිත්‍ය පිළිබඳ විද්‍යුත් ජර්නලයක් දෙවන සහ තෙවන සංස්කරණය ප්‍රකාශයට පත් කිරීම.
- භාෂා අධ්‍යනාංශය මගින් වර්ෂය පුරාම සංස්කෘතික හා සාහිත්‍ය උත්සව සංවිධානය කරන ලදි.
- පාසල් පුස්තකාල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.

- භාෂා අධ්‍යනාංශයේ සිසුන් සඳහා වාර්ෂික ශිෂ්‍යත්ව වැඩසටහනක් ආරම්භ කිරීම.

සමාජවිද්‍යා අධ්‍යනාංශය

- අපරාධ විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සහ අපරාධ විද්‍යාව සහ අපරාධ නීතිය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කරන ලදි.
- ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි වැඩසටහන සඳහා විෂය මාලාව සකස් කිරීම. (සමාජ විදයාව/සංචාරක ව්‍යාපාරය/තොරතුරු තාක්ෂණය)
- බහුවිධ පර්යේෂණ ව්‍යාපෘතිය මෙහෙයවීම.
- සමාජවිද්‍යා අධ්‍යනාංශයේ උපාධි පර්යේෂකයන්ගේ පර්යේෂණ සම්මන්ත්‍රණය සාර්ථකව පැවැත්වීම.
- සමාජවිද්‍යා පිළිබඳ රජරට ජර්නලය ප්‍රකාශයට පත් කිරීම.
- සමාජවිද්‍යා පිළිබඳ ආරාධිත දේශන මාලාවක් සාර්ථකව පැවැත්වීම.

තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශය

- තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශය පිහිටුවීම.
- පරිගණක 60කින් සමන්විත නව තොරතුරු තාක්ෂණ විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම.
- පීඨයේ සියලුම සිසුන් සඳහා ආරාධිත දේශන මාලාව සාර්ථකව පැවැත්වීම.
- ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි වැඩසටහන සඳහා තොරතුරු තාක්ෂණ විෂය මාලාව සකස් කිරීම.

➢ සමාජවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ පවතින වසංගත තත්ත්වයන් සහ නේවාසිකාගාර පහසුකම් නොමැතිවීම හේතුවෙන් සියළුම අධ්‍යනාංශ වල බොහෝ දේශන මාලාවන් ඉගෙනුම් කළමනාකරණ පද්ධති පහසුකම් සහ සූම් තාක්ෂනය වැනි දුරස්ථ ඉගෙනුම් ක්‍රම මඟින් පවත්වන ලදි. තවද 2022දී ශාස්ත්‍රවේදී ගෞරව උපාධි වැඩසටහන සහ ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහන් අධ්‍යන වාර දෙකක් භෞතිකව හා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සාර්ථකව සම්පූර්ණ කරන ලදි.

ඇ. අසමර්ථයන් හා නිර්දෝශීභාවය

- රට තුළ පැවති අඛණ්ඩ වසංගත තත්ත්වය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් 2022 වර්ෂයේදී පහත ක්‍රියාකාරකම් සිදු කිරීමට නොහැකි විය.
    - පරිසර කළමනාකරණ අධ්‍යනාංශයේ වාර්ෂික රුක් රෝපණ ව්‍යාපෘතිය සහ ඩ්‍රෝන් පුහුනු වැඩමුළුව පැවැත්වීම.
    - පුරාවිද්‍යා සහ උරුම කළමනාකරණ අධ්‍යනාංශයේ පවත්වාගෙන යන පුර්ව නූතන ශ්‍රී ලංකාවේ මැටි භාණ්ඩ තාක්ෂණය සහ ගල් මෙවලම් තාක්ෂණය පිළිබඳ එක්දින වැඩමුළුව පැවැත්වීම.
- උපාධි අපේක්ෂකයන්ගේ ''සමාජ සංකතන'' සමාජ විද්‍යා ජර්නලය ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.
- රසායනාගාර සංවර්ධන ව්‍යාපෘතිය සිදු කෙරෙමින් පවති. - වායු ජල, සහ පාංශු පරීක්ෂණ උපකරණ

ඈ. අනාගත දැක්ම

පරිසර කළමනාකරණ අධ්‍යනාංශය

- පාරිසරික කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සඳහා සිසු කණ්ඩායම බඳවා ගැනීම.
- තිරසාර සංවර්ධන ඉලක්ක අවධාරණය කිරීම සඳහා අධ්‍යයන වැඩසටහන් (සහතිකය,ඩිප්ලෝමාව) පුළුල් කිරීම
- භූගෝලීය තොරතුරු පද්ධතිය සහ දුරස්ථ සංවේදනය පිළිබඳ කෙටි පාඨමාලාවක අන්තර්ගතය සකස් කිරීම.
- පාරිසරික අර්බුද සහ දේශගුණික ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා වැඩමුළු සහ ප්‍රවේශ වැඩසටහන් සංඛ්‍යාව වැඩි කිරීම.
- පශ්චාත් උපාධි විෂය මාලාව සකස් කිරීම.

ආර්ථිකවිද්‍යා අධ්‍යනාංශය

- සංවර්ධන අධ්‍යනය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන ආරම්භ කිරීම.
- ආර්ථික සමාලෝචනය පිළිබඳ රජරට ජර්නලය ප්‍රකාශයට පත් කිරීම.[1] - වෙළුම 2 :නිකුතුව 1*
- අලුතින් ස්ථාපනය කරන ලද සංඛ්‍යාන මෘදුකාංගය භාවිතා කර අනෙකුත් උපාධි වැඩසටහන් වල ශිෂ්‍යයින් සඳහා පර්යේෂණ ක්‍රමවේදය සහ දත්ත විශ්ලේෂණය පිළිබඳ දෙදින වැඩමුළුවක් පැවැත්වීම

භාෂා අධ්‍යනාංශය

- භාෂා සහ සාහිත්‍යය පිළිබඳ පර්යේෂණ සමුළුවක් සංවිධානය කිරීම.
- ''දියකැට පහණ''
- භාෂා අධ්‍යනාංශයේ භාවිතය සඳහා කුඩා පුස්තකාලයක් ස්ථාපනය කිරීම.

22. තාක්ෂණ පීඨය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සය වන පීඨය ලෙස තාක්ෂණ පීඨය වර්ෂ 2017 සැප්තැම්බර් මස 14 දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලදී. විශ්වවිද්‍යාලයේ පැවති සමස්ත අධ්‍යයන ව්‍යුහය පුළුල් කිරීමේ අරමුණින්, තාක්ෂණ පීඨයේ මූලාරම්භය 2015 ජනවාරි මාසයේ දී ව්‍යවහාරික විද්‍යාපීඨය තුළදී සිදුවිය.. මෙම මුල පිරීම මඟින් අපේක්ෂා කරන ලද්දේ ප්‍රමාණවත් නොවන අයුරින් ව්‍යාප්ත වී ඇති අධ්‍යයන ව්‍යුහය ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාලවල ප්‍රමාණයට හා විෂය පථයට සමගාමීව වැඩිදියුණු කිරීමයි.

තාක්ෂණ පීඨය, ජෛව ක්‍රියාවලි තාක්ෂණය, විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික තාක්ෂණය, ආහාර තාක්ෂණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා ද්‍රව්‍ය තාක්ෂණය යන අධ්‍යයනාංශ 05 කින් සමන්විත වන අතර ඒ එක් එක් අධ්‍යයනාංශය මඟින් උපාධි පාඨමාලා ප්‍රදානය කරනු ලබයි. ශ්‍රී ලංකා තත්ව රාමුව (SLQF) 04 ආකෘතියට සැකසුණු එම සෑම උපාධි පාඨමාලාවක්ම වසර 04 ක් පුරා විහිදේ. අ.පොස (උ.පෙළ) විභාගය තාක්ෂණ විෂය ධාරාවෙන් හදාරා විශ්වවිද්‍යාල සුදුසුකම් ලබන සිසුන් තාක්ෂණ පීඨය සඳහා බඳවාගන්නා අතර පළමු වසර සඳහා ඔවුන් ජෛව පද්ධති තාක්ෂණය, ඉංජිනේරු තාක්ෂණය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. ජෛව පද්ධති තාක්ෂණය හා ඉංජිනේරු තාක්ෂණය පළමු අධ්‍යයන වර්ෂය තුළදී හදාරන සිසුන් දෙවන අධ්‍යයන වර්ෂයේදී ජෛව සැකසුම් තාක්ෂණය, ආහාර තාක්ෂණය, විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික තාක්ෂණය, ද්‍රව්‍ය තාක්ෂණය යන අධ්‍යනාංශ සඳහා සිසුන්ගේ කැමැත්ත, ඔවුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය, පවතින සම්පත් හා රැකියා වෙළඳපොළෙහි ඉල්ලුම මත වර්ග කරනු ලැබේ.

දැනට ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියෙහි ඇති අනෙකුත් උපාධි පාඨමාලා හා සන්සන්දනය කිරීමේ දී තාක්ෂණ උපාධි පාඨමාලා වඩාත් ව්‍යක්තීමය වන අතර සිසුන්ගේ ශිල්පීය දක්ෂතා වැඩිදියුණු කිරීමෙහිලා වැඩි අවධානයක් යොමු කරනු ලබයි. එසේම ආයතනික/ ව්‍යක්තීය හා කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම් ආරම්භයේ සිටම විෂය මාලාවට ඇතුළත් කර තිබේ. මෙම උපාධි පාඨමාලා වල ඉතා වටිනා අංගයන් වන අතර සියළුම සිසුන් කර්මාන්ත පුහුණුවක් සඳහා අනුයුක්ත විය යුතු අතරම සයමාසිකයක් පුරා දිවෙන පර්යේෂණ ව්‍යාපෘතියක් ද සම්පූර්ණ කළ යුතු වේ.

පීඨයේ ශිෂ්‍ය ගහනය පහත පරිදි වේ.

අධ්‍යන පාඨමාලාව	අධ්‍යන වර්ෂය	බඳවාගත් වර්ෂය	විශ්වවිද්‍යාල කොමිසන් සභාව මඟින් බදුවා ගැනීම (දේශීය සිසුන්)		
			පිරිමි	ගැහැණු	එකතුව
2019 බඳවා ගත් දිනය - 2019-පෙබරවාරි-12					
ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය	සිව්වන වසර	2017/2018	88	14	102
ජෛව තාක්ෂණවේදි ගෞරව උපාධිය	සිව්වන වසර	2017/2018	22	64	86
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය	සිව්වන වසර	2017/2018	50	41	91
2020 බඳවා ගත් දිනය - 2020-මාර්තු-04					
ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය	තෙවන වසර	2018/2019	88	12	100
ජෛව තාක්ෂණවේදි ගෞරව උපාධිය	තෙවන වසර	2018/2019	24	61	85
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය	තෙවන වසර	2018/2019	60	30	90
2021 බඳවා ගත් දිනය - 2021-පුලි-29					
ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය	දෙවන වසර	2019/2020	107	19	126
ජෛව තාක්ෂණවේදි ගෞරව උපාධිය	දෙවන වසර	2019/2020	20	85	105

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය	දෙවන වසර	2019/2020	80	41	121
2022 බඳවා ගත් දිනය - 2022-අගෝස්තු-18					
ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය	දෙවන වසර	2020/2021	94	28	122
ජෛව තාක්ෂණවේදි ගෞරව උපාධිය	දෙවන වසර	2020/2021	29	73	102
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය	දෙවන වසර	2020/2021	84	39	123

ආ. ජයග්‍රහණයන්

2022 වසරේ නොවැම්බර් මාසයේ දී ද්‍රව්‍ය තාක්ෂණ අධ්‍යයනාංශයට අයත් ඉංජිනේරු වැඩපොලේ හා සෙරමික් නියමු බලාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර පීඨය සඳහා භාර ගන්නා ලදී. ඉංජිනේරු වැඩපල සඳහා අවශ්‍ය ඉතා නවීන තාක්ෂණික උපකරණ විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (Science and Technology Human Resources Development - STHRD) යටතේ මිලදී ගන්නා ලදී. කොවිඩ් 19 ගෝලීය වසංගතය හමුවේ ප්‍රමාද වුවද ගොඩනැගිලි වල ඉදිකිරීම් අදියර II සහ අදියර III මේ වන විට සිදු කෙරෙමින් පවති.

තාක්ෂණ පීඨයේ පළමු කණ්ඩායම (2015/2016) වර්ෂ 2022 පැවති උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධිය ලබාගත් අතර එහි සාරාංශය පහතින් දක්වා ඇත.

	උපාධි වැඩසටහන	උපාධිධාරීන්
		ශිෂ්‍ය සංඛ්‍යාව
1	ජෛව තාක්ෂණ	31
2	ආහාර තාක්ෂණ	49
3	විදුලි සහ ඉලෙක්ට්‍රොනික් තාක්ෂණ	42
4	ද්‍රව්‍ය තාක්ෂණ	38
5	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ	62
	එකතුව	**222**

තාක්ෂණ පීඨයේ දෙවන කණ්ඩායම (2016/2017) හි අධ්‍යන කටයුතු අවසන් කර ඇති අතර 2023 වර්ෂයේ උපාධි ප්‍රධානෝත්සවයේදී උපාධි පිරිනැමීමට නියමිතය

ජෛව තාක්ෂණ අධ්‍යනාංශය මඟින් මුල් වෘත්තීය කාන්තා විද්‍යාඥයින්ගේ මිත්‍රත්වයෙන් :ඇමරිකානු ඩොලර් 50,000) දිනා ගැනීමට සමත් විය. මෙම අධ්‍යනාංශයේ පර්යේෂකයින් විසින් ප්‍රකාශිත ග්‍රන්ථ 01, සූචිගත ලිපි 02ක්, ජාත්‍යන්තර පොත් 04ක් සහ සාරාංශ පරිච්ඡේද 09ක් ප්‍රකාශයට පත් කරන ලදි.

ආහාර තාක්ෂණ අධ්‍යනාංශය විසින් රසායනාගාර සම්පත් අධ්‍යනාංශ පරිශ්‍රය තුලට ලබා ගන්නා ලදි. ජල තාක්ෂණය සම්බන්ධ ප්‍රායෝගික සැසි සඳහා BOD සහ COD අධිතාක්ෂනික උපකරණ සහ බැර ලෝහ විශ්ලේෂණය සඳහා පරමාණු අවශෝෂණ වර්ණාවලීක්ෂය වැනි අධි තාක්ෂණික උපකරණ අධ්‍යනාංශය සඳහා මෙම වසරේ දී ලබා ගන්නා ලදි උනන්දුව දක්වන සියළුම පාර්ශවයන් ඉලක්ක කරගනිමින් පරමාණු අවශෝෂණ වර්ණාවලීක්ෂය සැකසීම හා අත්දැකීම් පිළිබඳ වැඩමුළුවක් අධනාංශය විසින් සංවිධානය කරන ලදි. ''ප්‍රෝෆුඩ් - ප්‍රෝපැක'' ප්‍රදර්ශනය සඳහා කාර්ය මණ්ඩලයේ මඟ පෙන්වීමෙන් අධයනාංශයේ ශිෂ්‍යයින් සහභාගි වූ අතර මෙ මඟින් ඔවුන් ආහාර තාක්ෂණය පිළිබඳ බොහෝ ප්‍රායෝගික දැනුමක් ලබා ගන්නා ලදි. එය නව තාක්ෂණයේ වෙනස්කම් අනුව සිසුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමට බෙහෙවින් උපකාරී විය. ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රදාන යටතේ විහව ආහාර යෙදවුම් සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථික මධ්‍යස්ථානවල ජනනය වන පලතුරු සහ එළවළු අපද්‍රව්‍ය වලින් ආහාරමය තන්තු නිස්සාරණය කිරීම සහ ගුනාංගීකරනය යන මාතෘකාව සඳහා වන තරඟකාරී පර්යේෂණ ප්‍රදානය අධ්‍යනාංශය විසින් දිනා ගන්නා ලදි.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය විවිධ ආංශවල සංවර්ධනය සමඟ සාර්ථකත්වය අත්කර ගන්නා ලදි. විශේෂයෙන්ම තොරතුරු හා සන්නිවේදන අධ්‍යනාංශයේ ප්‍රායෝගික පන්ති සඳහා නවීන තොරතුරු තාක්ෂණ උපකරණ අධ්‍යනාංශයට ලබා ගැනීම.

බාහිර විශේෂඥයින් දෙදෙනෙකුගේ උපදේශනයෙන් කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ අදහස් සමඟ විෂය මාලාව සමාලෝචනය මඟින් ඵලදායි ලෙස සිදු කිරීම.

සිසුන්ගේ දැනුම මට්ටම ඉහළ නැංවීම සඳහා අධ්‍යනාංශය විසින් වැඩමුළු කිහිපයක් පවත්වන ලදි. ''අන්තර්ජාලය සතු දේවල්'' මැයෙන් වැඩමුළුවක් පැවැති අතර අදාල ක්ෂේත්‍රය පිළිබඳ කාර්මික ප්‍රවීනයන් සම්පත් දායකයන් ලෙස සහභාගි විය.

ද්‍රව්‍ය තාක්ෂණ අධ්‍යනාංශය විසින් එහි වැඩපොලවල් සඳහා අවශ්‍ය උපකරණ බොහෝමයක් ADB ව්‍යාපෘතියේ අරමුදල් මඟින් ප්‍රසම්පාදනය කර ඇත. උපකරණ වල පරිගණක සංඛ්‍යාත්මක පාලන ඇඹරුම් යන්ත්‍රයක් පරිගණක සංඛ්‍යාත්මක පාලන ලියවන පට්ටලයක්, සාමාන්‍ය ඇඹරුම් යන්ත්‍රයක්, සාමානය ලියවන පට්ටල 04ක්, මතුපිට ගිනිගල් යන්ත්‍රයක් සහ හැඩ ගැන්වීම් යන්ත්‍රයක් ඇතුළත්වේ. බොහෝ සුළු උපකරණ (අත් විදුලි බල යන්ත්‍ර සහ ගිනිගල් යන්ත්‍ර) ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇත. වැඩ පොළ දැන් සිසුන්ගේ ඉගැන්වීම් කටයුතු සඳහා විවෘතව පවතින අතර කර්මාන්ත සඳහා සේවා සැපයීම දක්වා පුළුල් කිරීමට අධ්‍යනාංශය අපේක්ෂා කරයි.

සී. එස්. අයි. රජරට උළු සමාගම සමඟ කාර්මික සහයෝගිතා ව්‍යාපෘතියක් සඳහා STHRD ව්‍යාපෘතියෙන් තරඟකාරී පර්යේෂණ ප්‍රදානයක් ලබා ගැනීමට ද අධ්‍යනාංශය සමත් විය. ව්‍යාපෘතියේ මාතෘකාව ''කළු වීමට ප්‍රතිරෝධී රතු මැටි උළු සංවර්ධනය කිරීම'' වන අතර රතු මැටි උළු අකලට කළු වීම සඳහා විසඳුමක් ලබා දීම කෙරෙහි අවධානය යොමු කරයි.

තාක්ෂණ පීඨය ප්‍රථම වරට උපාධි අපේක්ෂකයින්ගේ පර්යේෂණ සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදි.

තාක්ෂණපීඨය 2022 දෙසැම්බර් 16 වැනි දින සිය ප්‍රථම උපාධි අපේක්ෂක තාක්ෂණ පර්යේෂණ සම්මන්ත්‍රණය (URSoT-2022) සාර්ථකව පවත්වන ලදි. මෙම සම්මන්ත්‍රණය භෞතිකව පීඨ පරිශ්‍රයේදී පවත්වන ලද අතර 3වන වසරේ සහ 4වන වසරේ උපාධි අපේන්ෂකයින් සඳහා ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සියලුම පීඨනියෝජනය කරන විශාල පිරිසක් ඉදිරියේ බෙදා ගැනීමට අවස්ථාව හිමි විය.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ජෛව ක්‍රියාවලි තාක්ෂණ අධ්‍යනාංශයේ R2RJ4 ව්‍යාපෘති කාර්යාලය විසින් දෙසැම්බර් 01 වැනිදා සිට 03 වන දා දක්වා ''නව තාක්ෂණ භාවිතය උෆන උපයෝගිතා නොවන පලතුරු බෝග ශ්‍රී ලංකා භාවිතය'' පිළිබඳ වැඩමුළුවක් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨ පරිශ්‍රයේ සහ වැලිඔය නාවික විවේක පරිශ්‍රය් දි පවත්වන ලදි.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

ගොඩනැගිලි ඉදිකිරීම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අරමුදලින් ඉදිකෙරෙන අදියර II සහ අදියර III යටතේ ඉදිකෙරෙන තෙමහල් ගොඩනැගිල්ල 2022 දෙසැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුනද අනෙකුත් ඉදිකිරීම් කටයුතු හේතුවෙන් එය ප්‍රමාද වී ඇත.

- අළුතෙන් පිහිටුවන ලද පීඨයක් වීම හේතුවෙන් කාර්යභාරයන් කළමණාකරනය කර ගැනීමට වර්තමාන කාර්ය මණ්ඩලයට දැඩි වෙහෙසක් දැරීමට සිදු වී ඇති අතර ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීමට අමතරව ප්‍රමාණවත් විද්‍යාගාර හා කාර්යාල ඉඩකඩ නොමැතිවීම ද නිසා පහත අසමර්ථ වලට මුහුන දීමට සිදු විය.
- කථිකාචාර්යවරුන් සඳහා කාර්යාල ඉඩකඩ නොමැතිකම
- දේශන ශාලා වෙන් කිරීම අනෙකුත් පීඨ සමග සිදු තිරීමේදි ඇතිවන අපහසුතා හේතුවෙන් අවසන් මොහොතේ දේශන අවලංගු කිරීම.
- නව චක්‍රලේඛ අනුව බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් කාර්ය මණ්ඩල සාමාජිකයින් අධික ලෙස කාර්ය බහුල වී සිටී. ශීෂ්‍ය බඳවා ගැනීම් ඉහළ නැංවීම නිසා සීමිත සම්පත් වලින් කටයුත- කිරීමට පීඨය මහත් පරිහ්‍රමයක් දරයි.
- මිහින්තලේ පරිශ්‍රයේ සිසුන් සඳහා ප්‍රමාණවත් නේවාසිකාගාර නොමැතිවීම ද ගැටළුවක් වී පවතී.
- ප්‍රමාණවත් ආපනශාලා නොමැතිවීම නිසා සිසුන් දිගු පොළිම් වල බොහෝවෙලා රැඳී සිටීම නිසා නියමිත වේලාවට දේශන වලට සහභාගී වීමට නොහැකිවීම.

- උපාධි පාඨමාලා නියමිත වේලාවට අවසන් කිරීමට අවශ්‍ය නිසා දේශන, ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා විභාග රාත්‍රී කාළයේදීත් පැවැත්වීමට සිදුවී ඇති අතර එවන් අවස්ථා වලදී දේශකවරුන් මෙන් ම සිසුන් ද නිසි ප්‍රවාහන පහසුකම් නොමැති වීමෙන් අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුවේ.
- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් නව ප්‍රතිතන අත්පොතක් හඳුන්වා දීමෙන් ද්‍රව්‍ය තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණවේදි ගෞරව උපාධියේ ප්‍රතිතන ක්‍රියාවලිය තවදුරටත් ප්‍රමාද වේ. නව ප්‍රතිතන අවශ්‍ය තා පිළිබිඹු වන පරිදි විෂයමාලා සංශෝධනය කිරීමට අධ්‍යනාංශය උපදේශකයින් සමඟ කටයුතු කරමින් සිටී.

ඈ. අනාගත දැක්ම

යටිතල පහසුකම් සංවර්ධනය

ගොඩනැගිලි ඉදිකිරීම;

- ආසියානු සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ඉදිවන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2021 වසරේ නොවැම්බර් මාසයේ දී ආරම්භ කළ අතර විද්‍යාගාර සංකීර්ණය 2023 අප්‍රේල් මාසයේ දීත් සම්පූර්ණ ව්‍යාපෘතිය 2024 වසරේ අප්‍රේල් මාසයේ දීත් නිම කිරීමට නියමිතය.
- නව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විද්‍යාගාරය සහ උපකරණ සම්පූර්ණ කිරීම.
- සියලුම අධ්‍යනාංශ වල නව විද්‍යාගාරවලට අවශ්‍ය උපකරණ සපයා දී සම්පූර්ණ කිරීම.

විෂයමාලා සංවර්ධනය

- 2017 දී වැජෙනින්ජෙන් විශ්වවිද්‍යාලයෙන් පැමිණි වැඩසටහන් ඇගයුම්කරුවන් විසින් යෝජනා කරන ලද පරිදි නව උපාධි වැඩසටහන හඳුන්වාදීම.
- සියලුම අධ්‍යනාංශ විෂයමාලා වල සංශෝධන කටයුතු අවසන් කර විශ්වවිද්‍යාල විෂයමාලා සංවර්ධක කමිටුවේ අනුමැතියට යොමුකර ඇත.
- සියළුම උපාධි පාඨමාලා වලට අදාළ ස්වයං ඇගයීම් වාර්තා (SER) සම්පූර්ණ කර ඇති අතර ඒ සඳහා විශේෂඥ අදහස් ලැබී තිබේ.
- පීඨයේ වෘත්තීය මාර්ගෝපදේශන සහ කර්මාන්තයන් පිළිබඳ ඒකකය ආරම්භ කරන ලදි.
- පාර්ශවකරුවන්ගේ වාර්ෂික රැස්වීම හා කර්මාන්ත උපදේශන කමිටු රැස්වීම් සංවිධානය කිරීම.
- පශ්චාත් උපාධි වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා අයදුම්පත් සකස් කරමින් පවතී (පශ්චාත් උපාධි සහ පර්යේෂණ උපාදි)

මානව සම්පත් සංවර්ධනය

- තාක්ෂණ උපාධි පාඨමාලාවට අදාළ විෂයන්හි විශේෂඥ දැනුම ඇති අය පීඨ සාමාජිකයින් ලෙස බඳවා ගැනීම.
- තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ වත්මන් ප්‍රවණතා සහ තාක්ෂණික යාවත්කාලීන පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කිරීම.
- තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ ප්‍රවීනයන්ගේ සහභාගිත්වයෙන් උපාධි අපේක්ෂකයින් සඳහා ''තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ වෘත්තීය'' පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම.
- උපාධි අපේක්ෂකයින් සඳහා ''ජීව දත්ත පත්‍රය සකස් කිරීම සහ පෞරුෂත්ව වර්ධනය'' පිළිබඳ වැඩමුළු සංවිධානය කිරීම.
- ප්‍රෝෆුඩ් සහ ප්‍රෝපැක් යන ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ප්‍රදර්ශන කුටියක් සකස් කිරීමට සැලසුම් කිරීම.
- අධි තාක්ෂණික උපකරණ පිළිබඳ වැඩමුළු පැවැත්වීම.

23. පුස්තකාල පද්ධතිය

අ. හැඳින්වීම

පුස්තකාල ඉතිහාසය

1995 නොවැම්බර් 07 දිනැති අංක 896/2 දරණ ගැසට් නිවේදනය මඟින් 1978.08.16 දිනැති විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය 1996 ජනවාරි 31 වන දින ස්ථාපිත කරන ලදි. ඒ, මධ්‍යම, උතුරුමැද හා වයඹ පළාත් අනුබද්ධ විශ්වවිද්‍යාල වල සම්පත් ඒකාබද්ධ කිරීමෙනි. රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාල පද්ධතිය ආරම්භ කරන ලද්දේ 1996 සැප්තැම්බර් 02 වන දින වන අතර පළමු පුස්තකාලයාධිකාරීවරයා වූයේ මහාචාර්ය පියදාස රණසිංහ මහතාය. අනතුරුව කපිල ජයලාල් සිරිසේන මහතා, ගාමිණී ද සිල්වා මහතා, හේමා විජේතුංග මහත්මිය (සප්ත වාර්ෂික නිවාඩු මත 2007-2009 දක්වා) ධූරය හොබවන ලද අතර අශෝකා සිරිවර්ධන මහත්මිය 2013 වසරේ සිට පුස්තකාලයාධිකාරී ධූරය දරමින් සිටී.

පුස්තකාල පැතිකඩ

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ හදවත වන්නේ එහි පුස්තකාලය වන අතර පුළුල් ව ව්‍යාප්ත වූ වෘක්ෂයක් පරිදි එය දැනුම එක්රැස් කිරීමේ, සංවිධානය කිරීමේ හා බෙදා හැරීමේ නියුක්තව සිටී. පුස්තකාලයෙහි පාඨක ප්‍රජාව උපාධි අපේෂක සිසුන්, පශ්චාත් උපාධිධාරීන්, අධ්‍යයන කාර්ය මණ්ඩලය, විධායක කාර්ය මණ්ඩලය හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පමනක් නොව පර්යේෂකයින් හා ප්‍රදේශයේ බාහිර ප්‍රජාවද වන අතර එම ස්යළු දෙනා හට සිය සේවාවන් සපයනු ලබයි.

පීඨ පුස්තකාල

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාල පද්ධතිය ප්‍රධාන පුස්තකාලය හා විවිධ පරිශ්‍රයන්හි පිහිටා ඇති පීඨ පුස්තකාල 04කින් සමන්විත වන අතර ප්‍රධාන පුස්තකාලය, ව්‍යවහාරික විද්‍යා පීඨ පුස්තකාලය හා තාක්ෂණ පීඨ පුස්තකාලය මිහින්තලේ පරිශ්‍රයේ පිහිටා ඇත. ප්‍රධාන පුස්තකාලය මඟින් සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, කළමනාකරණ අධ්‍යයන පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය හා තාක්ෂණ පීඨය සඳහා පුස්තකාල සේවා සපයනු ලබයි. කෘෂිකර්ම පීඨ පුස්තකාලය පුලියන්කුලම පීඨ පරිශ්‍රයේත්, වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨ පුස්තකාලය සාලියපුර පරිශ්‍රයේත්, සායනික පුස්තකාලය අනුරාධපුර ශික්ෂණ රෝහල් පරිශ්‍රයේත් පිහිටා ඇත.

පුස්තකාල කාර්ය මණ්ඩලය

වර්තමාන පුස්තකාල කාර්ය මණ්ඩලය අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 07 දෙනෙක් පරිපාලන නිළධාරියෙක් හා සහායක කාර්ය මණ්ඩල සාමාජිකයින් 38 දෙනෙකුගෙන් යුක්ත වේ.

2021.12.31 දිනට පුස්තකාලයේ සාමාජික සංඛ්‍යා

	ප්‍රධාන පුස්තකාලය	ව්‍යවහාරික විද්‍යා පීඨ පුස්තකාලය	කෘෂිකර්ම පීඨ පුස්තකාලය	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨ පුස්තකාලය	තාක්ෂණ පීඨ පීඨ පුස්තකාලය	එකතුව
උපාධි අපේක්ෂකයින්	4365	1416	844	1337	1233	9195
අධ්‍යයන කාර්ය මණ්ඩල	194	55	51	51	17	368
තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩල	17	40	18	1	19	95
පරිපාලන කාර්ය මණ්ඩලය	23	-	2	4	-	29
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	163	29	45	54	6	297

පුස්තකාල එකතුව

ප්‍රධාන පුස්තකාලය, පෙළපොත්, ජර්නල සඟරා, පුවත්පත්, රජයේ ලිපිලේඛන, විශේෂ එකතු, විමර්ශන ද්‍රව්‍ය, පසුගිය ව්‍යාපෘති වාර්තා, පර්යේෂණ නිබන්ධන, පසුගිය ප්‍රශ්න පත්‍ර හා විද්‍යුත් සම්පත් (e- resources) වලින් සමන්විත වේ. මේ සියල්ලම විෂයමාලා වලට අනුකූලව සපයාගෙන ඇත. පුස්තකාල සම්පත් මුද්‍රිත හා විද්‍යුත් යන දෙයාකාරයෙන්ම සමන්විත වේ.

වෛද්‍ය විද්‍යාව, කෘෂිකර්මය, ව්‍යවහාරික විද්‍යාව, සමාජවිද්‍යාව, පරිගණක විද්‍යාව හා කළමනාකරණය යන විෂයන්හි සම්පූර්ණ පෙළ සහිත ලිපි සඳහා ප්‍රවේශ විය හැකි මාර්ගගත ජර්නල දත්ත සමුදායක් සේවය ශ්‍රී ලංකා අධ්‍යයන පුස්තකාල එකතුව (කෙන්සාල්) ඔස්සේ සපයනු ලබයි. පුස්තකාලය වර්තමානයේ දී ජර්නල සඟරා විශාල සංඛ්‍යාවක් සඳහා දායකත්වය දක්වන අතර එමඟින් පාඨකයින්ට නව ප්‍රවණතාවයන් යටතේ දැනුම යාවත්කාලීනව පවත්වා ගැනීමට උපකාරීවීම එහි අරමුණය. විවිධ විෂය ධාරා යටතේ වන පෙළපොත් හා සාමාන්‍ය දැනුම සඳහා වන පොත් විශ්වවිද්‍යාලයේ සියළුම පීඨයන්ට ගැලපෙන සේ රජරට විශ්වවිද්‍යාලයීය පුස්තකාලය සමන්විත වේ.

2021.12.31 දිනට පුස්තකාලයේ ඇති පොත් සංඛ්‍යා

ප්‍රධාන පුස්තකාලය	ව්‍යවහාරික විද්‍යා පුස්තකාලය	කෘෂිකර්ම පීඨ පුස්තකාලය	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨ පුස්තකාලය	තාක්ෂණ පීඨ පුස්තකාලය	එකතුව
83747	14086	15292	10724	1784	125633

පවතින ඉලෙක්ට්‍රෝනික (විද්‍යුත්) සම්පත් හා දත්ත සමුදායන්

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම අනුග්‍රහය දක්වන කොන්සාල් මඟින් ප්‍රවේශ විය හැකි දත්ත සමුදායන් (එමරල්ඩ්, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය මුද්‍රණාලය, ටේලර් සහ ෆ්‍රැන්සිස) ලෝක සෞඛ්‍ය සංවිධානය දායක වී ඇති දත්ත සමුදාය

පුස්තකාලයේ ප්‍රධාන සේවා

බැහැර දෙන සේවා, විමර්ශන සේවා, පුස්තකාල (අභ්‍යන්තර) අතර හුවමාරු පද්ධති, කාලීන දැනුවත් කිරීමේ වැඩසටහන්, තොරතුරු සාක්ෂරතා වැඩසටහන්, පරිශීලන අධ්‍යාපන වැඩසටහන්, වැඩමුළු හා පුස්තකාල වෙබ් අඩවි නඩත්තුව යනාදිය පුස්තකාලයේ ප්‍රධාන සේවාවන් අතර වේ. මාර්ගගත සම්පත් සඳහා ප්‍රවේශ වීමට වැදගත් වන සබඳතා මාර්ග සපයා දීමද පුස්තකාල වෙබ් අඩවිය මඟින් සිදුකෙරේ. මාර්ගගත පොදු ප්‍රවේශ නාමාවලිය (ඔපැක්) ඔස්සේ පුස්තකාල නාමාවලියට පිවිසිය හැක. විශ්වවිද්‍යාලයේ පර්යේක්ෂණ වාර්තා සහ ලිපි එකතුව පුස්තකාලය මඟින් නඩත්තු කෙරේ. අන්තර්ජාලය ඔස්සේ පරිශීලකයින්ට පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර සඳහා පිවිසිය හැක. පුස්තකාලය උතුරුමැද පළාත සඳහා ප්‍රජා ව්‍යාප්ති වැඩසටහන් ද සම්පාදනය කරයි. පාසල් හා මහජන පුස්තකාල කාර්යක්ෂම ආකාරයෙන් නැවත සකස් කිරීම, පොත් ප්‍රදානයන්, පාසල් හා මහජන පුස්තකාල කාර්යමණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම ඒ අතරවේ.

- **ස්වයංක්‍රීය පුස්තකාල සේවා සැපයීම**

දැනට පවතින පුස්තකාල තොරතුරු දත්ත සමුදාය කළමනාකරණ පද්ධතිය ''කොහා'' පද්ධතිය විවෘත කේත මෘදුකාංගය මඟින් සාර්ථක ලෙස ස්වයංක්‍රීයකරණය කර ඇත. රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාල පද්ධතිය ''කොහා'' විවෘත කේත මෘදුකාංගය හා භාවිතා කර පොත් සංසරණය ඇතුළුම් කිරීම, අයවැයකරණය, ප්‍රවේශවීම, සංඛ්‍යාලේඛන ලබාගැනීම, යෝජනා එකතු කිරීමට කටයුතු කරයි. පුස්තකාල පරිශීලකයින්ට පුස්තකාල නාමාවලිය මාර්ගගත ක්‍රමය ඔස්සේ පරිශීලනය කල හැකියි. පුස්තකාලය එහි පරිශීලකයින්ට නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කර දුරස්ථ ව ප්‍රවේශවීමේ අවස්ථාව ලබා දී තිබේ.

- **ආයතනික පර්යේෂණ ලිපි සහ වාර්තා එකතුව**

ආයතනික පර්යේෂණ ලිපි සහ වාර්තා එකතුව යනු විශ්වවිද්‍යාලයේ පර්යේෂණ හා සොයාගැනීම් පිළිබඳ වාර්තා හා ලිපි මාර්ගගත එකතුවක් ලෙස පවත්වාගෙන යාමයි. එය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ නිමවුම් සඳහා ප්‍රවේශවීම හා දෘෂ්‍යතාවය වර්ධනය කිරීම කෙරෙහි වැදගත් වන අතර උපුටාගැනීම් අනුපාතය හා විශ්වවිද්‍යාලයේ ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීමට බලපායි. එය ප්‍රකාශන 4810කට අධික සංඝිප්ත සහ සම්පූර්ණ ලිපි වලින් සමන්විත වේ.

- **පසුගිය ප්‍රශ්ණ පත්‍ර සඳහා ඉන්ට්‍රානෙට් පිවිසුම් පහසුකම්**

ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන අභ්‍යන්තර විභාග වල පසුගිය ප්‍රශ්නපත්‍ර පරිගණකගත කොට ඉන්ට්‍රානෙට් ඔස්සේ පාඨකයන්ට බාගත කර ගැනීමට හැකියාව ලබා දී ඇත. එම නිසා පාඨකයන්ගේ අවශ්‍යතාවය මත පසුගිය ප්‍රශ්ණ පත්‍ර සඳහා ප්‍රවේශ වීමට මෙන්ම හුවමාරු කර ගැනීමටද අවස්ථාව සැලසේ

- **තෝරාගත් තොරතුරු සේවාව සහ පර්යේෂණ පහසුකම් සැපයීම**

තෝරාගත් තොරතුරු සේවාව භාවිතා කරමින් පරිශීලකයින්ට ඔවුන්ගේ නිශ්චිත තොරතුරු අවශ්‍යතා සඳහා තොරතුරු රිසිකරණය කළ හැකිය. වර්තමාන දැනුවත් කිරීමේ සේවාවන් නව මාතෘකා සහ ඔවුන්ගේ නිශ්චිත පර්යේක්ෂණ අවශ්‍යතා සඳහා තොරතුරු විද්‍යුත් තැපෑලෙන්, වාචිකව සහ දැන්වීම් මගින් දැනුම් දෙනු ඇතග පුස්තකාලය පරිශීලකයින්ට ඔවුන්ගේ පර්යේක්ෂණ කටයුතු සිදු කිරීමට සහ ඔවුන්ගේ පර්යේක්ෂණ කටයුතු සහ අඛණ්ඩ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය තොරතුරු විද්‍යුත් තැපෑලෙන් සහ වෙනත් ක්‍රම මගින් ලබා දීමට සහය වේ.

- **ශ්‍රව්‍ය හා දෘශ්‍ය සම්පත් සේවාව සහ වයි-ෆයි ප්‍රවේශයන්**

ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය මගින් පරිශීලකයන්හට ඉලෙක්ට්‍රොණික දත්ත සමුදායන් වෙත පිවිසිම, අන්තර්ජාල පහසුකම් සහ සංයුක්ත තැටි වැනි සේවාවන් සපයනු ලබයි. මෙම ඒකකය සතුව පරිගණක යන්ත්‍ර කිහිපයක් පවතින අතර පරිශීලකයන්ට තොරතුරු සෙවීම, බාගත කිරීම සහ හුවමාරු කර ගැනීම සිදු කල හැකිය. එමෙන්ම ඔවුන්ට නොමිලේ ශාස්ත්‍රීය සම්පූර්ණ ප්‍රකාශන වාර්තා වලට පිවිසීමේ හැකියාවද ලැබේ. මෙම ඒකකය මගින් පුස්තකාලය සතු සියලුම ඉලෙක්ට්‍රෝනික මූලාශ්‍ර සඳහා පහසුවෙන් පිවිසිය හැකිය. මෙම ඒකකය වයි-ෆයි පරිශීලන කළාපයකින් සමන්විත වන අතර සිසුන්ගේ උපාංග භාවිතයෙන් ඉලෙක්ට්‍රෝණික තොරතුරු සඳහා පිවිසිය හැකිය.

- **ඡායා පිටපත් කිරීමේ පහසුකම් (පුද්ගලික)**

පුස්තකාලය පරිශීලකයින්ට ඡායා පිටපත් ලබා ගැනීමේ පහසුකම් සලසනු ලැබේ. පර්යේෂණ වාර්තා හැර සෙසු තොරතුරු පාඨකයන් හට ඡායා පිටපත් ලබා ගත හැකිය. පොත්පත් ස්කෑන් කිරීමේ සහ පොත් බැඳීමේ පහසුකම්ද මෙම ඒකකය මගින් සපයනු ලබයි.

- **පුවත්පත් ලිපි එකතු කිරීමේ සේවාව**

පුස්තකාලය මගින් විෂයන් මාලාවක් සඳහා පුවත්පත් ලිපි එකතුවන් පවත්වාගෙන යනු ලැබේ, මෙම පුවත්පත් ලිපි ස්කෑන් කොට ඩිජිටල් ආකාරයට පරිවර්තනය කොට පවත්වාගෙන යෑමට පුස්තකාලය බලාපොරොත්තු වේ. එවිට දෛනික තොරතුරු සඳහා පිවිසිමට, බාගත කර ගැනීමට සහ හුවමාරු කර ගැනීමට පරිශීලකයින්ට පහසු වේ.

ආ. ජයග්‍රහණයන්

- **පරිශීලකයින් දැනුවත් කිරීමේ වැඩසටහන**

කළමනාකරණ අධ්‍යයන පීඨයේ, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ, කෘෂිකර්ම පීඨයේ, වෛද්‍ය හා සමාන්තර විද්‍යා, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර, ව්‍යවහාරික විද්‍යා පීඨයේ හා තාක්ෂණ විද්‍යා පීඨයේ සිසුන් උදෙසා පුස්තකාල වැඩසටහන් 06 ක් පවත්වන ලදී. එමෙන්ම පරිශීලකයින් හඳුන්වා දීමේ වැඩසටහන් පුහුණු සැසි හා වැඩ මුළු භෞතික සහ මාර්ගගත ක්‍රමවේදය මඟින්ද සාර්ථකව පවත්වන ලදි.

- **ලිපි ලේඛන මාර්ගගත ක්‍රමය ඔස්සේ බෙදාහැරීමේ සේවාව**

කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් ලිපිලේඛන මාර්ගගත ක්‍රමය ඔස්සේ බෙදා හැරීම ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාල පද්ධතිය ආරම්භ කළේය. වසංගත ව්‍යාප්තිය මධ්‍යයේ වුව ද පරිශීලකයින්ගේ ඉල්ලීම පරිදි පුස්තකාල ද්‍රව්‍ය විද්‍යුත් තැපෑල හරහා ලබා දෙන ලද්දේ ඔවුන්ගේ කියවීමේ පරිචය අඛණ්ඩව පවත්වාගෙනයාමට දක්වන රුකුලක් වශයෙනි. වර්ෂය තුළදී ලේඛන 4000 ක් මෙසේ බෙදා හැර ඇත.

- **මාර්ගගත ලියාපදිංචිය**

විශ්වවිද්‍යාලයට අලුතින් ඇතුලත් වන අය සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පුස්තකාල ලියාපදිංචිය ලබා ගත හැකිය. මේ සඳහා පුස්තකාලයේ ගූගල් පෝරමය පුරවා ඔවුන්ගේ කැමැත්ත ලබා දීමෙන් පසුව පුස්තකාල සාමාජිකත්වය ලබා දීම සිදු කරයි.

- **ප්‍රජා ව්‍යාප්ති කටයුතු**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාල පද්ධතිය මඟින් ප්‍රදේශයේ මහජන පුස්තකාලයාධිකාරීවරුන්ට, මහජන පුස්තකාල වෘත්තිකයින්ට, පාසල් පුස්තකාලයාධිකාරීවරුන්ට සහ පිරිවෙන් පුස්තකාලයාධිකාරීවරුන්ට පුස්තකාල සහ තොරතුරු විද්‍යා ක්ෂේත්‍ර පිළිබඳ වැඩමුළු සහ සම්මන්ත්‍රණ ආවර්ජිතව සංවිධානය කරන ලදි. පුස්තකාලය මගින් පාසල් සිසුන් සඳහා ඔවුන්ගේ කියවීමේ පුරුද්ද වැඩි දියුනු කිරීම සඳහා අභිප්‍රේරණ වැඩසටහන් පැවැත්වීම සහ ඔවුන්ට විශ්වවිද්‍යාල පුස්තකාලය නැරඹීමට හැකි වීම.

- **පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර බෙදාහැරීමේ මාර්ගගත ක්‍රමය**

විශ්වවිද්‍යාලයේ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සඳහා පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර ඇතුළත් කරන අතර කොවිඩ් 19 තත්ත්වය හමුවේ සිසුන් විශ්වවිද්‍යාලට නොපැමිණිය ද ඔවුනට පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වලට පිවිසීමට හැකියාව මෙමඟින් ලබා දුනි.

- **මානව පුස්තකාල වැඩසටහන**

මානව පුස්තකාල වැඩසටහන ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය මගින් ආරම්භ කරල ලද නව්‍ය වැඩසටහනකි. මෙම අවස්ථාවට සහභාගිවන්නට ''මානව පොත්'' කියවීමට අවස්ථාව ලබා දී ඇත. ඒවා සැබැවින්ම විවිධ පසුබිම් සහ ජීවිත අත්දැකීම් ඇති පුද්ගලයන් වේ. සෑම ''පොතක්'' ම අදිවිතීය මාතෘකාවක් හෝ අත්දැකීමක් නියෝජනය කරයි. මෙම පොත් සමඟ අර්ථවත් සංවාදවල යෙදීමෙන්, සහභාගිවන්නන්ට ඔවුන්ගේ ඉදිරි දර්ශන සහ කථා පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගත හැකිය. මෙම සිදුවීමේ මූලික අරමුණ වන්නේ විවිධ පසුබිම්වල පුද්ගලයන් අතර සංවේදනය ගෞරවය සහ අවබෝධය පෝෂණය කිරීමයි.

- **ශිෂ්‍යයින් සඳහා දුරස්ථ ප්‍රවේශ පහසුකම්**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පරිගණක මධ්‍යස්ථානය සමඟ පුස්තකාල පද්ධතිය සහයෝගයෙන් ලියාපදිංචි වූ සියලුම සිසුන්ට දුරස්ථ ප්‍රවේශ ගිණුම් ලබා දේ. මෙම දුරස්ථ ප්‍රවේශ පහසුකමින් සිසුන්ට දුරස්ථ පද්ධතියේ දත්ත ගබඩා වලට පිවිසීමට හැකිවේ.

- **පුස්තකාල තත්තත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථාකය විසින් ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාල තත්තත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදි.

පුස්තකාල තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ පරමාර්ථය වනුයේ පුස්තකාල සේවා සැපයීම ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව අනුගමනය කිරීම, නව තාක්ෂණය භාවිතා කිරීම සහ පරිශීලක ප්‍රජාවගේ තොරතුරු සාහිත්‍යමය සහ විද්වත් අවශ්‍යතා සපුරාලීම සහතික කිරීමයි.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- **ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය භාවිතය අවම වීම.**

පවතින උපාංගයන් පුස්තකාලයේ තාක්ෂණික දෝෂ හේතුවෙන් සිසුන්ට වඩා හොඳ සෙවුම් අත්දැකීමක් ලබා දීමට නොහැකි විය. තොරතුරු තාක්ෂණ උපකරණ යල් පැන ගොස් ඇති අතර, අපගේ පුස්තකාල පද්ධතියේ ඉල්ලීම් සපුරාලිමට ප්‍රමාණවත් නොවේ. එම ගැටළුව අපගේ පරිශීලකයින් හා හැකි හොඳම සේවාවන් සැපයීමට ඇති අපගේ හැකියාවට අහිතකර ලෙස බලපාන අතර එය අපගේ කාර්ය මණ්ඩලයේ ඵලදායිතාවයටද ඍජු බලපෑමක් ඇති කරන ලදි.

- **පෞද්ගලික ඡායා පිටපත් කිරීමේ සේවාව ක්‍රියාත්මක නොවීම.**

ආර්ථික අර්බුදය සහ කඩදාසි වලට අධික වියදමක් දැරීමට සිදුවන බැවින් මුද්‍රණ ඒකකයේ ටෙන්ඩර් ඇණවුම කිසිදු පුද්ගලයකු විසින් පිළිගනු නොලැබීම හේතුවෙන් පුස්තකාලයට වසර පුරාම එම සේවාව පවත්වාගෙන යාමට නොහැකි විය.

- **විද්‍යුත් සම්පත් හිඟකම**

දැනට පුස්තකාලය භාවිතා කරන්නේ කොන්සාල් වෙතින් දායක වී ඇති දත්ත සමූදායක් පමණි. අරමුදල් නොමැතිකම නිසා පුස්තකාලයෙන් විශ්වවිද්‍යාල මට්ටමින් කිසිදු විද්‍යුත් සම්පතකට දායක වීමට නොහැකි විය.

- **මානව සම්පත් නොමැතිකම**

රටේ පවතින වර්තමාන තත්ත්වය හේතුවෙන් විශ්වවිද්‍යාලවල පවතින පුරප්පාඩු සඳහා නව කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීමට නොහැකිය. අධ්‍යයන සහ අනධ්‍යයන පුරප්පාඩු කිහිපයක් පවතින අතර මෙය පුස්තකාලයේ ඵලදායිතාවයට අහිතකර ලෙස බලපානු ලැබීය.

ඈ. අනාගත දැක්ම

- **ඩිජිටල් පුස්තකාලය**

පොත් පරිච්ඡේද ඩිජිටල් ආකෘතියෙන් රැස්කර තබාගැනීමට හැකි ඩිජිටල් පුස්තකාලයක් නිර්මාණය කර අභ්‍යන්තර ජාලය ඔස්සේ පිවිසිය හැකි ලෙස සකස් කිරීමට විශ්වවිද්‍යාලයේ පුස්තකාල පද්ධතිය අපේක්ෂා කරයි. DSpace විවෘත මෘදුකාංගය මේ සඳහා භාවිතා කිරීමට නියමිතය. ස්කෑන් කොට මාර්ගගත ක්‍රම වේදය ඔස්සේ බෙදාහැරින ලද සියළුම තොරතුරු මේ ඔස්සේ ලබාගැනීමට සිසුන්ට මෙන් ම කාර්යමණ්ඩලයටද හැකියාව පවතී.

- **ආයතනගත පුහුණු වැඩසටහන්**

පුස්තකාල කාර්යමණ්ඩල සඳහා ආයතනගත පුහුණු වැඩසටහන් පැවැත්වීමට පුස්තකාලය අදහස් කරන අතර ඒ සඳහා සම්පත්දායකයින් ලෙස පුස්තකාල අධ්‍යයන කාර්යමණ්ඩලය කටයුතු කරයි.

- **ආයතනික සමාජ වගකීම් සඳහා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම**

පුස්තකාලය තුළ ආයතනික සමාජ වගකීම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට සඳලසුම් කර ඇති අතර පවත්වන ලද ආයතනික සමාජ වගකීම ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු එකතු කිරීම සහ පවත්වාගෙන යාම මෙහි ප්‍රදාන කර්තව්‍ය වේ.

- **පර්යේෂණ සංස්කෘතිය පිළිබඳ ඒකකයක් පිහිටුවීම**

ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා උපාධි අපේක්ෂකයන්ට පර්යේක්ෂණ පිළිබඳ මනා අවබෝධයක් ලබා දීමට තාක්ෂණික සැසි හරහා කටයුතු කිරීමට ඒකකයක් ස්ථාපනය කිරීම. මෙහේදී නවීන තොරතුරු තාක්ෂණය සහ තාක්ෂණය පිළිබඳ පර්යේක්ෂණ පිළිබඳ වැඩමුළු සහ පුහුණු වැඩ සටහන් අවසන් වසරේ උපාධි අපේක්ෂකයින් සඳහා හඳුන්වා දීම සිදු

24. ශාරීරික අධ්‍යාපන අධ්‍යනාංශය

අ. හැඳින්වීම

ශාරීරික අධ්‍යයන දෙපාර්තමේන්තුව මඟින් විශ්වවිද්‍යාලයීය සිසු ප්‍රජාවට පුළුල් පරාසයක විහිදුණු ක්‍රීඩා හා විනෝදාස්වාද වැඩ සටහන් සඳහා අවස්ථා සපයනු ලැබේ. ශාරීරික අධ්‍යාපන අංශයේ මූලික අරමුණ වනුයේ සිසුන්ගේ ක්‍රීඩා කුසලතා වැඩි දියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සහ ඒකල හා කණ්ඩායම් ක්‍රීඩා කුසලතා සංවර්ධනය සඳහා අවස්ථා සලසා දීම තුළින් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය සිසු ප්‍රජාව සෞඛ්‍ය සම්පන්න ක්‍රියාකාරී ජීවන රටාවක් සඳහා හුරුපුරුදු කිරීමය.

ආ. ජයග්‍රහණයන්

අ. අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා - 2022

- ප්‍රථම ස්ථානය - හෙල්ල විසිකිරීම, ආර්. එම්. එල්. ඩී. රණසිංහ (ICT/2019/2020/088)
- දෙවන ස්ථානය - කවපෙත්ත විසිකිරීම. එම්. වී. එස්. සුභාෂණ (MGT/2018/355)
- තෙවන ස්ථානය - Taekwondo, ඩබ්ලිව්. ඒ. ඒ. යු. සී. විජේසුරිය (SSH/2019/458)
- තෙවන ස්ථානය - කරාටේ (කිලෝග්‍රෑම් 84 කාණ්ඩය), කේ. පී. ඩී. පී. ලෝසිත (ENT/16/17/050)
- තෙවන ස්ථානය - මල්ලවපොර (කි.ග්‍රෑ.92 කාණ්ඩය), ආර්. ඒ. එල්. කේ. චන්ද්‍රතිලක (BST/17/18/009)
- සිව්වන ස්ථානය - උස පැනීම ඒ. එම්. අෆ්රිඩ් (ENT/2020/003)
- සිව්වන ස්ථානය - කැරම් (කාන්තා)
- චෙස් (කාන්තා) - සිව්වන ස්ථානය

ආ. සබරගමුව විශ්වවිද්‍යාලයේ පැවති ''සබර සුපර් 7''තරඟාවලියේ අනුශූරතාවය ලබා ගැනීම.

ආ. අනුරාධපුර දිස්ත්‍රික් ක්‍රිකට් තරඟාවලියේ (තෙවන අංශයේ) ශූරතාවය ලබා ගැනීම.

ඇ. විශ්වවිද්‍යාල එකාබද්ධ හොකී කණ්ඩායම තෝරාගෙන ඇත - ඊ. එම්. එස්. එල්. ඒකනායක(ASB/17/18/021)

විශ්වවිද්‍යාල එකාබද්ධ පැසිපන්දු කණ්ඩායම තෝරාගෙන ඇත. - පී. එම්. ටී. වර්ණකුල (MED/2020/180)

ඈ. 2022 වසරේදී රජරට විශ්වවිද්‍යාල සිසුන් 12 දෙනෙකු ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල වර්ණ හිමි කරගන්නා ලදි.

වෙනත් තොරතුරු

- එක්සත් ජාතින්ගේ අධ්‍යාපන, විද්‍යා සහ සංස්කෘතික සංවිධානය විසින් 2016 දී ශ්‍රී ලංකාවේදී නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද විශ්වවිද්‍යාල ක්‍රීඩා ජාත්‍යන්තර දිනය, ශ්‍රී ලංකා විශ්වවිදයාල ක්‍රීඩා සංගමය විසින් 2022 සැප්තැම්බර් 20වැනි දින කොළඹ විශ්වවිදයාලයේදී සංවිධානය කරන ලද අතර ඒ සඳහා රජරට විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් සාමාජිකයින් 15දෙනෙකු සහභාගි විය.
- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ උපසභාපතිවරයා ලෙස ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වන එස්. යු. විජේසිංහ මහතා පත් කරන ලදි.
- ශාරීරික අධ්‍යාපන අධ්‍යනාංශය මඟින් අන්තර් විශ්වවිද්‍යාල බේස්බෝල් ශූරතාවලිය මිහින්තලේ විශ්වවිද්‍යාලයීය ක්‍රීඩාංගනයේදී සාර්ථකව සංවිධානය කරන ලදි.
- අනුරාධපුර දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ විධායක කමිටු සාමාජිකයකු, පුහුණු කමිටු සාමාජිකයකු සහ විනය කමිටු සාමාජිකයකු ලෙස ඒ. ටී. පී. කුමාර මහතා පත් කර ඇත.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

රටේ පැවති ආර්ථික අර්බුදය සහ වසංගත තත්ත්වය හේතුවෙන් ශාරීරික අධ්‍යනාංශයට අන්තර් පීඨ ක්‍රීඩා උළෙල සහ අන්තර් පීඨ නවකයින්ගේ ක්‍රීඩා උළෙල වර්ෂ 2022දී පැවැත්වීමට නොහැකි විය.

ඈ. අනාගත දැක්ම.

- මැයි මාසයේදී ජාතික මට්ටමේ හොකි තරඟාවලියක් සංවිධානය කිරීමට බලාපොරොත්තුවේ.
- මැයි මාසයේදී අන්තර් පීඨ නවකයන්ගේ ක්‍රීඩා තරඟාවලිය සංවිධානය කිරීමට බලාපොරොත්තුවේ.
- මැයි මාසයේදී කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ක්‍රීඩා තරඟාවලියක් සංවිධානය කිරීමට බලාපොරොත්තුවේ.
- මැයි මාසයේදී කැරම්, චෙස්, මේස පන්දු සහ බැඩ්මින්ටන් සඳහා විවෘත ශූරතා පැවැත්වීමට බලාපොරොත්තුවේ.
- ජුනි මාසයේ සිට ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලට සහභාගී වීමට බලාපොරොත්තුවේ.
- ජුලි මාසයේදී ආරාධිත එල්ලේ තරඟාවලියක් පැවැත්වීමට බලාපොරොත්තුවේ.
- නොවැම්බර් මාසයේදී විශ්වවිද්‍යාල වර්ණ ප්‍රදානෝත්සවය සංවිධානය කිරීමට බලාපොරොත්තුවේ.

25. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

අ. හැඳින්වීම

අධ්‍යක්ෂක

ආචාර්ය එච්. ඕ. විජේවර්ධන මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II වන ශ්‍රේණිය,

වෘත්තීය මාර්ගෝපදේශකයන්

ඒ. මංගලිකා දිසානායක මහත්මිය – AS 2 (II) අධ්‍යන සහයක
ජේ. ඩී. රත්නායක මහතා – AS 2 (II) අධ්‍යන සහයක

වෘත්තීය මාර්ගෝපදේශන උපදේශකයින්

වෘත්තීය මාර්ගෝපදේශන අංශය සහ පීඨයන් අතර වෘත්තීමය මාර්ගෝපදේශන කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා සෑම පීඨයකින්ම එක් අයෙකු වශයෙන් වෘත්තීය මාර්ගෝපදේශන සම්බන්ධීකාරක වරුන් හය දෙනෙකු පත් කර ඇත. කළමනාකරණ සහකාර සහ වැඩ සහායක වශයෙන් සහායක කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු ඇත.

ආ. ජයග්‍රහණයන්

01. ''කැණිමඩල'' වැඩමුළුව පැවැත්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මගින් අනධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා වූ ''කැණිමඩල'' වැඩසටහන 2022 මාර්තු මස 19, 29 සහ 30 යන දිනයන්හි පෙ.ව 09.00 සිට ප.ව.12.00 දක්වා වෘත්තීය මාර්ගෝපදේශ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදි. මෙම වැඩමුළුව වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයෙහි උපදේශිකා මංගලිකා දිසානායක මහත්මිය සහ උපදේශක ජේ. ඩී. රත්නායක මහතා විසින් මෙහෙයවන ලදි.

02. ''කර්මාන්ත ප්‍රවීනයන්'' මැයෙන් වෙබිනර් වැඩසටහන පැවැත්වීම.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාත්තීය මාර්ගෝපදේශන ඒකකය විවිධ කර්මාන්තවල ප්‍රවීණයන් සම්බන්ධ කර ගනිමින් වෙබිනර් (සුම් තාක්ෂණයෙන්) වැඩසටහන් 20ක් සාර්ථකව පවත්වන ලදි.

03. උපාධි අපේක්ෂකයින් සඳහා ''ජීවන කුසලතා'' පිළිබඳ වැඩසටහන

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් ''උපාධි අපේක්ෂකයින් සඳහා ජීවන කුසලතා'' මැයෙන් වැඩසටහන් 10ක් සුම් තාක්ෂණය ඔස්සේ සාර්ථකව පවත්වන ලදි. මෙම වැඩමුළු වාත්තීය මාර්ගෝපදේහ ඒකකයෙහි උපදේශිකා මංගලිකා දිසානායක මහත්මිය විසින් මෙහෙයවන ලදි.

04. ''ඉගෙනීමේ කුසලතා'' පිළිබඳ වැඩසටහන

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් කළමනාකරණ අධ්‍යයන පීඨයේ උපාධි අපේක්ෂකයින් සඳහා 2022 අප්‍රේල් මස 27 වන දින ''ඉගෙනීමේ කුසලතා'' පිළිබඳ වැඩසටහනක් සූම් තාක්ෂණය හරහා සාර්ථකව පවත්වන ලදි. මෙම වැඩසටහන වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයෙහි උපදේශක ජාලිය රත්නායක මහතා විසින් මෙහෙයවන ලදි.

05. ප්‍රජා සමාජ ආරම්භ කිරීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් උපාධි අපේක්ෂකයින් සඳහා ප්‍රජා සමාජ දෙකක් ආරම්භ කරන ලදි. උපාධි අපේක්ෂකයින්ගේ පොදු කථන කුසලතා වැඩි දියුණු කිරීමේ අරමුණින් ග්‍රෙවල් සමාජය ආරම්භ කරන ලද අතර රොට්රැක්ට් සමාජය ආරම්භ කිරීමෙන් උපාධි අපේක්ෂකයින්ගේ නායකත්ව කුසලතා වැඩි දියුණු කිරීම අරමුණු විය.

06. වෘත්තීය සංවර්ධන වැඩසටහන්

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ වෘත්තීය මාර්ගෝපදේශක වරුන් විසින් සූම් තාක්ෂණය හරහා වෘත්තීය සංවර්ධන පාඨමාලා තුනක් කෘෂිකර්ම පීඨය සඳහා පවත්වන ලදි.

07. තොරතුරු තාක්ෂණ යහමග

වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය සහ සර්වෝදය එක්ව මෙම වැඩසටහන පස්වරු 2.00 සිට 4.00 දක්වා සූම් තාක්ෂණය හරහා පවත්වන ලද අතර සම්මානලාභී ඩිජිටල් මාධ්‍ය පුහුණුකරු ආචාර්ය ප්‍රසාද් පෙරේරා මහතා විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදි.

08. ''ජර්මනියේ උසස් අධ්‍යාපනය සහ පර්යේෂණ අරමුදල්''

මෙම වැඩසටහන පස්වරු 2.30 සිට 3.30 දක්වා කළමනාකරණ පීඨ ශ්‍රවණාගාරයේදී පැවැත්වුණු අතර, ශ්‍රී ලංකා ජර්මානු තානාපති කාර්යාලයේ ඩී.ඒ.ඒ.ඩී නියෝජිත නදීෂා ආර් පල්ලියගුරු මහතා විසින් වැඩසටහන මෙහෙයවන ලදි.

.

09. එළිමහන් පුහුණු වැඩසටහන්

කෘෂි විද්‍යා පීඨය, වෛද්‍ය පීඨය, කළමනාකරණ අධ්‍යයන, සහ ව්‍යවහාරික විද්‍යා පීඨය යන පීඨයන්හි නවක ශිෂ්‍යයින් සඳහා එළිමහන් පුහුණු වැඩසටහනක් මිහින්තලය විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදි. මෙම වැඩසටහන් වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයෙහි උපදේශක ජාලිය රත්නායක මහතා සහ ඒ. එම්. දිසානායක මහත්මිය විසින් මෙහෙයවන ලදි.

10. වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සාරාංශය - 2022

වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව
නේවාසිකාගාර වැඩසටහන් - (ජීවන කුසලතා වැඩසටහන/විවාහ ජීවිතයේ කුසලතා)	20
ජීව දත්ත පත්‍රිකාවක් සැකසීම සහ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීම.	8
කර්මාන්ත ප්‍රවීනයන්ගේ වෙබිනර් වැඩසටහන	10
වෘත්තීය මාර්ගෝපදේශන හඳුන්වා දීමේ වැඩසටහන	06
ඉගෙනුම් තාක්ෂණ පිළිබඳ වැඩසටහන	01
අනධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා වැඩ ජීවිතය සමබර කර ගැනීමේ වැඩසටහන	06
වෘත්තීය සංවර්ධන වැඩසටහන්	12
එළිමහන් පුහුණු වැඩසටහන් සහ නායකත්ව පුහුණු වැඩසටහන්	04
ව්‍යවසායකත්ව වැඩසටහන්	01
ප්‍රජා සමාජ රැස්වීම්	18
වෙනත් වැඩසටහන්	13
වෘත්තීය උපදේශන සහ උපදේශන සැසි	583

11. පුද්ගලික/වෘත්තීය උපදේශනය සහ උපදේශන සැසි පිළිබඳ විස්තර

මාසය	සිසුන්	දුරකථන හරහා	වෙනත්	එකතුව
ජනවාරි		40	16	56
පෙබරවාරි	04	46	19	69
මාර්තු	9	27	12	48
අප්‍රේල්		25	11	36
මැයි		27	05	32
ජූනි		34	01	35
ජූලි	02	40	7	49
අගෝස්තු	06	47	15	68
සැප්තැම්බර්	11	27	08	46
ඔක්තෝම්බර්	13	31	01	45
නොවැම්බර්	32	28	01	61
දෙසැම්බර්	17	20	01	38
එකතුව	**94**	**392**	**97**	**583**

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

රටේ පවතින අයහපත් තත්ත්වය නිසා සිසුන් නොමැති වීම සහ මූල්‍ය පහසුකම් නොමැති කම හේතුවෙන් වෘත්තීය මාර්ගෝපදේශන උපදේශකවරුන්ට නිවසේ සිට වැඩ කිරීමට සිදු වූ අතර කුසලතා සංවර්ධන පුහුණු කිරීම්, වැඩමුළු, සහ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් සැලසුම් කළ පරිදි පැවැත්වීමට නොහැකි විය. නමුත්

වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ අනෙකුත් සියළුම සේවාවන් සුමි තාක්ෂණය හා දුරකථන මාර්ග ඔස්සේ සිදු කරන ලදි.

ඈ. අනාගත දැක්ම - 2023 වෘත්තීය මාර්ගෝපදේශණ ඒකකයේ ක්‍රියාකාරි සැලැස්ම

අනු අංකය.	වැඩසටහනේ නම	වැඩසටහනේ කාරණය	දිනය
01	උපාධි අපේක්ෂකයින් සඳහා ජීවන කුසලතා'' නේවාසිකාගාර වැඩසටහන	මෘදු කුසලතා සහ පෞරුෂ සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීම - වැඩසටහන් 20ක් පැවැත්වීම.	අවුරුද්ද පුරා
02	නාට්‍ය චිකිත්සක වැඩමුළු	ඉදිරිපත් කිරීමේ කුසලතා සහ ආතතිය මඟ හැරීම සඳහා - වැඩසටහන් 03ක් පැවැත්වීම.	2023 සෙප්තැම්බර්, ඔක්තෝම්බර්, නොවැම්බර්
03	තනි පුද්ගල වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශන	අභිරුචිකරණ වෘත්තීය මාර්ගෝපදේශන විසඳුම් ලබා දීම.	අවුරුද්ද පුරා
04	මෘදු කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන්	මෘදු කුසලතා වර්ධනය	පෙබරවාරි, මාර්තු, මැයි. අගෝස්තු 2023
05	කර්මාන්ත ප්‍රවීනයන්ගේ වෙබිනර් වැඩසටහන් මාලාව	සෘජුව කර්මාන්තයන්ට නිරාවරණය වීමේ අවස්ථාවන් ලබා දීම.	අවුරුද්ද පුරා
06	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨ සිසුන් සඳහා රැකියාවකට ඉල්ලුම්පත් සැකසීම, සම්මුඛ පරීක්ෂණයකට මුහුණදීම සහ සාරාංශ ලිවීම පිළිබඳ වැඩසටහන	අවසන් වසර සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.	ජනවාරි - 2023
07	කළමනාකරණ අධ්‍යන පීඨ සිසුන් සඳහා රැකියාවකට ඉල්ලුම්පත් සැකසීම, සම්මුඛ පරීක්ෂණයකට මුහුණදීම සහ සාරාංශ ලිවීම පිළිබඳ වැඩසටහන	අවසන් වසර සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.	මාර්තු - 2023
08	ව්‍යවහාරික විද්‍යා පීඨ සිසුන් සඳහා රැකියාවකට ඉල්ලුම්පත් සැකසීම, සම්මුඛ පරීක්ෂණයකට මුහුණදීම සහ සාරාංශ ලිවීම පිළිබඳ වැඩසටහන	අවසන් වසර සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.	මැයි - 2023
09	කෘෂිකර්ම පීඨ සිසුන් සඳහා රැකියාවකට ඉල්ලුම්පත් සැකසීම, සම්මුඛ පරීක්ෂණයකට මුහුණදීම සහ සාරාංශ ලිවීම පිළිබඳ වැඩසටහන	අවසන් වසර සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.	නොවැම්බර් - 2023
10	තාක්ෂණ පීඨ සිසුන් සඳහා රැකියාවකට ඉල්ලුම්පත් සැකසීම, සම්මුඛ පරීක්ෂණයකට මුහුණදීම සහ සාරාංශ ලිවීම පිළිබඳ වැඩසටහන	අවසන් වසර සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.	අගෝස්තු - 2023
11	කෘෂිකර්ම පීඨ සිසුන් සඳහා කථන ශිල්ප හැකියාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන	සිසුන්ගේ පොදු කථන හැකියාව වැඩි දියුණු කිරීම	ජනවාරි - 2023
12	තාක්ෂණ පීඨ සිසුන් සඳහා කථන ශිල්ප හැකියාව වැඩිදියුනු කිරීමේ වැඩසටහන	සිසුන්ගේ පොදු කථන හැකියාව වැඩි දියුණු කිරීම	මාර්තු - 2023
13	ව්‍යවහාරික විද්‍යා පීඨ සිසුන් සඳහා කථන ශිල්ප හැකියාව වැඩිදියුනු කිරීමේ වැඩසටහන	සිසුන්ගේ පොදු කථන හැකියාව වැඩි දියුණු කිරීම	මැයි - 2023

14	කළමනාකරණ පීඨ සිසුන් සඳහා කථන ශිල්ප හැකියාව වැඩිදියුනු කිරීමේ වැඩසටහන	සිසුන්ගේ පොදු කථන හැකියාව වැඩි දියුණු කිරීම	ජුලි - 2023
15	වෘත්තීය පොල	රැකියා සහ සීමාවාසික අවස්ථා සොයා ගැනීම	ජුලි - 2023
16	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨ සිසුන් සඳහා කථන ශිල්ප හැකියාව වැඩිදියුනු කිරීමේ වැඩසටහන	සිසුන්ගේ පොදු කථන හැකියාව වැඩි දියුණු කිරීම	ඔක්තෝම්බර් - 2023
17	කෘෂිකර්ම පීඨ සිසුන් සඳහා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන	සිසුන්ගේ පෞරුෂත්ව සංවර්ධනය	නොවැම්බර් - 2023
18	තාක්ෂණ පීඨ සිසුන් සඳහා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන	සිසුන්ගේ පෞරුෂත්ව සංවර්ධනය	අගෝස්තු - 2023
19	ව්‍යවහාරික විද්‍යා පීඨ සිසුන් සඳහා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන	සිසුන්ගේ පෞරුෂත්ව සංවර්ධනය	ජුලි - 2023
20	කළමනාකරණ අධ්‍යන පීඨ සිසුන් සඳහා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන	සිසුන්ගේ පෞරුෂත්ව සංවර්ධනය	මැයි . 2023
21	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨ සිසුන් සඳහා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන	සිසුන්ගේ පෞරුෂත්ව සංවර්ධනය	පෙබරවාරි - 2022
22	වෘත්තීමය සහ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන වැඩසටහන්	ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන් 06 ක්	ජනවාරි, මාර්තු, ජුනි, අගෝස්තු ඔක්තෝම්බර්, දෙසැම්බර්
23	වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මඟින් මාර්ගගත රැකියා ද්වාරය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.	වෘත්තීය මාර්ගෝපදේශ සම්බන්ධ තොරතුරු හුවමාරු කිරීම.	අවුරුද්ද පුරා
24	වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය විසින් පවත්වනු ලබන පාඨමාලා	වෘත්තීය මාර්ගෝප දේශනය සහ ඉගැනුම් ක්‍රම පිළිබඳ කෙටි පාඨමාලා එන්. එල්. පී. හඳුන්වා දීමේ කෙටි පාඨමාලා	අවුරුද්ද පුරා
25	ග්‍රැවල් සමාජය	පොදු කථන කුසලතා වැඩි දියුණු කිරීම.	අවුරුද්ද පුරා
26	රොටරැක්ට් සමාජය	නායකත්ව කුසලතාව වැඩි කිරීම.	අවුරුද්ද පුරා
27	නිදහස් සහ විවෘත මෘදුකාංග සමාජය	තාක්ෂණ සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම.	අවුරුද්ද පුරා
28	ආර්ථික හා ව්‍යාපාර පිළිබඳ ජාත්‍යන්තර ශිෂ්‍ය සංගමය	සිසුන්ගේ නායකත්ව කුසලතාව වැඩි දියුනු කිරීම.	අවුරුද්ද පුරා
29	ප්ලාස්ටික් වලින් තොර සමාජයක්	නායකත්ව කුසලතාව වැඩි කිරීම.	අවුරුද්ද පුරා
30	කදු නැගීමේ සමාජය	නායකත්ව කුසලතාව වැඩි කිරීම සහ කණ්ඩායම් වැඩ කිරීමේ කුසලතා වැඩි දියුණු කිරීම	අවුරුද්ද පුරා
31	''ඉන්ෆෝකස්'' ඡායාරූප සංගමය	ඡායාරූපකරණ කුසලතාව වැඩි දියුණු කිරීම.	අවුරුද්ද පුරා
32	පුහුණු කරන්නන් පුහුණු කිරීමේ වැඩ සටහන	සිසුන් අතර පුහුණුකරුවන්ගෙ කුසලතාව වැඩි දියුණු කිරීම.	අවුරුද්ද පුරා

26. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යන මධ්‍යස්ථානය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පෞරාණික අගනගරයක් වූ අනුරාධපුර නගරයට කිලෝමීටර් 20ක් පමණ නැගෙනහිර දෙසට වූ මිහින්තලය පරිශ්‍රයේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය ස්ථාපනය කොට තිබේ. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය පීඨ 06කින් සමන්විත වන අතර ඒවා කෘෂිකර්ම පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, කළමනාකරණ අධ්‍යන පීඨය, වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය, සාමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය සහ තාක්ෂණ පීඨයවේ. කෘෂිකර්ම පීඨය පුලියන්කුලමද වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය සාලියපුර ද ස්ථාපනය කොට ඇති අතර අනෙකුත් සියළුම පීඨ, ඒකක සහ මධ්‍යස්ථාන මිහින්තලයේ විශ්වවිද්‍යාල ප්‍රධාන පරිශ්‍රයතුල ස්ථාපනය කොට තිබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිසුන්හට බාහිර වැඩසටහන් මඟින් පුළුල් පරාසයක්තුල විහිදුණු ඉගැනුම් අවස්ථා ලබා දීමට නිශ්චිත මාර්ගෝපදේශ සකස්කොට තිබෙනුයේ නිපුණතා ඇති, දැනුමැති සහ රැකියා කළ හැකි උපාධිධාරීන්, ඩිප්ලෝමාලාධාරීන් සහ සහතිකපත්‍ර ධාරීන් බිහි කිරීමේ අභිප්‍රාය ඇතිවය. බාහිර අධ්‍යන වැඩසටහන් වඩාත් ඵලදායි හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා වෙනම පරිපාලන ව්‍යුහයක් ස්ථාපනය කර දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම් සභාවෙන් ඉල්ලීම් කර තිබේ. එමගින් පීඨ සහ අධ්‍යනාංශ මගින් සිදුකෙරෙන වැඩ ප්‍රමාණය අඩුකර ගත හැකිය. විශ්වවිද්‍යාලයේ විවිධ පීඨ මගින් බාහිර උපාධි වැඩසටහන් කිහිපයක් සහ සහතිකපත්‍ර සහ ඩිප්ලෝමා මට්ටමේ විස්තාරිත වැඩසටහන් පවත්වනු ලබයි.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යන මධ්‍යස්ථානය, විශ්වවිද්‍යාලීය බාහිර අධ්‍යන වැඩසටහන්වල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සඳහා ස්ථාපිත ස්වාධීන පරිපාලන ව්‍යුහයවේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම් සභාවේ චක්‍රලේඛ අංක 932 අනුව වර්ෂ 2011 ඔක්තෝම්බර් 24 වන දින පැවති 155වන පාලක සභා රැස්වීමේ අනුමැතියෙන් විශ්වවිද්‍යාලයීය දුරස්ථ හා අඛණ්ඩ මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදි. ආරම්භයේ සිට වර්ෂ 2014 මාර්තු 31 දක්වා දුරස්ථ හා අඛණ්ඩ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් ව්‍යවහාරික විද්‍යා පීඨයේදි සිදුකරන ලදි. ඉදිකරන ලද දුරස්ත හා අඛණ්ඩ අධ්‍යන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල 2023.01.20 දින විවෘත කිරීමට බලාපොරොත්තුවේ.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයෙහි දැක්ම


''දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපනයේ ජාත්‍යන්තරව පිළිගත් විශිෂ්ටතම මධ්‍යස්ථානයක් වීම''

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයෙහි මෙහෙවර

''සියලු වයස් කාණ්ඩවල විද්වතුන්ට ඉහළ ඉල්ලුමක් ඇති උසස් අධ්‍යාපන වැඩසටහන් සඳහා ප්‍රවේශය ලබා දීම සහ බුද්ධිමය වශයෙන් උත්තේජනය කරන අධ්‍යයන පරිසරයක් තුළ වෘත්තීය දියුණුව සඳහා උසස් අධ්‍යාපනය අපේක්ෂා කරන වැඩිහිටි ඉගෙනුම්කරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම තුළින් දැනුම පදනම් වූ සමාජයක් ගොඩනැගීමට දායක වීම.''

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය හි පරිපාලන ව්‍යුහය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශයන්ට අනුව පහත දැක්වේ.

දු.අ.අ.ම හි පරිපාලන ව්‍යුහය



* අනාගතයේදී දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය තවදුරටත් පුළුල් කිරීමත් සමඟ මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කෙරෙනු ඇත.

1.1. දුරස්ථ හා අඛණ්ඩ මධ්‍යස්ථානයෙහි කළමනාකරණ කමිටුව

පහත සඳහන් දින තුළ කළමනාකරණ කමිටු රැස්වීම් පහක් වර්ෂ 2022දී පවත්වන ලදි.

1. 35 වැනි කළමනාකරණ කමිටු රැස්වීම 2022-01-26 වන දින පවත්වන ලදි
2. 36 වැනි කළමනාකරණ කමිටු රැස්වීම 2022-03-10 වන දින පවත්වන ලදි
3. 37 වැනි කළමනාකරණ කමිටු රැස්වීම 2022-05-12 වන දින පවත්වන ලදි
4. 38 වැනි කළමනාකරණ කමිටු රැස්වීම 2022-09-13 වන දින පවත්වන ලදි
5. 39 වැනි කළමනාකරණ කමිටු රැස්වීම 2022-11-10 වන දින පවත්වන ලදි

1.2 දැනට ක්‍රියාත්මක වැඩසටහන්

දුරස්ථ හා අඛණ්ඩ මධ්‍යස්ථානය මඟින් 2022 වර්ෂයේ උපාධි පාඨමාලා තුනක් ඇතුළු වැඩසටහන් 10ක් පවත්වාගෙන ගිය අතර ඒ සඳහා 2022 වසර තුල සිසුන් 2477ක් බඳවාගෙන ඇත.

අධ්‍යයන වැඩසටහන	අධ්‍යයන වර්ෂය	නව බඳවා ගැනීම්			සිසුන් බඳවා ගැනීම (ලියාපදිංචි වූ සම්පර්ණ සිසුන් සංඛ්‍යාව)		
		ජනවාරි - දෙසැම්බර් 2022*			(2022 දෙසැම්බර් 31 දිනට)		
		පිරිමි	ගැහැණු	එකතුව	පිරිමි	ගැහැණු	එකතුව
විද්‍යාවේදී බාහිර උපාධි පාඨමාලාව ජීව විද්‍යාව	2022	32	99	131	15	42	57
විද්‍යාවේදී බාහිර උපාධි පාඨමාලාව භෞතික විද්‍යාව	2022	24	29	53	9	11	20
ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි වැඩසටහන (ඇදියර VIII)	2022	286	617	903	286	617	903
ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි වැඩසටහන (ඇදියර VII)	2022				237	544	781
ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි වැඩසටහන (ඇදියර VI)	2022				263	535	798
ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි වැඩසටහන (ඇදියර V)	2022				299	251	550
ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි වැඩසටහන (ඇදියර IV)	2022				277	406	683
ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි වැඩසටහන (ඇදියර III)	2022				320	343	663
ඉංග්‍රීසි ඩිප්ලෝමා බාහිර පාඨමාලාව	22/23	149	701	850	127	657	784
ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව	22/23	62	234	296	52	195	247
දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව	22/23	18	112	130	13	94	107
සහතික පත්‍ර දෙමළ පාඨමාලාව	22/23	5	42	47	3	36	39
තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	-	-	-	-	-	-	-
තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	-	-	-	-	-	-	-
පරිසර කළමනාකරණ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	22/23	38	29	67	28	16	44

ආ. ජයග්‍රහණයන්

- **දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාන මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැගිලි සංකීර්ණය.**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාන මධ්‍යස්ථානය සඳහා අනුරාධපුර නගරයේ ඉදිකෙරුණු නව ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නිම කර ඇති අතර භාරදීමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවති.

- **අධ්‍යයන මධ්‍යස්ථානය සඳහා පොලොන්නරුවේ ඉඩම.**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාන මධ්‍යස්ථානය සඳහා අධ්‍යාන මධ්‍යස්ථානයක් ඉදිකිරීමට පොලොන්නරුව නගරයේ නව ඉඩමක් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයට ලබා ගැනීම.

- **දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාන මධ්‍යස්ථානය සඳහා නව වෙබ් අඩවියක්.**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාන මධ්‍යස්ථානය සඳහා නව වෙබ් අඩවියක් හදුන්වා දෙන ලදි.

- **බාහිර වැඩසටහන්වල ප්‍රථීපල නිකුත් කිරීම.**

කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ වුවද බාහිර උපාධි සහ දිගු වැඩසටහන් වල ප්‍රථීපල ප්‍රමාදයකින් තොරව කිකුත් කිරීම.

- **බාහිර වැඩසටහන් පැවැත්වීම**

කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් බොහෝ බාහිර වැඩසටහන් අථත්‍ය ක්‍රමවේදය ඔස්සේ සහ භෞතික ක්‍රම වේදටය පැවැත්වීම.

- **පහත සඳහන් වැඩසටහන් සඳහා නවක සිසුන් බඳවා ගැනිම පහත පරිදි ඉහළ නංවා ඇත.**

අනු අංකය	වැඩසටහන	2022 වර්ෂයේ බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව	2022 වර්ෂයේ සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව
01	ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය (අටවන කණ්ඩායම බඳවා ගැනීම)	903	154
02	ඉංග්‍රීසි ඩිප්ලෝමා (විස්තාරන) වැඩසටහන	784	497

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- කොවිඩ් 19 වසංගතය හේතුවෙන් බාහිර වැඩසටහන් පවැත්වීමේ ප්‍රගතිය මන්දගාමීව සිදුවීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයට නිසි ලෙස ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය භෞතික හා මානව සම්පත් ප්‍රමාණවත් නොමැති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 932 මගින් තීරණය කරනු ලැබූ කාර්ය මණ්ඩල ප්‍රමාණයට අනුවද සිටිය යුතු අවම පරිපාලන, මූල්‍ය, ලිපිකාර හා තාක්ෂණික කාර්ය මණ්ඩලයද නොමැත.
- ස්වාධීන, කාර්‍යක්ෂම හා ඵලදායී මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වීමට ඇති බාධාවන්
- බාහිර අධ්‍යන මධ්‍යස්ථාන සම්බන්ධ ගැටළු
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ සමීක්ෂණ මණ්ඩලය හා වැඩසටහන් සම්බන්ධීකාරක අතර සම්බන්ධීකරණයට අදාල ගැටළු

ඈ. අනාගත දැක්ම

- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය සඳහා නව ගෙවීම් ද්වාර පද්ධතියක් හදුන්වා දීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය පූර්ණ නිදහස් පරිපාලන ආයතනයක් ලෙස පුළුල් කිරීම මඟින් අධ්‍යයන වැඩසටහන් වඩාත් හොඳින් ක්‍රියාත්මක කරීමට පහසුකම් සැලසීම.
- ව්‍යාපාර පරිපාලනවේදී උපාධි වැඩසටහන සඳහා විෂය මාලා සංශොධනය ගුණාත්මක අධ්‍යපනයක් සඳහා සිදු කිරීම.
- ශාලා සහ බාහිර අධ්‍යන මධයස්ථානවල පහසුකම් වැඩි දියුණු කිරීම.
- දත්ත සමුදාය කළමනාකරණ පද්ධතිය දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය හදුන්වා දීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ සමීක්ෂණ මණ්ඩල සහ වැඩසටහන් සම්බන්ධීකාරක අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරිමග
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ අරමුදල වඩාත් කාර්යක්ෂම හා ඵලදායි කටයුතු සඳහා යෙදවීම. .
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ ශිෂ්‍ය අත්පොත සහ ශීෂ්‍ය වාර්තා පොත යාවත්කාලීන කිරීමග
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ පරිපාලන හා ලිපිකරු කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්විමග

27. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වර්ෂ 2005 දී ස්ථාපනය කරන ලදි. මෙම මධ්‍යස්ථානයේ අරමුණ වනුයේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ සියළුම අංශ සඳහා අඛණ්ඩ, අවශ්‍යතා පදනම් කරගත් ඉගැනුම් සහ වෘත්තීය සංවර්ධන අවස්ථා සැලසීමයි. කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකයෙහි ප්‍රධාන අරමුණ වනුයේ විශ්වවිදයාලයේ ඉගැන්වීම් සහ ඉගනුම් ක්‍රියාවලිය වඩාත් ඵලදායි ලෙසද, වඩාත් යෝග්‍ය ලෙසද, සිසුන් මුලික කරගනිමින් සහ නව්‍ය ඉගැන්වීම් ක්‍රමවේදයන් ඔස්සේ අලුතින් බඳවා ගන්නා අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් පුහුණු කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ජාත්‍යන්තර ප්‍රමිතීන් කරා ලඟා වීමයි. තවද, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් අතර වඩාත් ඵලදායි හා කාර්යක්ෂම කාර්ය සාධනයක් සඳහා අවශ්‍ය කුසලතා සහ නිපුණතා වර්දනය ඇති කිරීම සහ ප්‍රවර්ධනය කිරීමට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය කැපවී සිටී.

දැක්ම

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ දැක්ම වන්නේ වෘත්තීය සංවර්ධනයේ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් වීමයි.

මෙහෙවර

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ මෙහෙවර වන්නේ සේවකයින්ට කැපවූ, අභිප්‍රේරිත සහ දක්ෂ වෘත්තිකයන් බවට පත්වීමට සුදුසු පුහුණුවක් සහ සංවර්ධන අවස්ථා ලබා දීමයි.

ඉලක්කය

විශ්වවිද්‍යාලය තුළ සිටින සියලුම කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩ, අවශ්‍යතා මත පදනම් වූ ඉගෙනුම් සහ වෘත්තීය සංවර්ධන අවස්ථා ලබා දීම.

කාර්යය මණ්ඩලය

- ආචාර්ය ලලිත් සේනාරත්න - අධ්‍යක්ෂ
- ඒ. ජී. එස්. එන්. අබේකෝන මෙනවිය - ආධුනික කථිකාචාර්ය
- ඊ. එම්. ඒ. පී. ඒකනායකමයා - කළමනාකරණ සහකාර
- ඒ. ඩබ්. ජී. අයි. එම්. අබේරත්නමයා - වැඩ සහයක
- ඩී. එම්. සී. ඩී. දිසානායක මහා - කාර්යාල සහයක

ආ. ජයග්‍රහණයන්.

2022 වර්ෂයේදී කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පහත සඳහන් වැඩසටහන් සම්පූර්ණ කරන ලදි.

අනු අංකය	වැඩසටහනේ නම	දිනය	කාර්ය මණ්ඩල කාණ්ඩය	සහභාගි වූ සංඛ්‍යාව
01	අනධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ මෘදු කුසලතා සංවවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන	2022 පෙබරවාරි 1, 08, 22 සහ මාර්තු දෙවන දින	විශ්වවිද්‍යාලයේ වැඩ සහයකියින් සඳහා	210
02	කළමනාකරණ සහයකයින් සහ තාක්ෂණික නිළධාරින්ගේ මෘදු කුසලතා සංවවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන	2022 මාර්තු 22, අගෝස්තු 1. 5, සහ 7	කළමනාකරන සහකාර සහ කාර්මික නිළධාරින්	180
03	නායකත්වය සහ වැඩකරණ ස්ථානයේ එටදායිතා කුසලතා මැයෙන් විධායක නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන.	2022 මැයි 5	විශ්වවිද්‍යාලයීය විධායක නිළධාරීන්	23
04	අධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා උසස්වීම් පිළිබඳ නව්‍යතම වැඩ සටහන (උසස් අධ්‍යාපනය ඉගැන්වීමේ සහතිකය) - 2022	2022 මැයි 09 -2022 ඔක්තෝබර්	අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින්	31
05	ඡායා පිටපත් සහ මුද්‍රණ යන්ත්‍ර භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන	2022 මැයි 18	අනධ්‍යන කාර්ය මණ්ඩලය	30

06	විධායක නිළධාරීන් සඳහා තොරතුරු තාක්ෂණ පුහුනු වැඩසටහන	2022 ජුනි 16	විශ්වවිද්‍යාලයීය විධායක කාර්ය මණ්ඩලය සඳහා	35
07	අර්බුදකාරී තත්වය තුල වෙබිනාර්	2022 පුලි 14, 21, 28, අගෝස්තු 23 සහ සැප්තැම්බර් 01	විශ්වවිද්‍යාලයේ සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින්	25
08	අධ්‍යන විගනණය පිළිබඳ වැඩ මුළුව	2022 සැප්තැම්බර් 23	අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින්	37
09	අධුනික කථිකාචාර්ය වරුන් සඳහා පුහුණු වැඩසටහන (කාර්යක්ෂම හා ඵලදායි ශාස්ත්‍රඥයෙක් වන්නේ කෙසේද)	2022 සැප්තැම්බර් 23	පරිවාස අධ්‍යන කාර්ය මණ්ඩල	30
10	විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය උපදේශකයින් සඳහා පුහුනු වැඩසටහන	2022 සැප්තැම්බර් 27	විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය උපදේශකයින් සඳහා	26
11	කළමනාකරණ සහයකයින් සඳහා කාර්යාල ලිපිගොනු කළමනාකරණ ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩසටහන	2022 සැප්තැම්බර් 29	කළමනාකරණ සහයකයින්	45
12	''උසස් අධ්‍යාපන ආයතන අන්තර් ජාතික කරණය'' මැයෙන් අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා වැඩමුළුව	28th October 2022 2022 ඔක්තෝබර් 28	අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින්	18
13	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන	2022 නොවැම්බර් 18	විහ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සාමාජිකයින්	75
14	ස්ත්‍රී පුරුෂ සමානාත්ම තාවය පිළිබඳ සැසියක් ශ්‍රී ලංකා රජරට විශ්වවිධ්‍යාලයේදී පැවැත්වීම.	2022 දෙසැම්බර් 06	අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින්	29
15	ලේඛන පවත්වාගෙන යාමේ ගුණාත්මක භාවය වැඩි කිරීමේ සම්මත ක්‍රම වේද පිළිබඳ වැඩ මුළුව	2022 දෙසැම්බර් 19	විශ්වවිද්‍යාලයීය අධ්‍යක්ෂක වරුන්, තත්ත්ව සමීක්ෂණ සම්බන්ධීකාරකයින්. අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ විධ්‍යායක නිළධාරින්	30
16	උපකරණවල තාක්ෂණික අංශ පිළිබඳ වැඩමුළුව	2022 දෙසැම්බර් 21	සහායක අනධ්‍යනකාර්ය මණ්ඩල සාමාජිකයින්	31

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

අ. විශේෂයෙන්ම වසංගත තත්ත්වය තුළ ගමන් සීමා කිරීම් සහ විශ්වවිද්‍යාලය වසා දැමීම හේතුවෙන් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් වැඩසටහන් භාරදීම සහ සමුපුර්ණ කිරීමේ ප්‍රමාදයක් ඇතිවිම.

ආ. වසංගත තත්ත්වය හේතුවෙන් පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකයින් ගෙන්වා ගැනීම අභියෝගයක් විය. මේ සඳහා සැලසුම් කර තිබූ සමහර වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.

ඇ. අනාගත දැක්ම

- ඉදිරි වර්ෂය තුළදී සියලුම කාර්ය මණ්ඩල කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ස්ථාවර වාර්ෂික පුහුණු වැඩසටහන් සංඛ්‍යාව වැඩි කිරීම.
- අනෙක් විශ්වවිද්‍යාලවල සාමාජිකයින්ටද සහභාගි විය හැකි වැඩසටහන් හදුන්වා දී එයින් ලැබෙන ආදායම් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිරි ක්‍රියාකාරකම් සඳහා භාවිතා කිරීම. ග
- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැඩි අවධානයක් යොමු කර අනධ්‍යන කාර්ය මණ්ඩල පුහුණු වැඩ සටහන් ඒකකයක් ස්ථාපනය කිරීම.
- කාර්යක්ෂම කාර්යාල පරිශ්‍රයක් හා අසමතුලිතතාව අවම කිරීම සැලසුම් කිරීම.

28. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පරිගණක මධ්‍යස්ථානය 1996 විශ්වවිද්‍යාලයේ ආරම්භයත් සමඟ උපාධි අපේක්ෂකයන්ගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ (ICT) කුසලතා වැඩිදියුණු කිරීම සඳහා ස්ථාපිත කරන ලදි. පරිගණක මධ්‍යස්ථානයේ පරිපාලන කටයුතු සෘජුවම උප කුලපතිතුමියගේ අධීක්ෂණය යටතේ සිදුකරන ලැබීය. එහි ක්‍රියාකාරකම් උපකුලපතිතුමිය විසින් පත් කරන ලද පරිගණක මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක මගින් සිදු කරයි. කළමණාකරන පීඨයේ සහ සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ උපාධි අපේක්ෂකයින්ගේ මූලික පරිගණක හඳුන්වාදීමේ වැඩසටහනක් පවත්වා ගෙන යාමට පරිගණක මධ්‍යස්ථානය මූලික වී කටයුතු කරයි. විශ්වවිද්‍යාලයේ පුළුල් විමත් සමඟ පරිගණක මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ (ICT) පහසුකම් සපයන මධ්‍යස්ථානයක් බවට පත්විය. මෙහි මූලික අරමුණ ව්‍යාප්ත විමත් සමඟ ඇතිවන පරිපාලනමය ගැටළු අවමකර ගැනීම සඳහා වර්ෂ 2011දී පාලක සභාව මගින් පරිගණක මධ්‍යස්ථානයේ අධ්‍යන හා පරිපාලන කටයුතු සඳහා අධ්‍යක්ෂකවරයෙකු පත්කරනු ලැබීය. අධ්‍යක්ෂකවරයා තොරතුරු සන්නීවේදන තාක්ෂණය (ICT) පිළිබඳ මනා දැනුම ඇති අධ්‍යන කාර්යමණ්ඩලයේ සාමාජිකයෙකි. නම් කරන ලද අධ්‍යක්සකවරයෙකුගේ ධූර කාලය වසර තුනකි.

පරිගණක මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂක වරයෙකු, පරිගණක තාක්ෂණ උපදේශකවරයෙකු, පද්ධති විශ්ලේෂකයෙකු, සහකාර ජාල කළමනාකරුවෙකු, තාක්ෂණ නිළධාරීන් දෙදෙනෙක් සහ විද්‍යාගාර සහයකයෙකුගෙන් සමන්විත වේ. වර්තමාන අධ්‍යක්ෂකවරයා වර්ෂ 2022 ඔක්තොම්බර් මස පළමු වන දින සිට එම ධුරයේ කටයුතු කරයි.

ආ. ජයග්‍රහණයන්

තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය මගින් මිහින්තලේ පරිශ්‍රයේ පිහිටි සියළුම පීඨවල අධ්‍යයන කටයුතු ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙන ලදි. විශ්වවිද්‍යාලයේ සෑම කොටසකටම ජාල පහසුකම් සැපයීම, විශ්වවිදයාල කාර්ය මණ්ඩලය විසින් පරිගහරණය කරන පරිගණක යන්ත්‍ර අළුත් වැඩියා කිරීම සඳහා පරිගණක නඩත්තු ඒකකයක් ක්‍රියාත්මක කිරීම, විශ්වවිදයාල වෙබ් අඩවිය සහ නිල ෆේස්-බුක් ගිණුම නඩත්තු කිරීම, සිසුන්ට හා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ස්ථීර කාර්ය මණ්ලය සඳහා විූත් තැපැල් ගිණුම් සැපයීම සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා සූම් ගිණුම් ලබා දීම මේ අතර ප්‍රධාන වේ. කොවිඩ් 19 වසංගතයෙන් පසු අධ්‍යන කටයුතු සාර්ථකව පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය තොරතුරු තාක්ෂණ ඒකකය විසින් අඛණ්ඩ සේවයක් සපයන ලදි.

1. පරිපාලන ගොඩනැගිල්ලේ සිට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය වෙත ප්‍රධාන පරිගණක (සර්වර්) කාමරය මාරු කිරීමේ කටයුත්තේ විහාල කොටසක් සම්පූර්ණ කරන ලදි

2. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා වෙනම නව පිවිසුම් දොරටුවක් ඉදි කිරීම. එමගින් සතියේ දින හතේ පැය 24ම පහසුකම් සැලසීමේ හැකියාව අප හට ලැබී තිබේ.

3. කාර්ය මණ්ඩල සංවර්ධන වැඩමුළු දෙකක් පැවැත්විණි. එල්කේනොග් මඟින් සංවිධානය කරන ලද ජාල ආරක්ෂාව පිළිබඳ වැඩමුළුවට හර්ෂ රාජකරුණා මහතා සහභාගි වූ අතර ලර්න් මගින් සංවිධානය කරන ලද ලිනක්ස් පරිපාලන වැඩසටහන සඳහා ආර්. ඩබ්. ටී. ජී. රාජපක්ෂ මහතා සහභාගි විය.

4. නව පත්වීම්- තාක්ෂණ නිලධාරිවරයෙකු වශයෙන් ආර්. ඩබ්. ටී. ජී. රාජපක්ෂ මහතා 2022 පෙබරවාරි මාසයේදි පත් කරන ලදි

5 . ''කඩදාසි රහිතව රාජකාරි කරන්නේ කෙසේද'' යන මැයෙන් පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළුවක් පවත්වන ලදි.

6. ඊ.ආර්.පී. වැඩමුළු පැවැත්වීම සඳහා පරිගණක විද්‍යාගාර සැපයීම.

7. මධ්‍යස්ථානය නැරඹීමට පැමිණි පාසල් ශිෂ්‍යයින් සඳහා වැඩමුළුවක් පැවැත්වීම.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- විශ්වවිද්‍යාලය විසින් සිදු කෙරෙන විදුලි රැහැන් ඇදීමේ ප්‍රමාදය නිසා ප්‍රධාන පරිගණක (සර්වර්) කාමරය වෙනත් ස්ථානයකට රැගෙන යාමේ කටයුත්ත සමුපූර්ණ කල නොහැකි විය.
- පරිගණක යන්ත්‍ර අළුත්වැඩියාව සඳහා අමතර කොටස් ලබා ගැනීමේ දී දුෂ්තරතාවලට මුහුණ දීමට සිදුවේ.

ඈ. අනාගත දැක්ම

- පරිපාලන ගොඩනැගිල්ලේ සිට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය වෙත ප්‍රධාන පරිගණක (සර්වර්) කාමරය මාරු කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීම.
- වෙබ් අඩවිය වැඩි දියුණු කිරීම.
- විශ්වවිද්‍යාලයේ සම්පත් වගකීමෙන් පරිහරණය කිරීම සම්බන්ධයෙන් නව තාක්ෂණයන්ට අනුගත වීම සඳහා නව ප්‍රතිපත්ති සහ වැඩසටහන් හඳුන්වා දීම.
- විශ්වවිද්‍යාල ජාලය පුළුල් කිරීම.
- මහාචාර්ය ඒකකයේ ජාල පහසුකම් ස්ථාපනය කිරීම.

2022 වසරේ කාර්ය සාධන වාර්තාව

2022 වසරේදි පරිගණක නඩත්තු එකකයෙහි අලුත්වැඩියා කරන ලද පරිගණක යන්ත්‍ර පිළිබඳ සාරාංශය

අයිතමය	අලුත්වැඩියා කරන ලද අයිතම සංඛ්‍යාව
මධ්‍යම සැකසුම් ඒකක	81
අඛණ්ඩ බල සැපයුම් යන්ත්‍ර	69
ලැප්ටොප් පරිගණක	28
මුද්‍රණ යන්ත්‍ර	3

2022 වසරේදි උපාධි අපේක්ෂකයින් සඳහා නිකුත් කරන ලද විද්‍යුත් තැපැල් ලිපිනයන් සංඛ්‍යා පහත දැක්වේ.

පීඨය	විද්‍යුත් තැපැල් ලිපින සංඛ්‍යාව
කෘෂිකර්ම පීඨය	160
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	234
කළමනාකරණ අධ්‍යන පීඨය	498
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	487

29. තත්ත්වය සහතික කිරීමේ මධ්‍යස්ථානය

අ. හැඳින්වීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කිරීමේ කවුන්සිලයට අනුකූලව විශ්වවිද්‍යාලය තුල තත්ත්වය සහතික කිරීමේ ක්‍රියාකාරකම් සිදු කිරීම සහ එම කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීම තත්ත්වය සහතික කිරීමේ මධ්‍යස්ථානයේ කාර්යයවේ. පරිවර්තනීය අධ්‍යාපනය සඳහා විශ්වවිද්‍යාලයීය ඉගැන්වීම්, ඉගෙනුම්, ඇගයීම්, පර්යේෂණ සහ අධ්‍යයන පාලනයේ ගුණාත්මක භාවය සහතික කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා වන මිණුම් දණ්ඩ සකසන්නෙකු වීමේ මෙහෙවර සමඟ තත්ත්වය සහතික කිරීමේ මධ්‍යස්ථානය කටයුතු කරයි. තත්ත්වය සහතික කිරීමේ මධ්‍යස්ථානය විසින් නියාමන ලේඛන සකස් කිරීමේ මුලිකත්වය ගෙන ඇත්තේ එය වඩාත් විනිවිද පෙනෙන, හොඳින් ව්‍යුහගත සහ ඵලදායී ස්වභාවයක්ට ගෙන එම් සඳහා වර්තමාන භාවිතයෙන් වැඩි දියුණු කිරීමේ අරමුණින්ය. තවද තත්ත්ව සහතික කවුන්සිලය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබන අපගේ සමාලෝචන ක්‍රියාවලින් රැගෙන යාමට පීඨ සහ ඒකක වලට සහාය වීම සඳහා තත්ත්වය සහතික කිරීමේ මධයස්ථානය වගකීම දරයි. උපකුලපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් තත්ත්වය සහතික කිරීමේ මධ්‍යස්ථානයේ ස්ථාවර කමිටුව මසකට වරක් රැස්වී විශ්වවිද්‍යාලයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමේ ක්ෂේත්‍ර, විශේෂයෙන් ඉගැන්වීම්, ඉගෙනුම්, ඇගයීම් සහ පර්යේෂණ සම්බන්ධයෙන් සාකච්ඡා කරයි. දැනට තත්ත්වය සහතික කිරීමේ මධ්‍යස්ථානය යටතේ පීඨ/ඒකක/පුස්තකාල මට්ටමින් අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකක අටක් ඇති අතර මේවා පීඨාධිපති/අධ්‍යක්ෂක/පුස්තකාලයාධිපති විසින් මෙහෙයවනු ලැබේ.අනුමත නියාමන ලේඛන පිළිපැදීම, සහතික කිරීම සහ පීඨ/ඒකක/පුස්තකාල මට්ටමින් අවශ්‍ය ලියකියවිලි සකස් කිරීම සහ පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා හොඳ භාවිතයන් අනුගමනය කිරීම සහතික කිරීම සඳහා සෑම අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයක්ම වගකීමක් දරයි. විශ්වවිද්‍යාල මට්ටමින් ගුණාත්මක ඉදිරි දර්ශන නිරීක්ෂණය කර සමස්ථ විශ්වවිද්‍යාලයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම තත්ත්වය සහතික කිරීමේ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකගේ වගකීම වේ. 2022 වසරේ දී අධ්‍යක්ෂක වරුන් දෙදෙනෙකු රාජකාරී කටයුතු සිදුකල අතර ඔවුන් ආචාර්ය ඩී. එම්. එස්. දුමින්ද (2022 ජනවාරි සිට 2022 ජුනි 15) සහ ආචාර්ය ඩී. කේ. හෙට්ටිආරච්චි (2022 ජුනි 15 සිට දෙසැම්බර්) යන අය වේ.

2022 වසර සඳහා තත්ත්වය සහතික කිරීමේ මධ්‍යස්ථානය ලබා ඇති විශාලතම ජයග්‍රහණවලින් එකක් වන්නේ මධ්‍යස්ථානයට අර්ධකාලීන පදනම මත සහකාර ලේඛකාධිකාරී වරයෙකු, කළමනාකරණ සහකාරවරයෙකු සහ පුහුණු කාර්ය මණ්ඩල සාමාජිකයෙකු පත් කිරීමයි. එබැවින් මේ වනවිට අධ්‍යක්ෂක වරයා ඇතුළු කාර්ය මණ්ඩල සාමාජිකයින් හතර දෙනෙකුගෙන් තත්ත්වය සහතික කිරීමේ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් සිදු කෙරේ.

ආ. ජයග්‍රහණයන්

ජයග්‍රහණයන්	සටහන
උපකුලපතතුමියගේ ප්‍රධානත්වයෙන් සහ සියලුම පීඨාධිපතිවරුන්, ලේඛකාධිකාරී, පුස්තකාලයාධිපති, පීඨ/ඒකක සම්බන්ධීකාරකවරුන්, ආරාධිත අධ්‍යක්ෂක වරුන් යන අයගේ සහභාගිත්වයෙන් සනාතන සභා ස්ථාවර කමිටු රැස්වීම් පහක් පවත්වන ලදි	
වැඩමුළු 15ක් පැවැත්වීම	මෙම වැඩමුළු වලින් කිහිපයක් පීඨ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය මගින් පවත්වන ලදි.
වැඩසටහන් සමාලෝචන වල මාර්ගගත සාක්ෂි ලේඛන ඉදිරිපත් කිරීම.	උපාධි වැඩසටහන් 14ක් සඳහා
බාහිර සමාලෝචන ක්‍රියාවලීන් නිරීක්ෂණයන් සඳහා සහාය දීම, කළමනාකරණය කිරීම සහ සහභාගි වීම.	තොරතුරු තාක්ෂණ උපාධිය සඳහා
තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලාව සඳහා බී ශ්‍රේණියක් ලබා ගැනීම.	
නියාමන ලියවිලි අටක් සකස් කිරීම.	අවසාන වාර්ෂික වාර්තාවේ ලැයිස්තුගත කර ඇත.
තත්ත්වය සහතික කිරීමේ කොමිෂමේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ අනුමැති ය සඳහා නව පශ්චාත් උපාධි සහ බාහිර උපාධි වැඩසටහන් පහක් සඳහා අනුමැතිය සඳහා යොමු කිරීම.	
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය යළි ස්ථාපිත කිරීම.	
පුස්තකාල තත්ත්වය සහතික කිරීමේ මධ්‍යස්තානය ස්ථාපනය කිරීම.	

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

අසමර්ථයන්	නිර්දෝෂිභාවය
මධ්‍යස්ථානය සඳහා තෙවසරක උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීමට නොහැකි වීම.	.පීඨ මට්ටමින් අවශ්‍ය ලියකියවිලි නියමිත වේලාවට ලබා ගැනීමට නොහැකි විය.
සැලසුම් කළ පරිදි වැඩමුළු දෙක පැවැත්වීමට නොහැකි වීම.	.මෙම වැඩමුළු සඳහා අනුමැතියට අගෝස්තු මාසයෙ ඉදිරිපත් කලද අනුමැතිය ලැබුනුයේ ඔක්තෝම්බර් මාසයේදී බැවින් සීමිත කාලයක් තුළ ඒවා පැවැත්වීමට නොහැකි විය.

ඇ. අනාගත දැක්ම

2023 වර්ෂය සඳහා සැලසුම්	
ආයතනික සමාලෝචනය සඳහා සුදානම් වීම.	දැනටමත් එක් එක් නිර්ණායක සඳහා සම්බන්ධීකාරවරුන් පත් කර ඇති අතර එය 2023 ජනවාරි 19 වන දින පැවති 249 වැනි සනාතන සභාවට ඉදිරිපත් කිරීමට සුදානම් කර තිබේ.
අවශ්‍ය නියාමන ලියකියවිලි සකස් කිරීම.	
පීඨවල වැඩසටහන් සමාලෝචනය සඳහා සහාය වීම.	

30. විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය

අ. හැඳින්වීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 10/2016 මඟින් ලෝක බැංකු මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක උපාධි අධ්‍යාපන ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් වන උසස් අධ්‍යාපනය පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර සබඳතා ඒකකය 2018 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. එය මිහින්තලේ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රය තුළ පිහිටා ඇත. ව්‍යාපාර සම්බන්ධතා ඒකකයේ කටයුතු ස්වාධීන උපදේශක මණ්ඩලයයේ සෑම පීඨයක්ම නියෝජනය කරන පීඨ සම්බන්ධීකාරකවරුන්ගේ සහ කළමනාකරුවන් දෙදෙනෙකගේ සහයෝගයෙන් ක්‍රියාත්මකවේ.

දැක්ම

ඉගෙන ගන්න, සොයා ගන්න, නිර්මාණය කරන්න සහ ලෝකය තවත් යහපත් කරන්න

මෙහෙය

වෙළඳ භාණ්ඩ සංවර්ධනය කිරීම සඳහා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමට සහ මඟ පෙන්වීම සඳහා පර්යේෂණ සහ කර්මාන්ත සම්බන්ධ කිරීම වාණිජකරණය කිරීමට රජරට විශ්වවිද්‍යාලයේ ඉදිරිපස දොරටුව වීම.

ඉලක්ක

- නවෝත්පාදන පර්යේෂණ
- වාණිජකරණය
- බුද්ධිමය දේපල සඳහා මාර්ගෝපදේශ සැපයීම

අපගේ සේවාවන්

- පර්යේෂණ, නිෂ්පාදන, සහ තාක්ෂණයන් වාණිජකරණය
- කර්මාන්ත පදනම් කරගත් පර්යේෂණ සිදු කිරීම.

කාර්මික ගැටළු සඳහා උපදේශනය

- වෘත්තිය ප්‍රහුණුව සහ ධාරිතාව ගොඩනැගීම
- බුද්ධිමය දේපල ආරක්ෂණ සහාය
- විශ්වවිද්‍යාල ප්‍රජාව අතර ව්‍යවසායකත්වය ගොඩනැගීම.

අපගේ කණ්ඩායම

- ආචාර්ය මනෝජ් සමරතුංග - අධ්‍යක්ෂක, ව්‍යාපාර සම්බන්ධතා ඒකකය
- ව්‍යාපාර සම්බන්ධතා සම්බන්ධීකාරකවරුන් (හයදෙනෙකු) - එක් එක් පීඨයන් නියෝජනය කරමින්
- එරංගා ලියනගේ මහත්මිය - කළමනාකාර, ව්‍යාපාර සම්බන්ධතා ඒකකය
- අනුරුද්ධී නිසංසලා මහත්මිය - ව්‍යාපාර සංවර්ධන කළමනාකරු, ව්‍යාපාර සම්බන්ධතා ඒකකය

ආ. ජයග්‍රහණයන්

1	වාණිජකරණයෙන් ලැබුණු මුළු පෙර ගාස්තුව (ශ්‍රී ලංකා රුපියල්)	1,500,000.00
2	වාණිජකරණයෙන් ලැබුණු රාජයේ ගාස්තු (ශ්‍රී ලංකා රුපියල්)	15,000.00
3	විශ්වවිද්‍යාලය - කර්මාන්ත සහයෝගීතා (සංඛ්‍යාව)	07
4	එකඟතා බලපත්‍ර (සංඛ්‍යාව)	06

1. වාණිජකරණයෙන් ලැබුණු පෙර ගාස්තු

#	සමාගම් නාමය	මාරු කළ තාක්ෂණය	පෙර ගාස්තුව (ශ්‍රී ලංකා රුපියල්)
1	ලක්මි එක්සපෝර්ට්ස් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්	• ඔමේගා 3 මාළුතෙල් පවුඩර් • ඔමේගා 3 අඩංගු සෝස් • ඔමේගා 3 අඩංගු ජෑම් • ඔමේගා 3 අඩංගු ජෙලි	700,000.00

2	ආදිත්‍ය ආයුර්වේද ප්‍රයිවට් ලිමිටඩ්	• ශාක සාර පාද සත්කාර	800,000.00
එකතුව			**1,500,000.00**

2. වාණිජකරණයෙන් ලැබුණු රාජයේ ගාස්තු

#	සමාගම් නාමය	මාරු කළ තාක්ෂණය	ලැබුණු ගාස්තු (ශ්‍රී ලංකා රුපියල්)
1	බිරිත් ඊ මෙඩිකල් පුද්ගලික සමාගම	ද්විත්ව ස්ථර පෙරණය සහිත මුහුණු ආවරණ	15,000.00
එකතුව			**15,000.00**

3. විශ්වවිද්‍යාල - කර්මාන්ත සහයෝගීතාව

#	සමාගම් නාමය	අත්සන් කළ දිනය
1	ගුණවර්ධන ආයුර්වේද හෝල්ඩින්ග්ස්/ආදිත්‍ය ආයුර්වේද ප්‍රඩක්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්	13.01.2022
2	සීමාසහිත බිරිත් ඊ මෙඩිකල් පුද්ගලික සමාගම	14.05.2022
3	සීමාසහිත කුඩා කිරි සංවර්ධන සමාගම	14.07.2022
4	සීමාසහිත පුද්ගලික සමාගම විශිෂ්ඨ ස්ථාන පර්යේෂන සහ උපදේශන	01.08.2022
5	කොළඹ කොටස් වෙළඳපොල	01.09.2022
6	සීමාසහිත ලක්මී එක්ස්පෝර්ට්ස් ලංකා පුද්ගලික සමාගම	10.11.2022
7	සීමාසහිත උලන්කුලම කිරි නිෂ්පාදන පුද්ගලික සමාගම	20.12.2022

3. ගිවිසුම් බලපත්‍ර

#	සමාගම් නාමය	බලපත්‍ර ලත් තාක්ෂණය	ලැබුණු ගාස්තු (ශ්‍රී ලංකා රුපියල්)
1	සීමාසහිත ලක්මී එක්ස්පෝර්ට්ස් ලංකා පුද්ගලික සමාගම	ඔමේගා 3 අඩංගු ජෙලි	100,000.00
2	සීමාසහිත ලක්මී එක්ස්පෝර්ට්ස් ලංකා පුද්ගලික සමාගම	ඔමේගා 3 අඩංගු පවුඩර් නිෂ්පාදන ක්‍රියාවලිය	400,000.00
3	සීමාසහිත ලක්මී එක්ස්පෝර්ට්ස් ලංකා පුද්ගලික සමාගම	ඔමේගා 3 අඩංගු ජෑම්	100,000.00
4	සීමාසහිත ලක්මී එක්ස්පෝර්ට්ස් ලංකා පුද්ගලික සමාගම	ඔමේගා 3 අඩංගු සෝස්	100,000.00
5	ගුණවර්ධන ආයුර්වේද හෝල්ඩින්ග්ස්/ආදිත්‍ය ආයුර්වේද ප්‍රඩක්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්	ශාක සාර පාද සත්කාර	800,000.00
6	සීමාසහිත බිරිත් ඊ මෙඩිකල් පුද්ගලික සමාගම	ද්විත්ව ස්ථර පෙරණය සහිත මුහුණු ආවරණ	-

- **පවත්වන ලද වෙබිනර්ස්**

#	කාණ්ඩය	සහභාගි වූ අය	වෙබිනර්ස් සංඛ්‍යාව
1	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය ව්‍යාපාරික විත්ති	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය උපාධි අපේක්ෂකයින්/ව්‍යවසායකයින්	02
2	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය ව්‍යාපාරික සමාජය	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය උපාධි අපේක්ෂකයින්	04
3	මගේ නැග්ම	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය උපාධි අපේක්ෂකයින්	03
4	පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය	01

- **වෙනත්**

1. සිව් වන විශ්වවිද්‍යාල ව්‍යාපාර සමබන්ධතා උපදේශක මණ්ඩල රැස්වීම වර්ෂ 2022 මාර්තු 15 වන දින පැවත් වූ අතර එහිදි විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකයෙහි මෙතෙක් ලබා ඇති ප්‍රගතිය සහ අනාගත සැලසුම් සාකච්ඡා කරන ලදි.

2. ලංකා වාණිජ මණ්ඩලයේ අතථ්‍ය ප්‍රදර්ශනය පැවැත් වූ අතර එහිදී ශ්‍රී ලංකා රජරට විශ්වවිදයාලයිය ආදිවිද්‍යාර්ථ සංගමයේ සාමාජික හා ව්‍යවසායක නදී සේනානායක මහත්මිය විසින් ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදි.

3. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු වන සාලිය මධුවන්ත බණ්ඩාර මහතාගේ මල් තේ පදනම් කරගනිමින් ආරම්භ කරන ලද සිලෝන් ඔක්සේයි පුද්ගලික සමාගමට සහාය වීම උදෙසා උතුරු මැද වානිජ කර්මාන්ත හා කෘෂිකර්ම මණ්ඩලයේ 16 වැනි වාර්ෂික ව්‍යවසායක සම්මාන 2022 ප්‍රදානෝත්සවය ඇගයීමකට ලක් විය.

4. වානිජ නීති සංවර්ධන වැඩසටහන නේපාල - විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා අධ්‍යක්ෂ සහ කළමනාකරු නේපාලයේ කත්මන්ඩු හී එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුව, වානිජ නීති සංවර්ධන වැඩසටහන විසින් සංවිධානය කරන ලද තාක්ෂණ හුවමාරු වැඩමුළුවක් සඳහා සහභාගි විය.

5. රූපවාහිනි වැඩසටහන - ශ්‍රී ලංකා රජරට විශ්වවිදයාලයේ නවෝත්පාදන පිළිබඳව සාකච්ඡා කිරීමට 2022 දෙසැම්බර් 31 වන දින ජාතික රූපවාහිනිය (ශනිදා ආයුබෝවන් වැඩසටහ) විසින් උපකුලපකිවරයාට සහ විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකයෙහි අධ්‍යක්ෂවරයාට ආරාධනා කරන ලදි.

31. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ III වන කොටසේ 17(ඈ) වගන්තිය යටතේ සඳහන් කර ඇති තිරසාර සංවර්ධන මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ III වන කොටසේ 17 (ඈ) වගන්තිය යටතේ සඳහන් කර ඇති තිරසාර සංවර්ධනය මත පදනම් වූ අනාගක අපේක්ෂිත වාර්තාව

1. වර්තමානයේදී විශ්වවිද්‍යාලයීය සියළුම සිසුන් හා කාර්ය මණ්ඩලය සඳහා ප්‍රතිලෝම ඔස්මෝසිස් ක්‍රියාවලිය භාවිතයෙන් පිරිසිදු කරන ලද පානීය ජලය සපයනු ලබන අතර අනාගතයේදී ප්‍රතිලෝම ඔස්මෝසිස් පිරිපහදු යන්ත්‍ර ගණන වැඩිකිරීමෙන් විශ්වවිද්‍යාල ප්‍රජාවට පිරිසිදු පානීය ජලය ලබා ගැනීමේ හැකියාවන් වැඩි කිරීමට බලාපොරොත්තුවේ.
2. මධ්‍යම පරිසර අධිකාරියේ සහයෝගීතාවයෙන් සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය මඟින් කසළ බැහැර කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබෙන අතර අනාගතයේදී අනෙකුත් පීඨ, නේවාසිකාගාර හා කාර්යාලද මෙම ව්‍යාපෘතියට ඇතුළත් කිරීමට බලාපොරොත්තුවේ.
3. හරිත විශ්වවිද්‍යාල සංකල්පයට අනුව විශ්වවිද්‍යාල පරිසරය මනාව පවත්වා ගැනීම සහ එම කටයුතු සඳහා වැසි ළිං ජලය භාවිතා කිරීම.
4. තිරසාර පරිසරයක් ගොඩනැගීමේ අභිප්‍රායෙන් සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය හා කෘෂිකර්ම පීඨය මඟින් හඳුන්වාදෙන ලද රුක්රෝපන වැඩසටහන ඉදිරියටද කරගෙන යෑමට බලාපොරොත්තුවේ.
5. විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන දැරිය හැකි මුදලක් අය කරන සහ ගුණාත්මක තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් සඳහා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය සඳහාම සමාන ප්‍රවේශයන් සහතික කිරීම.
6. විශ්වවිද්‍යාල අධ්‍යාපනයට සුදුසුකම් නොලබන සිසුන් නිපුණතා ඇති, දැනුමැති සහ රැකියා සඳහා සුදුසු උපාධිධාරීන්, ඩිප්ලෝමාධාරීන් සහ සහතිකපත් දරන්නන් බවට පත්කිරීමේ අරමුනින් බාහිර අධ්‍යාපන වැඩසටහන් සඳහා සිසු ප්‍රවේශය ඉහළ නැංවීම.
7. කළමනාකරණ අධ්‍යයන පීඨය හා සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය මඟින් පවත්වනු ලබන පශ්චාත් උපාධි සහ ඩිප්ලෝමා වැඩසටහන් සඳහා බඳවා ගැනීම් ඉහළනැංවීම හා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහතික කිරීම.
8. ප්‍රදේශයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ හදාරන සිසුන්ගේ තත්වය ඉහළ නැංවීමේ අරමුණින් උතුරුමැද පළාත් පාසල් උසස්පෙළ සිසුන් සඳහා ජීව විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය සහ තාක්ෂණය යන විෂයන්ට අදාලව පවත්වනු ලබන වැඩමුළුව වඩාත් හොඳින් ඉදිරියටත් පැවැත්වීම.
9. සියළුම පීඨයන් මඟින් සිදු කරනු ලබන දැනුම බෙදාහැරීමේ වැඩසටහන් ප්‍රමාණයෙන් හා ගුණාත්මක බවෙන් ඉහළ නංවා ක්‍රියාත්මක කිරීම.
10 විශ්වවිද්‍යාලයේ යහ පාලන ක්‍රියා වලිය වැඩිදියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාල පාලක සභාව විසින් නවාතැන්/පුස්තකාල සම්පත් බෙදාගැනීමේ ප්‍රතිපත්ති අනුමත කරන ලදි.
11 විශ්වවිද්‍යාල ප්‍රජාවගේ දැණුම හා පර්යේෂණ කුසලතා සංවර්ධනය සඳහා වෘත්තීය මාර්ගෝපදේශන සහ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් අවස්තාව සලසා දී ඇත.
12 විශ්වවිද්‍යාලයේ අධ්‍යන කාර්ය මණ්ඩලයේ හා අනධ්‍යන කාර්ය මණ්ඩලයේ ජීවන කුසලතා එනම් ව්‍යවසායකත්වය, සුහුරු ව්‍යාපාර, සම්බන්ධව විශ්වවිද්‍යාල ව්‍යාපාර ඒකකය මඟින් දැණුම ලබා දී සමාජ තිරසාරකත්වය අත්පත් කිරීම.

32. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106(1) සහ 107(ආ) වගන්ති ප්‍රකාරව සහ 1971 අංක 38 දරන මුල්‍ය පනත හා එහි සංශෝධන ප්‍රකාරව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2022 වර්ෂය සඳහා වන මුල්‍ය ප්‍රකාශනය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය – මිහින්තලේ
2022 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන	2022 ශ්‍රී:ලං:රු:	2021 ශ්‍රී:ලං:රු:
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	2	210,845,383	165,369,678
ආයෝජන් අනෙකුත් මුදල්	3	218,878,431	296,667,813
අත්තිකාරම් - සැපයුම් සහ සේවා	4	17,377,996	17,909,522
අත්තිකාරම් විවිධ	5	2,205,253	2,390,417
අතිකාරම් සේවක	6	236,350	269,600
සේවක ණය	7	6,315,091	7,599,991
ආයතන සහ අනෙකුත් විශ්වවිද්‍යාල වලින් ලැබිය යුතු මුදල්	8	26,777,591	1,799,000
ලැබිය යුතු පොලී මුදල්	9	12,118,473	2,970,812
තොගය	10	37,059,946	41,239,241
ඉදිරියට කළ ගෙවීම්	11	644,388	832,331
පර්යේෂණ අත්තිකාරම්	12	2,027,223	2,521,122
ඇප උල්ලංඝණය කිරීමෙන් ඇති වූ ණය ගැනියන්	13	91,561,265	69,717,264
මුළු ජංගම වත්කම්		**626,047,390**	**609,286,791**
ජංගම නොවන වත්කම්			
සේවක ණය	7	11,081,496	15,156,537
සීමිත ආයෝජන අරමුදල්	3	5,846,571	5,263,472
ශේෂ විද්‍යාතමක වත්කම්	14	7,544,915	3,673,818
ජංගම අත්තිකාරම්	15	171,558,694	216,224,799
නොනිමි වැඩ	15	1,032,627,613	649,849,925
දේපළ, පිරියත සහ උපකරණ	16	5,318,221,612	5,700,451,790
මුළු ජංගම නොවන වත්කම්		**6,546,880,901**	**6,590,620,341**
මුළු වත්කම්		**7,172,928,292**	**7,199,907,132**
වගකීම්			
ජංගම වගකීම්			
විවිධ තැන්පතු	17	9,087,287	10,800,268
ණය හිමියන්	18	365,078,353	176,488,064
උපචිත වියදම්	19	28,754,078	120,531,016
අනෙකුත් ගෙවිය යුතු මුදල්	20	16,735,720	16,414,707
මුළු ජංගම වගකීම්		**419,655,438**	**324,234,055**
ජංගම නොවන වගකීම්			
විශ්‍රාමික පාරිතෝෂික	21	205,344,497	206,223,007
මුළු ජංගම නොවන වගකීම්		205,344,497	206,223,007
මුළු වගකීම්		**624,999,935**	**530,457,062**
ශුද්ධ වත්කම්/කොටස්		**6,547,928,357**	**6,669,450,070**
ප්‍රාග්ධන අරමුදල්			
ප්‍රාග්ධන ප්‍රදාන වියදම් කළ		5,484,833,713	5,693,499,959
ප්‍රාග්ධන ප්‍රදාන වියදම් කළ නොනිමි වැඩ		1,032,627,613	649,849,925
ඉදිකිරීම් වියදම් නොකළ - ප්‍රාග්ධන ප්‍රදාන	22	(117,936,214)	84,792,983
පුනරුත්ත්‍රාපන ප්‍රදාන - පුනරුත්ත්‍රාපන වැඩ	23	4,137,976	25,277,099
ප්‍රාග්ධන ප්‍රදාන - උපකරණ ලී බඩු පුස්තකාල පොත් සඳහා වියදම් නොකළ	24	2,856,991	64,052,273
ප්‍රාග්ධන ප්‍රදාන - තාක්ෂණ පීඨය	25	9,487,666	19,826,231
ප්‍රාග්ධන ප්‍රදාන - මානව ප්‍රාග්ධන සංවර්ධනය	26	14,756,543	13,808,015
ප්‍රාග්ධන ප්‍රධාන අනෙකුත් ප්‍රදාන	27	29,191,110	31,191,110
		6,459,955,399	**6,582,297,596**
වෙන් කිරීම්			
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන වෙන් කිරීම්		28,980,803	28,980,803
ප්‍රාග්ධන වෙන් කිරීම්		218,432,934	218,432,934
පොදු වෙන් කිරීම්		(776,762,172)	(775,712,007)
		(529,348,435)	**(528,298,270)**
අනෙකුත් සම කොටස් උපාංග			
අනෙකුත් අරමුදල්	28	592,670,752	577,737,480
ශිෂ්‍යත්ව අරමුදල	29	6,822,132	4,692,704
පරිත්‍යාග අරමුදල්	30	5,129,442	5,012,219
පර්යේෂණ ප්‍රදාන	31	12,699,066	28,008,342
		617,321,392	**615,450,744**
මුළු ශුද්ධ වත්කම්/කොටස්		**6,547,928,357**	**6,669,450,070**

පිටු අංක 11 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල පූර්ණ සංඛ්‍යාමය කොටසක් ලෙස අඩංගු වෙයි. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ වගකීමකි. මෙම මූල්‍ය ප්‍රකාශන විශ්වවිද්‍යාල පාලක සභාව මගින් අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් පහත සඳහන් අය විසින් අත්සන් කරන ලදි.

.....	.....	.....
එස් එස් කේ ගොඩකුඹුර	ඒ එම් ජී බී අබේසිංහ	මහාචාර්ය ජී.ඒ.එස්. ගිනිගද්දර
වැඩ බලන මූල්‍යාධිකාරී	ලේඛකාධිකාරී	උපකුලපති

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය මිහින්තලේ 2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය

විස්තරය	සටහන	2022	2021
ආදායම්			
රාජ්‍ය ප්‍රදාන – පුනරාවර්තන		2,179,000,000	2,033,000,000
ශිෂ්‍යාධාර සඳහා වි. වි. ප්‍ර. කොා. සභාවේ ප්‍රදාන		55,144,000	52,996,000
රාජ්‍ය ප්‍රදාන සහ වෙනත් ණය ප්‍රදාන ක්‍රමක්ෂය		502,635,107	510,967,837
		2,736,779,107	**2,596,963,837**
අනෙකුත් ආදායම්			
නඩත්තු සඳහා පුනරුත්ථාපන ප්‍රදාන		-	140,270
ආයෝජන වලින් ලැබූ පොලී		39,035,684	19,411,174
කාර්යයාලීය ණය වලින් පොලී		828,764	1,047,918
දේපළ වලින් ලැබූ කුලීය		3,256,678	1,317,210
ස්ථාවර වත්කම් විකිණීම්		323,000	673,678
ලියාපදිංචි ගාස්තු (උපාධී අපේක්ෂකයින්)		1,889,770	4,749,396
ෂැපයුම්කරුවන්ගේ ලියාපදිංචි ගාස්තු		1,477,000	1,330,675
උපාධී ප්‍රධානෝත්සව ගාස්තු සහ පරිත්‍යාග		7,314,820	3,521,350
විභාග ගාස්තු (උපාධී අපේක්ෂකයින්)		369,440	332,325
ටෙන්ඩර් ගාස්තු		215,800	954,848
දඩ සහ පුස්තකාල ගාස්තු		455,135	150,771
පිටස්තරයින්ට ලබා දුන් සේවය		750,000	2,730,318
ශිෂ්‍ය නේවාසික ගාස්තු		2,172,089	884,447
සහතික ගාස්තු		243,840	90,860
පරීක්ෂණාගාර ගාස්තු		230,500	1,015,801
ප්‍රමාද ගාස්තු අය කිරීම්		-	2,315,285
සූර්යශක්ති පිරියත ආදායම්		1,206,417	1,525,872
බාහිර පාඨමාලා වලින් ලැබූ ආදායම්		18,568,646	69,261,421
විවිධ ආදායම්		14,360,914	10,032,470
		92,698,497	**121,486,062**
		2,829,477,604	**2,718,449,899**
වියදම්			
පුද්ගල වේතනයන්		1,930,556,702	1,765,944,698
ගමන් වියදම්		3,402,014	1,661,208
සැපයීම්		71,646,938	44,335,516
නඩත්තු	31	18,487,301	12,826,239
ගිවිසුම්ගත සේවාවන්		233,836,762	203,297,725
අනෙකුත් වියදම්		48,294,429	57,159,230
සංවර්ධන වැය ශීර්ෂයට මාරු කිරීම්		18,568,646	69,261,421
ශිෂ්‍යයින්ට දුන් මුදල් ආධාර		55,144,000	52,996,000
ක්ෂයවීම්		460,993,445	507,415,102
		2,840,930,238	**2,714,897,138**
අදාල වර්ෂය සඳහා වූ ශුද්ධ අතිරික්තය/(ඌනතාවය)		**(11,452,634)**	**3,552,761**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - මිහින්තලේ - 2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2022	2021
	ශ්‍රී:ලං: රු:	ශ්‍රී:ලං: රු:
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්		
ලැබූ මුදල් ප්‍රවාහයන්		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබූ අතිරික්තය/(ඌනතාවය)	(11,452,634)	3,552,761
මූල්‍යමය නොවන අවස්ථාවන් /ගැලපීම්		
ක්ෂයවීම්	460,993,445	514,862,879
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	7,100,394	5,781,213
පොදු වෙන් කිරීම් සහ අනෙකුත් ගැලපීම්	1,375,000	-
ණය සහ ආයෝජන වලින් ලැබූ ආදායම්	75,593,735	50,797,137
ප්‍රාග්ධන ප්‍රදාන ණය නිදහස් කිරීම	(39,035,684)	(20,459,092)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර ලැබූ	(502,635,107)	(511,108,107)
අතිරික්තය / (ඌනතාවය)	(8,060,850)	43,426,791
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්		
භාණ්ඩ ලේඛණයේ (වැඩිවීම්) / අඩුවීම්	4,179,295	2,476,961
ලැබීම්වල (වැඩිවීම්) / අඩුවීම්	(20,633,412)	(27,071,310)
ඉදිරි ගෙවීම්වල (වැඩිවීම්) / අඩුවීම්	187,943	1,202,274
උපචිත වියදම් (වැඩිවීම්)/අඩුවීම්	(91,776,938)	9,487,172
අනෙකුත් තැන්පතු සහ ගෙවීම් වල (වැඩිවීම්) / අඩුවීම්	(1,391,968)	84,561
රදවා ගැනීම් හා ණය හිමින්ගේ (වැඩිවීම්)/අඩුවීම්	188,590,289	(85,498,995)
සේවක අත්තිකාරම්වල (වැඩිවීම්/අඩුවීම්)	33,250	121,051
වෙනත් ආයතන සහ විශ්වවිද්‍යාල වලින් ලැබිය යුතු මුදල්	(24,978,591)	8,881,816
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමෙන් පසු මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද මුදල්	46,149,018	(46,889,679)
පාරිතෝෂික ගෙවීම්	(7,978,905)	(4,732,564)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්	38,170,114	(51,622,243)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබූ මුදල් ප්‍රවාහයන්		
පිරියත සහ උපකරණ දේපළ අත්පත් කරගැනීම	(59,631,541)	(58,949,194)
ඉදිකිරීම් සහ පුනරුත්ථාපන සඳහා ගෙවීම්	(234,716,456)	(385,279,082)
සේවයෙහි යෙදවීම සඳහා අත්තිකාරම් ගෙවීම්	(705,345)	(18,824,117)
මානව සම්පත් සංවර්ධනය සහ පර්යේෂණ සඳහා ගෙවීම්	(4,795,161)	(3,108,290)
කාර්යයාල ණය මුදල් වලින් ලැබීම්	5,359,941	2,726,361
ආයෝජන වලින් මුදල් ලැබීම්	29,888,023	20,459,092
ස්ථාවර තැන්පතු ආයෝජන වලින් ලැබීම්	127,945,762	76,680,053
ස්ථාවර තැන්පතු මත ආයෝජනය කිරීම්	(50,739,480)	(50,067,782)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**(187,394,258)**	**(416,362,959)**
මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් ලැබූ මුදල් ප්‍රවාහයන්		
ප්‍රාග්ධන ප්‍රධාන ලැබීම්	160,829,200	412,595,804
පුනරුත්ථාපන ප්‍රදාන	32,000,000	28,250,000
පර්යේෂණ සහ අනෙකුත් අරමුදල් වල වැඩි වීම	1,870,648	73,673,419
මූල්‍ය ක්‍රියාකාරකම වලින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**194,699,848**	**514,519,223**
මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම	**45,475,704**	**46,534,021**
මුදල් වර්ෂයේ ආරම්භක ශේෂය මුදල් සහ මුදල් සමාන දෑ	**165,369,678**	**118,835,657**
මුදල් වර්ෂයේ අවසාන ශේෂය මුදල් සහ මුදල් සමාන දෑ	**210,845,382**	**165,369,678**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - මිහින්තලේ - 2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ

සමකොටස් වෙනස්වීමේ ප්‍රකාශනය

0401070200-010101 - අධ්‍යයන දීමනා	2,556,645	445,775,375.74	11,776,031.84				460,108,052	489,847,318	29,739,266
0401100200-010104 - වෙනත් දීමනා	(81,487)	71,069,088.02	427,746.13	(1,587.00)	(4,829.00)		71,408,931	12,484,632	(58,924,299)
0401140200-010101 - පාරිතෝෂික වියදම්	-	(5,701,056.99)	(9,196,054.12)				(14,897,111)	-	14,897,111
0401150101-010104 - 20% දීමනාව	222,680	40,426,193.18	1,050,812.31				41,699,685	68,419,917	26,720,232
0401150200-010101 - ගැලපුම් දීමනාව	111,340	20,143,928.21	516,935.00				20,772,203	-	(20,772,203)
0401160200-010104 - ආරාධිත ආචාර්යවරුන්ගේ ගාස්තු	-	3,034,750.00	-				3,034,750	21,540,082	18,505,332
0401170100-010104 - ඉන්ධන දීමනාව	1,596,070	3,204,687.08	543,105.00				5,343,862	-	(5,343,862)
0401180100-010104 - ප්‍රවාහන දීමනාව	444,462	2,617,973.98	600,000.00				3,662,436	-	(3,662,436)
0401190100-010104 - සන්නිවේදන දීමනාව	589,863	1,297,358.42	109,400.40	78,000	48,000	40,000	2,162,622	-	(2,162,622)
0401200100-010104 - සංග්‍රහ වියදම් දීමනාව	441,593	1,932,233.53	161,070.00				2,534,896	-	(2,534,896)
උප එකතුව	10,806,955	1,292,056,848	21,274,337	76,413	43,171	40,000	1,324,297,724	1,347,030,582	22,732,858

0401010100-010104 - වැටුප් (අනධ්‍යයන) වැටුප් සහ වේතන	56,291,028	141,810,480.79	17,029,971.42	16,290,473.67	19,374,766.40	7,540,548.80	258,337,269	243,928,507	(14,408,762)
0401020100-010104 - අර්ධ කාලික අමතර දිවා	7,354,497	18,884,132.90	2,203,679.75	2,039,536.08	2,494,410.77	1,072,913.72	34,049,170	28,148,579	(5,900,591)
0401030100-010101 - විශ්‍රාම වැටුප් - ඩී. ඊ. දායකත්වය	6,229,851	13,502,140.57	2,040,876.87	1,968,363.49	2,366,513.69	747,165.86	26,854,911	32,167,959	5,313,047
0401040100-010104 - සේවා නියුක්තියෙන් ගාරකාර අරමුදල	2,738,802	6,465,121.80	849,011.68	801,580.17	972,185.14	364,016.10	12,190,717	12,083,986	(106,730)
0401050100-010104 - සීවන වියදම් දීමනා	10,218,578	24,023,252.94	3,650,399.99	3,123,522.58	4,347,367.73	1,233,716.77	46,596,838	49,227,704	2,630,866
0401060100-010101 - පර්යේෂණ දීමනා	2,168,126	815,266.00	311,598.00	422,369.50			3,717,360	5,337,632	1,620,273
0401080100-010104 - එම් සී ඒ දීමනාව	25,170,875	48,537,142.74	7,651,873.12	7,323,691.55	8,709,037.30	3,376,596.76	100,769,216	109,699,331	8,930,114
0401100100-010104 - වෙනත් දීමනා	7,076,809	16,256,127.20	2,348,399.99	2,362,915.53	2,862,383.73	1,408,922.88	32,315,558	3,463,645	(28,851,913)
0401110100-010104 - වැඩබැලීම් දීමනා	791,400	235,040.47					1,026,440	-	(1,026,440)
0401120100-010104 - අතිකාල දීමනා	10,798,478	6,611,661.37	1,123,848.39	251,824.40	1,840,261.83	391,597.22	21,017,672	37,014,477	15,996,806
0401130100-010104 - නිවාඩුදින දීමනා	94,216	211,367.37		28,462.50			334,045	-	(334,045)
0401140100-010104 - සාර්ථකීක දීමනා	11,180,928	11,215,420.89	4,392,764.28	1,686,615.44	(6,302,104.66)	2,090,632.46	24,264,257	3,135,159	(21,129,098)
0401150100-010104 – 20% දීමනා	11,187,854	21,569,966.32	3,399,994.30	3,255,344.04	3,870,683.27	1,501,682.61	44,785,525	48,762,438	3,976,914
උප එකතුව	**151,301,442**	**310,137,121**	**45,002,450**	**39,554,699**	**40,535,505**	**19,727,793**	**606,258,978**	**572,969,418**	**(33,289,560)**
	162,108,397	**1,602,193,969**	**66,276,787**	**39,631,112**	**40,578,676**	**19,767,793**	**1,930,556,702**	**1,920,000,000**	**(10,556,702)**

0402010100-010104 - ගමන් වියදම් (අනධ්‍යන) ගෘහස්ථ	728,868.00	(2,122.25)	18,194.00	122,850.00	22,250.00	38,500.00	928,540	-	340,460
0402010200-010101 - ගමන් වියදම් (අධ්‍යන) ගෘහස්ථ	18,400.00	120.723.56					139,124	1,269,000	(139,124)
0402020100-010104 - ගමන් වියදම් (අනධ්‍යයන) විදේශය	258,795	887,700.00					1,146,495		(301,495)
0402020200-010101 - ගමන් වියදම් (අධ්‍යයන) විදේශය		1,187,855.25					1,187,855	845,000	(1,187,855)
	1,006,063	**2,194,157**	**18,194**	**122,850**	**22,250**	**38,500**	**3,402,014**	**2,114,000**	**(1,288,014)**
0403010000-010104 - ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා සැපයුම්	5,405,920	13,954,179.99	393,986.79	304,949.64	271,892.33	291,224.51	20,622,153	16,000,000	(4,622,153)
0403020000-010104 - ඉන්ධන සහ ලිහිසි තෙල් සැපයුම්	17,352,037	5,375,359.49			66,560.00		22,793,956	8,031,000	(14,762,956)
0403030000-010104 - නිල ඇඳුම් හා මැහුම් ගාස්තු	1,983,332	1,397,195.61	100,393.74	82,282.60	528,147.70	57,685.50	4,149,037	2,114,000	(2,035,037)
0403040000-010104 - යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ සැපයුම්	45,604	2,481,554.47	2,595,294.10	2,343.75	2,383,420.20	899,116.55	8,407,333	5,072,000	(3,335,333)
0403050000-010104 - රසායන ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ සැපයුම්	116,544	4,645,266.71	33,114.67	1,288,984.04	175,358.76	187,562.29	6,446,830	11,434,000	4,987,170
0403060000-010104 - වෛද්‍ය සැපයුම්	114,735	64,728.10		29,696.00	12,250.00		221,409	634,000	412,591
0403070000-010104 - වෙනත් සැපයුම්	2,223,757	2,840,204.91	40,855.00	829,579.27	2,992,380.77	79,443.50	9,006,220	9,145,000	138,780
	27,241,927	**30,758,489**	**3,163,644**	**2,537,835**	**6,430,010**	**1,515,032**	**71,646,938**	**52,430,000**	**(19,216,938)**

0404010000-010104 - වාහන නඩත්තු	6,847,455	9,650.00			3,490.00	32,000.00	6,892,595	5,918,000	(974,595)
0404020000-010104 - යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තු	5,239,508	1,134,762.56	700.00		3,508,882.09	7,610.00	9,891,463	3,382,000	(6,509,463)
0404030000-010104 - ගොඩනැගිලි නඩත්තු	73,596	206,927.50	1,370.00		562,267.00	389,930.90	1,234,091	6,763,000	5,528,909
0404040000-010104 - ගෘහ භාණ්ඩ නඩත්තු	132,200	20,400.00	12,500.00				165,100	254,000	88,900
0404050000-010104 - නඩත්තු කිරීම් වෙනත්	13,490	57,725.00	11,966.00		216,531.00	4,340.00	304,052	211,000	(93,052)
	12,306,249	**1,429,465**	**26,536**	**-**	**4,291,170**	**433,881**	**18,487,301**	**16,528,000**	**(1,959,301)**
405010000-010104 - කොන්ත්‍රාත් සේවා පුවාහනය	(982,413)	(140,523.18)					(1,122,936)	1,500,000	2,622,936
0405020000-010104 - කොන්ත්‍රාත් සේවා විදුලි සංදේශ	1,047,470	9,676,528.95	164,033.51	105,295.30	18,527.95	302,467.81	11,314,323	31,500,000	20,185,677
0405030000-010104 - කොන්ත්‍රාත් සේවා ඇන්තර්ජාල ගාස්තු	11,402,757	8,499,092.50	39,304.94				19,941,155		(19,941,155)
0405040000-010104 - කොන්ත්‍රාත් සේවා නැෂුවල් ගාස්තු	1,528,963	165,245.00	2,080.00			3,785.00	1,700,073	1,500,000	(200,073)
0405050000-010104 - කොන්ත්‍රාත් සේවා විදුලිය	19,792,310	18,245,604.92		282,340.10		335,989.13	38,656,244	35,000,000	(3,656,244)
0405060000-010104 - ගිවිසුම්ගත සේවා ආරක්ෂක ගාස්තු	47,085,884						47,085,884	51,000,000	3,914,116

0405070000-010104 - කොන්ත්‍රාත් සේවා-ජලය	13,813,449	5,978,641.89	(3,000.00)	333,884.16		403,928.36	20,526,904	18,598,000	(1,928,904)
0405080000-010104 - කොන්ත්‍රාත් සේවා පිරිසිදු කිරීමේ සේවාව	43,817,969					671,721.45	44,489,691	40,250,000	(4,239,691)
0405090000-010104 - කොන්ත්‍රාත් සේවා කුලී සහ කුලී ගාස්තු	84,566			28,000.00		6,173,599.99	6,286,166	7,000,000	713,834
0405100000-010104 - කොන්ත්‍රාත් සේවා ගාස්තු සහ පළාත් පාලන ආයතන වෙත බදු	546,000	4,005.32					550,005	85,000	(465,005)
0405110000-010104 - කොන්ත්‍රාත් සේවා මුද්‍රණ වෙළඳ දැන්වීම් ආදිය	2,757,740	929,802.50					3,687,542	3,500,000	(187,542)
0405120000-010104 - කොන්ත්‍රාත් සේවා ශ්‍රමය සහ වෙනත්	15,603,331	9,529,395.92	307,600.00	3,873,720.15	10,337,444.80	1,070,190.06	40,721,682	43,961,000	3,239,318
	156,498,026	**52,887,794**	**510,018**	**4,623,240**	**10,355,973**	**8,961,682**	**233,836,732**	**233,894,000**	**57,268**
									-
0406010000-010101 - විශ්ව විද්‍යාල ගුරුවරුන් සඳහා වෙනත් පුනරාවර්තන සංචාරක ප්‍රදාන		1,357,956.31					1,357,956	1,691,000	333,044
0406020000-010104 - අනෙකුත් පුනරාවර්තන සභා සහ කමිටු රැස්වීම්	2,522,524	114,461.10		8,418.60			2,645,404	1,691,000	(954,404)
0406030000-010104 - වෙනත් පුනරාවර්තන වැඩමුළු සම්මන්ත්‍රණය සහ රැස්වීම	8,775	117,748.97	1,925.00				128,449	1,268,000	1,139,551
0406040000-010104 - අනෙකුත් පුනරාවර්තන කාර්ය මණ්ඩල සංවර්ධනය	3,340,101	171,700.00	848,133.00				4,359,934	1,268,000	(3,091,934)
0406050000-010104 - අනෙකුත් පුනරාවර්තන වියදම් වොරන්ට් සහ වාර ප්‍රවේශපත්‍රය	1,761,050	68,210.00					1,829,260	1,099,000	(730,260)
0406060000-010104 - වෙනත් පුනරාවර්තන සංග්‍රහ වියදම්	478,052	629,718.51	35,762.50	46,890.00	6,375.00		1,196,798	1,536,000	339,202
0406070000-010104 - අනෙකුත් පුනරාවර්තන බැංකු ගාස්තු	7,450	22,050.00	13,519.17				43,019	8,000	(35,019)
0406080000-010104 - වෙනත් පුනරාවර්තන-දායකත්ව සහ	105,000	3,500.00	7,500.00				116,000	127,000	11,000

0407020000-010104 - ශිෂ්‍ය ශිෂ්‍යාධාර සඳහා මූල්‍ය සහනය		**55,144,000.00**					**55,144,000**		
0408010000-010104 - ක්ෂය වීම - ගොඩනැගිලි	307,515,139						307,515,139		
0408020000-010104 - ක්ෂයවීම් බලාගාරය සහ යන්ත්‍රෝපකරණ -	8,038,723						8,038,723		
0408020001-010104 - ක්ෂයවීම් - යටිතල පහසුකම් වත්කම්	7,147,414						7,147,414		
0408030000-010104 - ක්ෂයවීම් මෝටර් රථ -	590,851						590,851		
0408040000-010104 - ක්ෂයවීම් - ගෘහ භාණ්ඩ සහ උපාංග	34,920,602						34,920,602		
0408050000-010104 - ක්ෂයවීම් කාර්යාලය සහ අනෙකුත් උපකරණ	7,696,433						7,696,433		
0408060000-010104 - ක්ෂයවීම් - විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ	55,415,231						55,415,231		
0408080000-010104 - ක්ෂයවීම් මෙවලම්	927,067						927,067		
0408080001-010104 - ක්ෂය වීම - පරිගණක මෘදුකාංග	18,750						18,750		
0408110000-010104 - ක්ෂයවීම් ක්‍රීඩා උපකරණ	26,529,602						26,529,602		
0408120000-010104 - ක්ෂයවීම් නිවාස රඳවන උපකරණ	1,687,287						1,687,287		
0408130000-010104 - ක්ෂයවීම් අකුණු ආරක්ෂණ පද්ධති	984,688						984,688		
0408140001-010104 - ක්ෂයවීම් - ජනක යන්ත්‍ර සහ බල සැපයුම් පද්ධතිය	674,643						674,643		
408150001-010104 - ක්ෂයවීම් - ජලාපවහන සහ මලාපවහන පද්ධතිය	1,175,800						1,175,800		
0408170000-010104 - ක්ෂයවීම් - පොත්	1,595,658						1,595,658		
0408180000-010104 - ක්ෂයවීම් - උපාධි ලේඛු සහ මල්මාලා	5,703,072						5,703,072		
	372,484						**372,484**		
	460,993,445						**460,993,445**		
	835,443,959	**1,773,386,251**	**71,662,894**	**48,815,813**	**61,807,807**	**31,244,870**	**2,822,361,562**	**2,284,475,000**	**(21,749,116)**


33. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (7) වගන්තිය ප්‍රකාර 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } NCCG/AN/D/RUSL/22/AQ/03

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 ජූලි 20 දින



උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද ගිණුම් සහ යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ. හොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :-

1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. NCCG/AN/D/RUSL/22/AQ/03 ඔබේ අංකය ඔබது இல. Your No.

දිනය திகதி Date 2023 ජූලි 26 දින

උපකුලපති,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,
මිහින්තලේ.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිත කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කර ලද පිරිවැය රු.867,706,599 ක් වූ වත්කම් විෂයයන් 13 ක් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නොතිබුණි.

(ආ) කෘෂිකර්ම පීඨ ගොවිපලෙහි 2022 දෙසැම්බර් 31 දිනට පැවති පොල්ගස් 1,434 ක් සහ වී කි.ග්‍රෑම් 8,217 ක වටිනාකම් අගය කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ අන්තර් සම්බන්ධතා කළමනාකරණ මෘදුකාංග පද්ධතිය (ERP System) වෙනුවෙන් 2021 වර්ෂය තුලදී ගෙවන ලද රු.5,250,000 ක් වූ පළමු වාරිකය කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කළ යුතු වුවත් අත්තිකාරම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලය විසින් 2015 වර්ෂයේ රු.1,025,396,975 ක් වැය කරමින් අනුරාධපුර ශික්ෂණ රෝහල් භූමියේ ඉදිකර ඇති සායන ගොඩනැඟිල්ල හා ආරක්ෂක කුටිය සඳහා 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ක්ෂය ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම රු. 365,735,755 කින් හා පොදු සංචිතය රු.314,465,906 කින් වැඩියෙන් හා වර්ෂයේ ඌනතාවය රු.51,269,848 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2021 වර්ෂයේදී අලි සංරක්ෂණ ඒකකය සඳහා පරිත්‍යාග ලෙස ලද ගොඩනැගිල්ල ඇතුළු කාර්යාල උපකරණ හා ගෘහ උපකරණ 142 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) 2019 නොවැම්බර් මාසයේ වැඩ නිම කර භාරදෙන ලද පිරිවැය රු.12,166,249 ක් වූ ඝන අපද්‍රව්‍ය ඒකක ගොඩනැඟිල්ලේ සවිකර ඇති යන්ත්‍ර වටිනාකම ගොඩනැගිලි වටිනාකමින් වෙන් කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) විශ්වවිද්‍යාලයේ ගබඩා 05 ක පැවති පිරිවැය රු.6,055,399 ක් වූ භාවිතයට නොගන්නා කල් ඉකුත් වූ තොග ජංගම වත්කමක් ලෙස අවසන් තොග ශේෂයේ ඇතුලත් වීම නිසා අවසන් තොගය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාළ නේවාසිකාගාර ආදායම රු.4,671,650 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ නේවාසිකාගාර ආදායම් ලෙස වර්ෂය තුළ මුදලින් ලද ආදායම වූ රු.2,172,088 ක් පමණක් දැක්වීම නිසා වර්ෂයේ ඌනතාවය රු.2,499,562 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) මූල්‍ය ප්‍රකාශනවල සවලීකරන අත්තිකාරම් (Mobilization advance) ලෙස රු.171,558,694 ක් දක්වා තිබුණ ද, අදාල උපලේඛනයෙහි එම අගය රු.181,407,650 ක් වුයෙන් රු.9,848,956 ක නොසැසඳීමක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත

ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.

වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2(අ) හි දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ	
මුදල් රෙගුලාසි 371(2)(ආ)	භාණ්ඩාගාරයේ පූර්ව අවසරයකින් තොරව අතුරු අග්‍රිම ලබාදිය හැකි රු.100,000 ක උපරිම සීමාව ඉක්මවා අවස්ථා 02 කදී රු.202,000 ක් හා රු.961,620 ක අත්තිකාරම් ලබාදී තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
i. XIX වැනි පරිච්ඡේදයේ 5.2 ඡේදය	උපලේඛනගත නිවාස ලබා ගැනීමට හිමිකමක් නැති නිලධාරියකුගෙන් නිවාස කුලී අයකල යුතු ආකාරය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ විධිවිධාන නොමැති විටක ආයතන සංග්‍රහයේ විධිවිධාන ඉක්මවා නොයන පරිදි කටයුතු කල යුතු වුවත් විශ්වවිද්‍යාලය විසින් පත්කරගත් නිවාස කමිටුවේ එකඟතාවය මත නිවාස කුලී ලෙස මාසිකව රු.400 සිට රු.1,500 දක්වා පරාසයක් තුල නිලධාරීන් 180 දෙනෙකුගෙන් නිවාස කුලී මුදල් අයකර තිබුණි.
ii. XIX වැනි පරිච්ඡේදයේ 5.3 ඡේදය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතනික චක්‍රලේඛ අංක 09/2019	උප ලේඛනගත නිවාස ලබා ගැනීමට හිමිකමක් ඇති නිලධාරියකුගේ මූලික වැටුපෙන් සියයට 10 ක් අයකල යුතු වුවද, උපකුලපති නිල නිවාසය ලබාදීම වෙනුවෙන් නිවාස කුලී අයකර නොතිබුණි.

(ඇ)	විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය XX පරිච්ඡේදයේ 3.1 ඡේදය	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු.1,324,297,724ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.
(ඈ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය --- 6.2.2 ඡේදය	වෙලඳපොල මිල සැඳහුම් ක්‍රමය මඟින් ප්‍රසම්පාදන කටයුතු සිදු කරන්නේ නම් ලංසු කැඳවීමේ අවම කාල සීමාව දින 7 ක් වුවද ඊට පටහැනිව අවස්ථා 06 ක දී එකතු වටිනාකම රු.1,054,330 ක් වූ මිලදී ගැනීම් සඳහා දින 1 සිට දින 3 අතර කාලයක් ලබාදී තිබුණි.
(ඉ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා බැඳුණු මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය	මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 2023 අප්‍රේල් 06 දින දක්වා ප්‍රමාද වී තිබුණි

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3. වෙනත් කරුණු

(අ) 2020 පෙබරවාරි 15 දිනෙන් පසු ඇති සංරක්ෂණ ඒකකය කිසිදු අධ්‍යයන කටයුත්තක් සඳහා උපයෝජනය නොකර අවුරුදු 03 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවති අතර මෙම ඒකකයේ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් 2021 වර්ෂයේදී රු.1,220,764 ක වියදමක් ද දරා තිබුණි.

(ආ) ගිවිසුම්ගත මුදල රු.42,979,355 ක් වූ වෛද්‍ය පීඨයේ ද්විත්ව නිල නිවාස 03 ක් සැලසුම් කර ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2017 මැයි 30 දින ආරම්භ කර අවස්ථා කිහිපයකදීම දින දීර්ඝ කිරීමෙන් පසු 2019 අප්‍රේල් 19 වන විට අවසන් කල යුතු විය. එහෙත් රු.29,239,233 ක කල වැඩ වටිනාකමින් අනතුරුව කොන්ත්‍රාත්කරු ඉදිකිරීම අතහැර තිබුණු අතර, ඒ දක්වා කොන්ත්‍රාත්කරුට රු.21,798,120 ක් ගෙවා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවට අදාලව රු.2,148,967 ක් වූ කාර්යසාධන සුරක්ෂිතය හා රු.9,885,251 ක් වූ අත්තිකාරම් සුරක්ෂණය පිළිවෙලින් 2020 ජනවාරි 08 දින හා 2019 ජූලි 30 දින කල් ඉකුත්වී තිබුණු බැවින් එම සුරක්ෂණ මඟින් රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) වෛද්‍ය පීඨයේ පුස්තකාලයේ පරිහරණය සඳහා 2011,2019 හා 2020 යන වර්ෂයන්හි මිලදී ගන්නා ලද පොත් 194 ක් සඳහා ගෙවිය යුතුව තිබූ රු.2,383,594 ක(US $ 12,308) මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ගෙවා නොතිබුණි. මෙම කාලය තුල සිදුවූ විනිමය අනුපාතයේ ඉහළයාම මත සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.584,993 ක් අතිරේකව දැරීමට සිදුවී තිබුණි.

(ඈ) අන්තර් සම්බන්ධතා කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා කොන්ත්‍රාත් වටිනාකම රු.17,500,000 කට 2020 දෙසැම්බර් 31 දින ගිවිසුම්ගතවී 2021 දෙසැම්බර් 31 දින නිමකර භාරදිය යුතු වුවත්, 2023 මැයි 31 දින වන තුරුත් නිමකර විශ්වවිද්‍යාලය වෙත භාර දී නොතිබුණි.

(ඉ) මිහින්තලය පරිශ්‍රයේ ද්විත්ව සේවක නිල නිවාස 04 ක් ඉදිකිරීම සම්බන්ධයෙන් රු.52,703,236කට අදාළ කොන්ත්‍රාත්තුව 2016 දෙසැම්බර් 23 වන දින පිරිනමා තිබුණු අතර ඒ වෙනුවෙන් සවලිකරණ අත්තිකාරම් ලෙස රු.15,859,979 ක් ගෙවීම් කර තිබුණි. එහෙත් කළ වැඩ වටිනාකම රු.10,620,619 ක් ව පැවතියදී නියමිත පරිදි වැඩ ඉටු නොකිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලය විසින් 2019 පෙබරවාරි 20 වන දින ගිවිසුම අවසන් කර තිබුණි. එදිනට රු.15,760,611 ක් තවදුරටත් කොන්ත්‍රාත්කරුගෙන් විශ්වවිද්‍යාලය වෙත අයකර ගත යුතු වුවත් රු.3,952,742 ක් වූ අත්තිකාරම් බැඳුම්කරය හා රු.10,540,647 ක් වූ කාර්යසාධන බැඳුම්කරය කල්ඉකුත් වීමට පෙර මුදල් කර ගැනීමට හැකියාව තිබියදී ඒ අනුව කටයුතු නොකිරීම නිසා විශ්වවිද්‍යාලයට රු.15,760,611 ක පාඩුවක් සිදු වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

34. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්ති ප්‍රකාර 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව සම්බන්ධව විශ්වවිද්‍යාලයේ නිරීක්ෂණ හා ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවේ දැක්වෙන කරුණු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය විසින් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග සහ පැහැදිලි කිරීම් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 තත්වාගණනය කළ මතය

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

අ) මෙහි සඳහන් රු. 867,706,599ක ක්ෂය කර අවසන් කර ඇති ස්ථාවර වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර ගිණුම් වලට ගැලපීම කළ යුතුය. මේ වන විට ඉඩම්වල සහ ගොඩනැගිලි වල ප්‍රත්‍යාගණන වටිනාකම් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති අතර අනෙකුත් සියළුම සංචලන ස්ථාවර වත්කම් 2022 භාණ්ඩ සමීක්ෂණ යට සමගාමීව අවශ්‍ය භෞතික සත්‍යාපනය කර ලේඛන සකස් කරමින් පවතී. එම ලේඛන සකස් කළ පසුව ඒවා ප්‍රත්‍යාගණනය කිරීමෙන් පසු 2023 මූල්‍ය ප්‍රකාශන සමග අදාළ ගැලපුම් සිදුකෙරෙමින් පවතී. නමුත් මෙම කාර්යය කඩිනමින් සිදු කර ගැනීම සඳහා කාර්යමණ්ඩල හිඟය දැඩිව බලපා ඇත.

ආ) මෙහි සඳහන් කර ඇති පොල්ගස් , පොල් ගෙඩි ලෙස වෙනස් විය යුතු අතර එය 2023 වර්ෂයේ දී විකිණුම් ආදායම් ලෙස ගිණුම්ගත වී ඇත. විධිමත්ව පරීක්ෂා කර බලා අදාළ තොගයන් 2023 වර්ෂයේ දී තොගයට ඇතුළත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ. කෙසේ වෙතත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍ර ලේඛ 02/2023 ට අනුව 2023 වර්ෂයේ සිට කටයුතු සිදු කෙරෙමින් පවතී.

ඇ) කළමනාකරණ මෘදුකාංග පද්ධතිය සඳහා මූලිකව රු 5,250,000 ක මුදලක් එම පද්ධතිය සංවර්ධනය කරන ආයතනයට ගෙවා ඇත. නමුත් මේ වන විට එහි තොග කළමනාකරණ මොඩලය, පොදු ලෙජර මොඩලය හා ස්වයං මූල්‍ය (self finance) මොඩියුල නිම කර ඇති අතර මේ වන විට විශ්වවිද්‍යාලයේ සියළුම මුදල් ගනුදෙනු තොග කළමනාකරණ කටයුතු පද්ධතිය හරහා පමණක් සිදු කරමින් පවතී. එසේ වුවත් එම නිමකරන ලද මොඩියුල 2022 දෙසැම්බර් 31 දින වන විටත් තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් පරීක්ෂා කර බාර නොගත් බැවින් එතෙක් එම ගෙවූ මුදල් අත්තිකාරම් ගිණුම යටතේ සටහන් කිරීම වඩාත් නිවැරදි වේ. එම මොඩියුල භාර ගැනීමෙන් පසුව එම මුදල් කෙරීගෙන යන වැඩ ගිණුමට මාරු කිරීමට කටයුතු කරනු ඇත.

ඈ) මහාචාර්ය ඒකක ගොඩනැගිලි, විශ්වවිද්‍යාලයට නිසිලෙස පවරා නොගත් අනුරාධපුර මහ රෝහල පිහිටි භූමියේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය සිසුන් ගේ සායනික පුහුණු කටයුත්ත සඳහා විශ්වවිද්‍යාලයට එම ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජයෙන් ලබා දුන් මුදලින් රු 1,025,396,475.00 වැයකර ඉදිකර ඇත. එසේ විශ්වවිද්‍යාල මුදලින් ඉදිකලද ඉඩමේ පැවරීමට කටයුතු නිසිලෙස සිදුවී නැති බැවින් මෙය විශ්වවිද්‍යාල දේපලක් ලෙස සලකා පිරිවැය ක්ෂය කිරීමේ හැකියාවක් නැත. මීට අමතරව මෙම ගොඩනැගිල්ලේ අවශ්‍ය කරන නඩත්තු කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශයේ අරමුදලින් සිදු කෙරේ. කෙසේ වුවත් මේ සම්බන්ධව තීරණයක් ගෙන 2023 වර්ෂයේ සිට ගිණුම්වලට ගැලපීමේ හැකියාව පිළිබඳ තීරණයන් ගනිමින් පවතී.

ඉ) අලි සංරක්ෂණ ඒකකය සඳහා පරිත්‍යාග කරන ලද උපකරණ 2023 ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමට ප්‍රථම එම වත්කම් හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර 2023 වර්ෂයේ සිට ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

ඊ) මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රදානයක් මත ඉදි කර තිබෙන මෙම Solid Waste Mgt ගොඩනැගිල්ල, ගොඩනැගිල්ලක් බැවින් ගොඩනැගිලි යටතේ වර්ග කර ඇත.එහි යන්ත්‍ර ප්‍රත්‍යාගණන අගය මත 2023 වර්ෂයේ සිට ගිණුම් ගැලපුම් කරනු ලැබේ.

උ) එදිනෙදා භාවිතා නොකරන භාණ්ඩ ලෙස මේවා හඳුනාගෙන ඇත. ඇතැම් භාණ්ඩ කල් ඉකුත් වීම ද සිදු වී ඇත. රසායනික ද්‍රව්‍ය සිසුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා යොදාගනු ලබන අතර මුද්‍රණ යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර කල් ඉකුත් වීම හේතුවෙන් ඒවායේ ටෝනර්, කාට්රිජ් හැකි පමණින් භාවිතයට ගැනීම සිදුවේ. කෙසේ වුවද මෙම භාණ්ඩ පිළිබඳ නැවත විමසීම් කිරීමේ දී ඇතැම් ඒවා නැවත උපයෝජනයට ගත හැකි භාණ්ඩ ලෙස හඳුනාගෙන ඇති අතර ඒවා මේ වන විට භාවිතයට ගනිමින් පවතී. ඒ අනුව මෙම භාණ්ඩ පිළිබඳ නැවත ඇගයීමකට ලක් කර උපයෝජනයට ගත හැකි භාණ්ඩ භාවිතයට ගැනීමත් භාවිතයට ගත නොහැකි භාණ්ඩ සඳහා අදාළ ගැලපීම් සිදු කෙරෙමින් පවතී.

ඌ) ශිෂ්‍ය නේවාසිකාගාර ගාස්තු ගෙවීම් සම්බන්ධයෙන් උපචිත ආදායම් මත ගිණුම්ගත කරන්නේ නම් එය කළ යුතු වන්නේ දළ වශයෙන් කරන ලද ගණනය කිරීම් තුළින් වන හෙයින් එහි 100%ක නිවැරදිභාවය පිළිබඳව ගැටළුවක් පවතී. ඒ අනුව මෙතෙක් ශිෂ්‍ය නේවාසිකාගාර ගාස්තු ගෙවීම මුදල් පදනම මත ගිණුම් ගත කර ඇත. එයට හේතුව උපචිත පදනම මත කළහැකි වන්නේ දළ ගණනය කිරීමක් බැවින් එම ගණනය කිරීම් ගිණුම්ගත කිරීමෙන් නැවත ගැලපීම් සිදු කිරීමට සිදු වන බැවිනි. කෙසේ වුවත් මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතින ශිෂ්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතිය හරහා නිවැරදි තොරතුරු ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින අතර එහි කටයුතු මේ වන විට නිමකර ඇත. 2023 වර්ෂයේ සිට එම පද්ධතිය හරහා ගන්නා නිවැරදි තොරතුරු මත ශිෂ්‍ය නේවාසිකාගාර ආදායම් නිසිලෙස උපචිත පදනම මත ගිණුම් තැබීමට අවශ්‍ය කටයුතු කරනු ඇත.

එ) ප්‍රවේශ වීමේ අත්තිකාරම් ගිණුම් ප්‍රකාශනයේ අංක 15 යටතේ උපලේඛණයේ සඳහන් පරිදි රු. 171,558,694 අගය නිවැරදි වේ. නමුත් විගණනය සඳහා ලබා දී ඇති උපලේඛන පොතේ එක් එක් ව්‍යාපෘතියට ආළ ප්‍රවේශ වීමේ අත්තිකාරම් සටහන් කිරීමේ දී වරදක් සිදුවී ඇත. මේ සඳහා පැහැදිලි කිරීම් විගණනයට ලබා දී ඇත.

1.3 විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

2. <u>වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව

(අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(2)**

ව්‍යාවහාරික විද්‍යා පීඨයේ පවත්වනු ලබන ICT උපාධිය හැදෑරීම සඳහා තෝරා ගැනීමේ තරග විභාග දිවයින පුරා විභාග මධ්‍යස්ථාන කිහිපයක විශ්වවිද්‍යාලයේ විභාග අංශයේ මෙහෙයවීම යටතේ සිදු කරනු ලබයි. ඒ සඳහා වෙනවෙනම අධීක්ෂණ කණ්ඩායම් පත්කර යවනු ලබන අතර ඒ වෙනුවෙන් වැයවන වියදම සඳහා ඔවුන් අතට මුදලින් ලබාදීම සිදුවේ. ඒ සඳහා වැයවන මුළු මුදල විභාග අංශයේ අංශ ප්‍රධානියාගේ නමට නිකුත් කරන අතර ඔහු විසින් එක් එක් කණ්ඩායම් අධීක්ෂණ නිළධාරීන් හට එම මුදල් ලබා දීම සිදු කරයි. ඒ අනුව මෙම රු.961,620 එක් අයකුගේ නමකට ලබා දුන්නද සත්‍ය වශයෙන් වියදම වෙනවෙනම කණ්ඩායම් ප්‍රධානියා විසින් සිදු කර ඔවුන් පියවීම ද සිදු කරයි.

රු. 202,000 ක මුදල 22 වන උපාධි ප්‍රදානෝත්සවයේ ජයමංගල ගාථා ගායන ශිල්පීන් , නැටුම් හා බෙර වාදන කණ්ඩායමට අදාළ මුළු වියදම වේ. එම කණ්ඩායම් ජාතික සංස්කෘතික මධ්‍යස්ථානයේ බැවින් එකවර මුදල් ගෙවා ඇත.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

i. **XIX වැනි පරිච්ඡේදයේ 5.2 ඡේදය**

ii. **XIX වැනි පරිච්ඡේදයේ 5.3 ඡේදය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතනික චක්‍රලේඛ අංක 09/2019**

මෙම නිවාසවලින් වැඩි ප්‍රමාණයක් විශ්වවිද්‍යාලයට පවරා දෙනු ලැබූ ඒවා වන අතර අනධ්‍යයන කාර්යමණ්ඩලයේ වැඩි සේවක සංඛ්‍යාවක් එම නිවාසවල නේවාසිකව සිටිති. එම නිවාස අවම පහසුකම් යටතේ පවත්නා බව දන්වමි. මෙයට අමතරව අළුතෙන් ඉදිකරන පීඨාධිපතිවරුන් හා පරිපාලන නිළධාරීන් හා අනෙකුත්

කාර්යමණ්ඩල සඳහා ඉදිරිපත් කරන ලද නිවාස ද අවම පහසුකම් වලින් යුක්ත වේ.රජයේ විගණන අංශය විසින් රජයේ ආයතන සංග්‍රහයේ දක්වා ඇති කුලී අය කරන ලෙස විගණන විමසුමේ දක්වා ඇති අතර එම කුලී නිවසේ සාධාරණ කුලියට වඩා සැලකිය යුතු අගයකින් ඉහළ නිසා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් මේ සම්බන්ධ විමසීමක් කරන ලද අතර ඊට පිළිතුරු ලෙස නිවාස කමිටුවේ අනුමැතිය මත නිශ්චිත කුලියක් අයකර ගන්නා ලෙස දන්වා ඇත. ඒ අනුව එම නිවාස වල ඇති අවම පහසුකම් සලකා බලා නිශ්චිත ගෙවල්කුලී අඩු කරනු ලැබේ. එම පැහැදිලි කිරීම සඳහන් ලද 2020.12.04 දිනැති UGC//PA//RUSL ලිපිය ඇමුණුමක් ලෙස දක්වා ඇත (ඇමුණුම 01). උපකුලපති තනතුර සඳහා පුවත්පත් දැන්වීම ප්‍රසිද්ධ කිරීමේ දී තනතුරට ලබා දෙන දෙන හිමිකම් යටතේ නිල නිවාසයක් ලබා දෙන ලෙස සඳහන් කර ඇත. ඒ අනුව විශ්වවිද්‍යාලය විසින් පසුගිය වසර ගණනාවක් තුළ සේවය කල උපකුලපතිවරුන් සඳහා අයකිරීමකින් තොරව නිල නිවාසය ලබා දී ඇත. උපකුලපති ගේ නිල නිවාසය , පදිංචිය සඳහා පමණක් නොව සමහර අවස්ථාවන් හි දී එහි රාජකාරී රැස්වීම්, විවිධ රාජකාරී කටයුතු සඳහා උපයෝගි කර ගැනීම සිදුවේ. රාජකාරී කටයුතු සඳහා පැමිණෙන විට අනිකුත් උපකුලපතිවරුන් නවාතැන් ගැනීම සඳහා ද භාවිතා වේ.

ඇ) **විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය xx පරිච්ඡේදයේ 3.1 ඡේදය**

විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම හා පිටවීම සටහන් කරනු නොලැබේ.මන්ද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවා කාලය පැය 08කට සීමා කළ නොහැකි වන අතර සතියේ දින 05 දී පැය අට ඉක්මවා මෙන්ම හා සති අන්ත දිනයන්හිදී ද රාජකාරී කටයුතු කිරීමට සිදුව ඇති බැවිනි. එනම් මෙයට අමතරව, අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් විශ්වවිද්‍යාල පරිභාහිර පර්යේෂණ, විවිධ උපදේශාත්මක කාර්යයන්, ප්‍රජා සේවා කටයුතු සඳහා ද සම්බන්ධ වේ. ඒ සියළු කටයුතු පැය අටක් තුළ කිසිසේත්ම නිම කළ නොහැක ඒවා වේ.

(ඈ) **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 6.2.2 ඡේදය**

අවශ්‍යතාවය පරිදි මෙම භාණ්ඩ අධිකාරිමය සීමාව යටතේ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 38 වන අතිරේක අත්පොතෙහි 2.14.1 ට අනුව එහි සඳහන් සෘජු මිලදී ගැනීමට හැකියාව තිබූ අතර වඩාත් විනිවිද භාවයකින් යුතුව තරඟකාරී මිල ගණන් ලබා ගැනීමේ අරමුණින් මෙම කාර්යය සිදු කිරීමට තීරණය කරන ලදී.

<u>වතුර බෝතල්</u>

21 වන උපාධි ප්‍රදානෝත්සවය සඳහා වතුර බෝතල් සැපයීම සඳහා 2022.03.21 වන දින ලද ඉල්ලීමට අනුව හා වෙළඳපල මිල සැදහුම් ක්‍රමය මගින් මිල කැඳවීම් සිදු කර ඇත. මෙහි දී පවතින තොග විමසා (Off the shelves) මිල කැඳවීම් කර ඇත. ඒ අනුව භාණ්ඩ ලබා දීමට තිබුණු කාලය සීමිත වූ බැවින් වෙළඳපලට ගොස් මිල කැඳවුම් ලබා ගෙන හදිසි ප්‍රසම්පාදනයක් ලෙස මෙම කාර්යය ඉටු කර ඇත. එම නිසා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ

සඳහන් පරිදි අවම දින ගණන් මිල කැඳවුම් සඳහා ලබා දීමට නොහැකි වී ඇති අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4(a) සඳහන් පරිදි කටයුතු කර ඇත.

<u>උපාධි සහතික බහාලුම්</u>

උපාධි සහතික බහාලුම් 3000ක් සඳහා 2022.01.25 වන දින සැපයුම්කරුවන් 07කු වෙත මිල කැඳවීම් යවා 2022.02.07 වන දින ලංසුපත් විවෘත කර ඇති අතර ලංසුකරුවන් දෙදෙනෙකු ඉතාම අධික මිලක් යටතේ ලංසු ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව එම මිල ඉතා අසාමාන්‍ය තත්ත්වයේ පැවැති බැවින් හා හා එවකට භාණ්ඩ ආනයනයට පනවා තිබූ නීතිරීති හේතුවෙන් සහ නිෂ්පාදනයට ඇති වූ බාධා හේතුවෙන් (විදුලිය ඇණ හිටීම්) මෙන්ම ප්‍රවාහන සඳහා තිබූ සීමාකිරීම් මත මෙම භාණ්ඩ කඩිනමින් ලබා ගැනීමේ අවශ්‍යතාවය නිසා උපකුලපතිතුමියගේ අනුමැතිය මත ෆැක්ස් මිල කැඳවුම් ලබා ගැනීමට කටයුතු කරන ලදී. භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැඩිකලක් දියයුතු බැවින් මෙම ෆැක්ස් මිල කැඳවුම් එදිනට ලබා ගැනීමට කටයුතු කරන ලදී. එහිදී සැපයුම්කරුවන් 2කු පමණක් මිල කැඳවුම් සඳහා ප්‍රතිචාර දක්වන ලද අතර අඩුම මිල ඉදිරිපත් කරන ලද Turbo Enterprises ආයතනය තුළ මිල සාධාරණ වූ බැවින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත විශ්වවිද්‍යාලයට වාසිදායක ලෙස මිලදී ගෙන ඇත.

<u>උපාධි සහතික මුද්‍රණය</u>

මේ සඳහා සෘජු සැදහුම් ක්‍රමය අනුගමනය කරමින් රාජ්‍ය ආයතනයක් වන උතුරුමැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය වෙත 2022.03.15 දිනැති 2022/OS/04 දරණ ඇණවුම නිකුත් කර ඇත. උතුරු මැද පළාත් පාසැල් සඳහා වාර විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණය හේතුවෙන් සියළුම කාර්ය මණ්ඩලය යොමු කර ඇති බැවින් මෙම සහතිකපත් මුද්‍රණය කළ නොහැකි බව 2022.03.15 දිනැති ලිපිය මගින් 2022.03.16 වන දින අපවෙත දැනුම් දී ඇත. ඒ අනුව මෙම උපාධි සහතිකපත්, උපාධි ප්‍රදානෝත්සවයේ දී ලබා දීමට නියමිත බැවින් කාර්ය නිමකිරීමේ හැකියාව ඇති ලංසුකරුවන්ගෙන් තරගකාරී ලංසු ලබා ගැනීමට සිදු විය. පැවති බාහිර සාධක (ප්‍රවාහන,අමුද්‍රව්‍ය හිඟවීම...) මෙම කාර්ය සඳහා කාලය ලබා දිය යුතු බැවින් මෙම ලංසු කැඳවීම් දින 03කට සීමා කරන ලද අතර ඉදිරිපත් කරන ලද මිල ගණන් සාධාරණ වූයෙන් අඩුම ලංසුව ලබා දී ඇති ලංසුකරු වෙත ප්‍රසම්පාදනය පිරිනමන ලදී.

<u>උපාධි ප්‍රදානෝත්සව පොත් මුද්‍රණය, Garland මිලදී ගැනීම හා වේදිකා පසුබිම් තිරය</u>

පැවති සීමා කිරීම් මත (ප්‍රවාහන,අමුද්‍රව්‍ය හිඟය) මිල සැදහුම් ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කල නොහැකි වූ අතරම උපාධි ප්‍රදානෝත්සවය දිනම මෙම පොත් අත්‍යාවශ්‍ය වන බැවින් සෘජු කැඳවුම් ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලදී. මෙම කාර්ය සඳහා කාලය ලබා දිය යුතු බැවින් හා වෙළඳපලේ අමුද්‍රව්‍ය සුලභතාවය පරීක්ෂා කර මෙම ලංසු කැඳවීම් දින 02කට හා දිනකට සීමා කරන ලද අතර ඉදිරිපත් කරන ලද මිල ගණන් සාධාරණ වූයෙන් අඩුම ලංසුව ලබා දී ඇති ලංසුකරු වෙත තාක්ෂණික ඇගයීම නිර්දේශය හා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත මෙම කාර්යයන් අදාළ සැපයුම්කරුවන් වෙත පිරිනමන ලදී.

ඉ) **2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛය හා බැඳුණු මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය**

මෙම ප්‍රමාදයට හේතුව වන්නේ මූල්‍ය අංශයේ පවතින මූල්‍ය නිළධාරීන්ගේ හිඟයයි. තනතුරු 4ක් සහිතව පවත්වාගෙන යා යුතු මූල්‍ය අංශය, මෙම ගිණුම් ප්‍රකාශන සකස් කරන අවස්ථාව වන විට එක් නියෝජ්‍ය මූල්‍යාධිකාරිවරයෙකු සහ පැය කිහිපයක් වැඩ ආවරණය කිරීම සිදු කරන සහකාර මූල්‍යාධිකාරිවරයෙකුගෙන් පමණක් සමන්විත විය.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3. <u>වෙනත් කරුණු</u>

(අ) 2020 වසරේ සිට වසර 03ක් කොවිඩ් වසංගතය හේතුවෙන් සීමා පැනවීම හේතුකොටගෙන විදේශීය මෙන්ම දේශීය සිසුන්ට ඇති පර්යේෂණ වල නියැලීම ගැටලුවක් විය. එසේ වුවත් 2023 වර්ෂයේ දේශීය මෙන්ම විදේශීය සිසුන්ගේ සහභාගිත්වයෙන් වනජීවී සම්බන්ධ පර්යේෂණ ආරම්භ කර තිබුණි. මෙම පරිශ්‍රය ඉදිරියේ දී පැවැත්වීම අදාල අධ්‍යයන කටයුතු පිළිබඳ කාලසටහනක් පියයේ ජීවවිද්‍යා අධ්‍යයනාංශය විසින් එවා ඇත. එය විගණනයට ඉදිරිපත් කල හැක.

(ආ) මෙම ව්‍යාපෘතිය 2019 අප්‍රේල් 15 දින වන විට අවසන් කළ යුතුව තිබුණ ද විගණිත දිනය වන විට ද ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වී ඇති අතර දැනට 72%ක පමණ වැඩ කොටසක් සිදු කර ඇත.

මෙම ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරුගේ පැවති අර්බුද නිසා නියමිත දිනට අවසන් කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් ද්‍රවශීලතා හානි ලෙස රු.4,242,935.50ක මුදල ක් ද ගිවිසුමට ප්‍රකාරව අයකරගෙන ඇත. පසුකාලීනව පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හා භාණ්ඩවල මිල ඉහළ යාම හමුවේ ඉතිරි වැඩකටයුතු කරගෙන යාමට කොන්ත්‍රාත්කරු හට නොහැකි බව දන්වා ඇති අතර රජයේ චක්‍ර ලේඛ යට අනුකූලව අනෝන්‍ය අවසන් කිරීමක් (Mutual Termination) සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී.

මෙම ව්‍යාපෘතියට අනුව රු. 2,148,967 ක් වටිනා කාර්ය සාධන ඇපකරය කල් ඉකුත් වීම සම්බන්ධව ප්‍රගති සමාලෝචන කමිටු රැස්වීම් වලදී දැනුවත් කර තිබුණ ද එය දීර්ඝ කර ගැනීමට කොන්ත්‍රාත්කරු අසමත් වී ඇත. ඇපකරය කල් ඉකුත් වීමෙන් අනතුරුව ද

කොන්ත්‍රාත්කරු මෙම කාර්ය නිමකිරීම සඳහා වැඩකටයුතු කල බැවින් ඇපකරය ද දීර්ඝ කර දෙන ලෙස 2020.05.26, 2020.12.11, 2021.02.27 හා 2021.07.29 දිනැති ලිපි මගින් හා 2020.05.27 හා 2020.12.15 යන දිනයන් හි පැවැති ප්‍රගති සමාලෝචන කමිටු රැස්වීමේ දී ඉල්ලීම් කර ඇත.

නමුත් 2020 වර්ෂය වන විටත් කල් දිගුකරන ලද ඇපකරය ලබා දීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වී ඇති අතර කොන්ත්‍රාත් වැඩ පමණක් මන්දගාමීව සිදු කර ඇත. 2022.03.16 දිනැති ලිපිය මගින් විශ්වවිද්‍යාලයට ලබා දී ඇති කාර්යය සඳහා ඇපකරයේ පිටපතක් ද ලබා ගෙන ඇති අතර මෙවන විටත් ඇපකරය කල් දිගුවක් ලබා දී නොමැත.

ව්‍යාපෘතියට අදාළව 72% වැඩ පමණක් නිම කර ඇති බැවින් හා රජයේ චක්‍ර ලේඛ අනුව භාණ්ඩ මිල ඉහල යාම හේතුවෙන් ඉතිරි වැඩ කරගෙන යාමට නොහැකියාව මත අනෝන්‍ය අවසන් කිරීමකට කටයුතු කරන බැවින් කාර්ය සාධන ඇපකරය දිගුකර ගැනීමට අවශ්‍යතාවයක් මේ වන විට නොමැත.

මෙම ව්‍යාපෘතියට අදාළව අත්තිකාරම් ඇපකරද 2019.07.30 වන දිනෙන් අවසන් වී ඇති අතර මේ සඳහා ද ප්‍රගති සමාලෝචන කමිටු රැස්වීම් වලදී හා 2019.08.14,2020.05.26,2020.12.10,2021.02.17 දිනැති ලිපි මගින් කොන්ත්‍රාත් කරු වෙත දන්වා ඇත. නමුත් මේ වන විටත් අත්තිකාරම් ඇපකරය දීර්ඝ කර ගැනීමට කොන්ත්‍රාත්කරුට නොහැකි වී ඇත.

කෙසේ වෙතත් දැනට වැඩ නිමකර ඇති 72% වැඩවල වටිනාකම රු. 37,946,442.25ක් වන අතර රු.2,148,967.78 රැදවුම් මුදල් ද රු. 4,297,935.55 ද්‍රවශීල භානි ද රු. 8,595,871.10 වන මුළු අත්තිකාරම් මුදලද අයකර ගත් පසු ද කොන්ත්‍රාත්කරු වෙත තවත් රු. 92,090.38 ගෙවීමට ඇති බැවින් මෙම අත්තිකාරම් ඇපකරය කාර්යසාධන ඇපකරය දීර්ඝකර නොගැනීමෙන් විශ්වවිද්‍යාලයට මූල්‍යමය වශයෙන් අගතියක් වී නොමැත.

කෙසේ වෙතත් ඇපකර නිසියාකාරව මුදල් කර නොගැනීමෙන් පරිපාලනය වශයෙන් අඩුපාඩුවක් සිදු වී ඇති බව පිළිගන්නා අතර මින් ඉදිරියට එම අඩුපාඩුව සකසන බවට එකඟ වෙමි.

(ඇ) මෙම මිලදී ගැනීම් අදාළ වර්ෂ වලදී සිදු වී ඇත. යම් හේතූන් මත ඒවාට අදාළ වවුචර පත් ගෙවීම් සඳහා ගිණුම් අංශය වෙතට ගෙවීම් සඳහා ලැබී නොමැත. එසේම එම කාලය තුල සැපයුම්කරු තම ලැබිය යුතු මුදල් සම්බන්ධ කිසිදු විමසීමක් හෝ සිදු කර නොමැත. එසේ විමසීම් සිදු කර තිබුණි නම් එම කාල වලදී එම ගෙවීම් සිදු කිරීමේ හැකියාව තිබුණි. එබැවින් එය සැපයුම්කරුගේද නොසැලකිල්ලක් තිබේ. එබැවින් මෙම විනිමය අනුපාත මත ගෙවීමට සිදු වී ඇති වැඩිපුර මුදල ගෙවීමේ හැකියාවක් නැත. මේ පිළිබඳව සැපයුම්කරුට ලිඛිතව දැනුම්දීමක් සිදුකර තිබෙන අතර ඔහුගේ ප්‍රතිචාරය අපේක්ෂාවන් සිටී.

(ඈ) මෙම මෘදුකාංග පද්ධතිය විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවය පිරිදි විශ්වවිද්‍යාලයට සරිලන ලෙස සංවර්ධනය කරන ලද පද්ධතියකි. මෙය මොඩියුල 9ක් සහිතව ක්‍රියාත්මක වන එකක් වන අතර මේ වන විට පද්ධති 03ක් වන මූල්‍ය පද්ධති, තොග පද්ධති හා ස්වයං මූල්‍ය මොඩියුල

ක්‍රියාත්මක කරමින් පවතී.එසේම අනිකුත් මොඩියුල වන මානව සම්පත්, වැටුප් සැකසීම් , ප්‍රාග්ධන වැඩ, ප්‍රසම්පාදන සහ ශිෂ්‍ය තොරතුරු කළමනාකරණ යන මොඩියුල 50% කට වඩා ඉහල තත්ත්වයක සංවර්ධන කටයුතු සිදු කර ඇත. එබැවින් භාර දීමේ ප්‍රමාදයක් සිදු වුවද සමස්ථයක් ලෙස මෙම පද්ධතියේ සංවර්ධන කිරීමේ කටයුතු අපගේ අවශ්‍යතාවය පරිදි සිදුකෙරෙමින් පවතී.

(ඉ) මෙම කොන්ත්‍රාත්තුව 2018.08.27 දිනෙන් අවසන් කර ඇත (Termination by the employer). එදිනට සිදු කර ඇති මුළු කාර්යයන්හි වටිනාකම රු.10,620,619.30ක් වන අතර විශ්වවිද්‍යාලය මගින් රු.15,859,976.50ක් ගෙවා ඇත. ඒ අනුව රු.5,239,357.22ක මුදලක් කොන්ත්‍රාත්කරුගෙන් විශ්වවිද්‍යාලය වෙත අය විය යුතුය.

කොන්ත්‍රාත් කොන්දේසි අනුව කොන්ත්‍රාත්තුවක් අවසන්කිරීමේ දී කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ කොටස්හි වටිනාකමින් 25% ක අගයක් එනම් රු. රු. 10,520,654.18 ක් කොන්ත්‍රාත්කරු විසින් විශ්වවිද්‍යාලය වෙත ගෙවිය යුතු වේ. ඒ අනුව කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 15,760,011.10ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත ගෙවිය යුතු වේ. පසුව කොන්ත්‍රාත්කරු විසින් තම ලිපිනය හා ව්‍යාපාර නාමය වෙනස් කර ඇති අතර විශ්වවිද්‍යාලය විසින් මෙම තොරතුරු සොයාගැනීමෙන් අනතුරුව කොන්ත්‍රාත්කරුට එරෙහිව විනිශ්චය පටිපාටිය (Adjudication Procedure) මේ වන විට ආරම්භ කර ඇත.

මෙම කොන්ත්‍රාත්කරු විශ්වවිද්‍යාලයේ අනෙකුත් ව්‍යාපෘති සාර්ථකව නිමකර තිබූ බැවින් හා කොන්ත්‍රාත්කරු විසින් ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී හා ලිඛිතව ඉල්ලීම කර ඇති පරිදි කොන්ත්‍රාත් කාල සීමාව තුළ එවකට පරිපාලනය අවසන් කිරීමට පෙළඹීමට වඩා මෙම කොන්ත්‍රාත්කරු ලවා මෙම ව්‍යාපෘතියෙහි වැඩ අවසන් කර ගැනීමට උත්සුක වී ඇත. කෙසේ වෙතත් ඇපකර මුදල් කර නොගැනීම හේතුවෙන් ඇති වූ පරිපාලනමය අතපසු වීම පිළිගන්නා අතර වහාම ක්‍රියාත්මක කර ඇති විනිශ්චය පටිපාටිය හරහා විශ්වවිද්‍යාලයට අයවිය යුතු රු. 15,760,611 ක මුදල අයකර ගැනීමට කටයුතු කරන අතර ඉදිරියේ දී මෙවැනි අතපසු වීම් වලක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගැනීමට එකඟ වෙමි.

මහාචාර්ය ජී.ඒ.එස්. ගිනිගද්දර
උපකුලපති/ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනයකි